# සමාජ විද්‍යාව

# 3

## මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය - 2012
දෙවන මුද්‍රණය - 2013
තෙවන මුද්‍රණය - 2014
සිව්වන මුද්‍රණය - 2015
පස්වන මුද්‍රණය - 2016
සයවන මුද්‍රණය - 2017

සියලු හිමිකම් ඇවිරිණි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
කොළඹ 10, ජයන්තවීරසේකර මාවතේ ,අංක, 27/18, දරණ ස්ථානයේ පිහිටි,
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් (පුද්.) සමාගම මුද්‍රණාලයේ
මුද්‍රණය කර ප්‍රකාශයට පත්කරන ලදි.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

තිළිණය ලෙසින් රජයෙන් මේ පොත ලදිමි
කියවා එයින් නැණ ගුණ එළි කර ගනිමි
මගෙ රට වෙනුවෙන් ම දෑ සම්පත් රකිමි
මේ පොත එන වසරෙ වෙන කෙනකුට පුදමි

**அரசின் வெகுமதியாய் நூலிதனைப் பெற்றேன்**
**அறிவு பெருகிடவே நூலிதனைக் கற்பேன்**
**தாய் நாட்டின் வளமெனவும் நூலிதனைக் காப்பேன்**
**பல மாணவரும் பயின்றிடவே நூலிதையே அளிப்பேன்**

From the government, I received this as a gift
I'll read it, light up my knowledge and practise thrift
On my country's own behalf, I'll protect the national resources
And offer this book to another one as a fresh garland of roses



## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මගින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙන යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මගින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය.

එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙන නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.

**අකිල විරාජ් කාරියවසම**

අධ්‍යාපන අමාත්‍ය

# පෙරවදන

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම වාගේ විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙන" නැමැති විද්‍යායතනය බිහි වී ඇත. ගිහි පැවිදි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙන මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙන ඉටු කරන කාර්යභාරය සුළු කොට තැකිය නොහැකි ය.

සම්භාවනීය අධ්‍යාපන සම්ප්‍රදායයන් රැක ගනිමින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ මෙන් ම ගිහි සිසුන්ගේත් අවශ්‍යතා සැලකිල්ලට ගෙන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිරිවෙන් සඳහා මෙම පාඨග්‍රන්ථය සම්පාදනය කර ඇත. එම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, ලේඛක හා සංස්කාරක මණ්ඩල සාමාජිකයන් සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මාගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

**අයි.එම්.කේ.බී. ඉලංගසිංහ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2017.05.02

**නියාමනය හා අධීක්ෂණය**

| | |
|---|---|
| අයි.එම්.කේ.බී. ඉලංගසිංහ මයා | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**මෙහෙයවීම**

| | |
|---|---|
| පූජ්‍ය නාබිරිත්තන්කඩවර<br>ඤාණරතන හිමි | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),<br>අධ්‍යාපන අමාත්‍යාංශය, |
| ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි මිය | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන),<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි | පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරී,<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ඩී.එම්.ජේ. පුෂ්ප කුමාර මයා | සහකාර කොමසාරිස්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |
| එච්.ටී.සී.ඩී.පී. සිරිවර්ධන මිය | සහකාර කොමසාරිස්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**උපදේශක මණ්ඩලය**

| | |
|---|---|
| මහාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා | මහාචාර්ය,<br>සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය,<br>සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය ඒ.ඒ.ජයන්ත ජයසිරි | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය,<br>සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |

**ලේඛක මණ්ඩලය**

| | |
|---|---|
| 1. පී.ජී. ජයන්ත ආනන්ද මයා<br>(සභාපති) | පරිවේණාචාර්ය,<br>කෑ/ ශ්‍රී විද්‍යාමංගල මහ පිරිවෙන,<br>මංගලගම, මොළගොඩ. |
| 2. පූජ්‍ය වටගෙදර විමලසාර හිමි | ගුරු උපදේශක,<br>බප/ශ්‍රී පඤ්ඤානන්ද මහ පිරිවෙන,<br>මහරගම. |

3. පූජ්‍ය ඇත්ගාලේ නන්දසිරි හිමි - නියෝජ්‍ය පරිවේණාධිපති,
මහ/සද්ධාතිස්ස විද්‍යා ප්‍රදීප පිරිවෙන,
කරමඩ, ගෙලිඔය.

4. ආර්.එම්. ජයසිංහ බණ්ඩා මයා - ගුරු උපදේශක, මො/ශ්‍රී විද්‍යානන්ද පිරිවෙන,
ගල්කුඹුර, බිබිල.

**සංස්කරණය**

පූජ්‍ය පිටිගල සෝණුත්තර හිමි - ගුරු උපදේශක (විශ්‍රාමික),
පිරිවෙන් ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය.

**සෝදුපත් කියවීම**

පූජ්‍ය පූජාගොඩ දේවරක්ඛිත හිමි - පරිවේණාචාර්ය,
මහ/විදුමිණ මූලික පිරිවෙන,
වැලිගල්ල, පූජාපිටිය.

**පරිගණක තාක්ෂණය**

පූජ්‍ය කුඩාපීලිගම නන්ද හිමි - පරිවේණාධිපති,
මහ/සද්ධාතිස්ස විද්‍යා ප්‍රදීප පිරිවෙන,
කරමඩ, ගෙලිඔය.

රේණු ප්‍රියංගිකා ජයවර්ධන - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ජේ.එච්. මනෝරිකා ප්‍රියංගනී අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**පිටකවර නිර්මාණය**

ආර්.එම්. මාධව ඉසුරු හෙළරුවන් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. සමාජ විද්‍යාව හැඳින්වීම | - | 01 |
| 2. සමාජ පරිණාමය | - | 10 |
| 3. සංස්කෘතිය | - | 27 |
| 4. පුද්ගලයා හා සමාජය | - | 41 |
| 5. සමාජ පාලනය | - | 51 |
| 6. සමාජ ප්‍රශ්න | - | 67 |
| 7. සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් | - | 81 |

# 01 සමාජ විද්‍යාව හැඳින්වීම



## 1.1 සමාජ විද්‍යාවේ බිහිවීම හා විෂය වර්ධනය වූ ආකාරය

සමාජ විද්‍යාව (Sociology) නැමති විෂය බිහිවූයේ බටහිර සමාජ පදනම් කරගෙන ය. දහනව වන සියවසේ ආරම්භ වූ මෙම විෂයට තවමත් ඇත්තේ සියවස් දෙකකට නොවැඩි කෙටි ඉතිහාසයකි. නමුත් අද වනවිට සමාජීය විද්‍යාවන් අතර ජනප්‍රියතම විෂය බවට මෙම විෂය පත් ව තිබේ. ඊට හේතුව මානව සමාජය සම්බන්ධ ව මෙම විෂයයෙන් පුළුල්ව හදාරන බැවිණි.

ඔගස්ට් කොම්ට් (Auguste Comte 1798-1857) නම් ප්‍රංශ ජාතික දාර්ශනිකයා සමාජ විද්‍යාව (Sociology) යන පදය 1839 දී The courses of positive philosophy යන කෘතියෙහි දී ප්‍රථම වරට යොදා ගනු ලැබීය. ඊට පෙර කොම්ට් විසින් මෙම විෂය සමාජ භෞතික විද්‍යාව (Social physics) නමින් හඳුන්වා ඇත. Sociology යන ඉංග්‍රීසි වචනය සැකසී ඇත්තේ ලතින් හා ග්‍රීක වචන දෙකක ආශ්‍රයෙනි.

| | | |
|---|---|---|
| Socius + | Logos | = Sociology |
| සමාජය + | විද්‍යාව | = සමාජ විද්‍යාව |

Sociology යන ඉංග්‍රීසි වචනයෙහි අර්ථය වන්නේ "සමාජය පිළිබඳ විද්‍යාව" යන්න යි.

මෙහි දී සමාජය පිළිබඳ ව සිදුකරන විද්‍යාත්මක අධ්‍යයනය සමාජ විද්‍යාව ලෙස හැඳින්විය හැකි ය. විද්‍යාත්මක අධ්‍යයන ක්‍රමවේද යොදාගනිමින් සමාජ විද්‍යාඥයින් විසින් සමාජය පිළිබඳ ව පුළුල් ව අධ්‍යයනය කරනු ලැබේ. එනම් විද්‍යාඥයා විසින් තම අධ්‍යයනය සඳහා යොදා ගන්නා නිරීක්ෂණ, සම්පරීක්ෂණ, පර්යේෂණ වැනි ක්‍රමවේද සමාජ විද්‍යාඥයා විසින් ද අනුගමනය කරනු ලබයි.

සමාජ විද්‍යාව තුළින් කුමන සමාජ අධ්‍යයනය කරන්නේ ද යන්න තේරුම් ගැනීම වැදගත් වේ. සමාජ විද්‍යාව ආරම්භ වූයේ නාගරික සමාජ හෙවත්

සංකීර්ණ සමාජ අධ්‍යයනය කිරීමේ විෂයයක් ලෙස ය. නාගරික සමාජයේ උද්ගත වූ සමාජ ප්‍රශ්න සමාජ විද්‍යාවෙන් අධ්‍යයනය කරන ලදි. අද්‍යතන යුගයේ දී සමාජ විද්‍යාව සමාජයේ සෑම අස්සක් මුල්ලක් නෑරම අධ්‍යයනය කිරීමට තරම් සුවිසල් හැකියාවක් සහිත විෂයයක් බවට පුළුල් වී ඇත.

සමාජ විද්‍යාව නැමති විෂයය බිහිවීම කෙරෙහි බලපෑම් කළ බටහිර සමාජ පසුබිම ද මෙහි දී විමසා බැලීම උචිත ය. 19 වන සියවසේ මැද භාගය පමණ වන විට බටහිර සමාජය තුළ පැවති සමාජ, ආර්ථික, ආගමික සහ දේශපාලනික හේතූන් මෙම විෂයය බිහිවීම කෙරෙහි බලපෑවේ ය. ඒ අනුව සමාජ විද්‍යාවේ බිහිවීම හා විකාශනය සඳහා බලපෑ ඓතිහාසික හේතූන් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

* ආගමික පුනරුදය
* කාර්මික විප්ලවය
* දේශපාලන ප්‍රතිසංස්කරණ

කාර්මීකරණය මගින් එතෙක් පැවති බටහිර සමාජය දෙදරා ගියේ ය. ගෘහස්ථ නිෂ්පාදන ක්‍රමය හා භාණ්ඩ හුවමාරු අර්ථක්‍රමය බිඳ වැටුණු අතර බටහිර මිනිසා කර්මාන්ත ශාලාවල වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත්විය. එය පවුල් සංස්ථාවේ සිට මුළු මහත් සමාජ ක්‍රමය වෙනසකට ලක් කිරීමට හේතු විය.

16වන සියවස වන විට එතෙක් පැවති සාම්ප්‍රදයික කිතුනු ආගම පරිවර්තනයකට බඳුන් විය. **මාර්ටින් ලූතර්** හා **ජෝන් කැල්වින්** යන පූජකවරුන් විසින් කිතුනු ආගමට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දෙනු ලැබී ය. එය බටහිර සමාජයේ ආගමික ප්‍රතිසංස්කරණයකට හේතු විය. ප්‍රොතෙස්තන්ත්‍ර නිකාය නමින් ප්‍රකට වූ නව ආගමික කණ්ඩායම හඳුන්වා දුන් ආගමික ආචාර ධර්ම, යුරෝපා සමාජයේ ධනවාදී සමාජ පසුබිමක් නිර්මාණය කළේ ය. එමගින් බටහිර සමාජය මුදල් පදනම් කරගත් සමාජ රටාවකට යොමු වූ අතර සාම්ප්‍රදායික සමාජ පර්යාය බිඳ වැටී නව සමාජයක් බිහි විය. එම සමාජය තුළ සමාජ ප්‍රශ්න ද උද්ගත විය.

තව ද ප්‍රංශ විප්ලවය මගින් දේශපාලන විපර්යාසයක් බටහිර සමාජයේ ඇති වූ අතර එමගින් සාම්ප්‍රදයික සමාජයෙන් මිදී නිදහස් විවෘත සමාජයක් සඳහා බටහිර සමාජය මෙහෙයවන ලදි. මෙකී සමාජ ආර්ථික හේතූන් බටහිර රටවල සමාජ විද්‍යාව බිහිවීමට හේතු විය.

සමාජ විද්‍යාව හා එය බිහි වූ සමාජ පසුබිම තේරුම් ගැනීමෙන් අනතුරු ව එය වර්ධනය වූ ආකාරය ද විමසා බැලීම වැදගත් වේ. සමාජ විද්‍යාව බිහිවන තෙක් ම සමාජය පිළිබඳ ව අධ්‍යයනය ආගමික මුහුණුවරක් ගත්තේ ය. එය දර්ශනය නැමැති පුළුල් විෂය ක්ෂේත්‍රය තුළින් අධ්‍යයනය කළේ ය. 19 වන සියවසේ මුල්භාගය පමණ වන විට විවිධ බුද්ධිමතුන්ගේ වාද විවාද නිසා ස්වභාවික දර්ශනයෙන් සමාජ අධ්‍යයනය මුදවාගෙන සමාජයේ ඒ ඒ ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම සඳහා වෙන ම විෂය ක්ෂේත්‍ර බිහිකරන ලදි.

19 වන සියවසේ මැද භාගය පමණ වන විට මුල් වරට සමාජ විද්‍යාව නැමති පදය හඳුන්වා දෙනු ලැබුවේ ප්‍රංශ ජාතික **ඔගස්ට් කොම්ට්** (Auguste Comte) නැමති සමාජ දාර්ශනිකයා විසිනි. විෂය බිහිකිරීමේ මූලිකයා වූ **ඔගස්ට් කොම්ට්** සමාජ විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලැබේ. ඔහු සමාජ විද්‍යාව තුළින් සමාජ පැවැත්ම හා සමාජ වෙනස්වීම අධ්‍යයනය කළ යුතු බව පැවසුවේ ය. පැරණි සමාජ ක්‍රමය බිඳ වැටී නව සමාජ ක්‍රමයක් බිහි වන බව පැවසූ කොම්ට් එම සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කළ යුතු බව ද පැවසුවේ ය. සමාජය දෙවියන්ගේ නිර්මාණයක් නොව මිනිසාගේ ම නිර්මාණයක් බව පෙන්වා දුන් කොම්ට් එසේ නිර්මාණය වූ සමාජය අධ්‍යයනය කිරීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් ගොඩනැගිය යුතු බව ද පෙන්වා දෙන ලදී.

**ඔගස්ට් කොම්ට්** පසුව සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා ක්‍රියා කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් කීප දෙනෙක් සිටිති. ඒ අතර **හර්බට් ස්පෙන්සර්** (Herbert Spencer) **එමිල් ඩුර්ක්හයිම්** (Emile Durkhiem) **මැක්ස් වේබර්** (Max Weber) යන සමාජ විද්‍යාඥයන් වැදගත් වේ.

**හර්බට් ස්පෙන්සර්** විසින් සමාජය ඓන්ද්‍රීය පද්ධතියකට උපමා කළේ ය. ජීවියාගේ පැවැත්ම සඳහා ඉන්ද්‍රිය පද්ධතීන්ගේ ක්‍රියාකාරිත්වය වැදගත් වන්නේ යම් සේ ද එසේ ම සමාජයේ පැවැත්ම සඳහා ද පවුල, ආර්ථිකය, විවාහය, ආගම, දේශපාලනය ආදී සියලු ම සංස්ථාවන්ගේ සාමූහික ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍ය බව එමගින් පැහැදිලි කර ඇත.

**එමිල් ඩුර්ක්හයිම්** විසින් ද සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා සුවිශාල සේවයක් සිදුකරන ලදි. **ඩුර්ක්හයිම්** ට පෙර සිටි කිසිම සමාජ විද්‍යාඥයකු විසින් සමාජය අධ්‍යයනය කිරීමට අධ්‍යයන ක්‍රමවේදයක් හඳුන්වා දී නැත. **ඩුර්ක්හයිම්** විසින් සමාජ විද්‍යාව හැදෑරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දුන්නේ ය. එය 'සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන් (Rules of Sociological Method)

නැමැති කෘතියෙන් අනාවරණය කළේ ය. පැරණි සමාජය හා නූතන සමාජය, ශ්‍රම විභජනය පදනම් ව ගොඩනැගී ඇති ආකාරය ද ඔහු විග්‍රහ කළේ ය. ඒ අනුව පැරණි සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාව මත පදනම් වූ සමාජයක් ලෙස ද නූතන සමාජය ඓන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජයක් ලෙස ද හඳුන්වා දී ඇත. සමාජ විද්‍යාවේ අරමුණු ගැන සඳහන් කළ **ඩුර්ක්හයිම්**, සමාජ ප්‍රශ්න අධ්‍යයනය කිරීම ද සමාජ විද්‍යාවේ අරමුණක් ලෙස පෙන්වා දුන් අතර සිය දිවි නසාගැනීම ද (Suicide) සමාජ ප්‍රශ්නයක් ලෙස අධ්‍යයනය කිරීමට උත්සාහ දැරී ය. ආගම සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීමට පෙළඹුණ **ඩුර්ක්හයිම්**, ඕස්ට්‍රේලියාවේ මුල් පදිංචිකරුවන්ගේ ආගමික ජීවිතය අධ්‍යයනය කළේ ය. එය **ආගමික ජීවිතයේ මූලික හරය** යන කෘති යෙන් පැහැදිලි කර ඇත. මෙම අධ්‍යයනය මගින් සමාජයේ ඒකාබද්ධතාව ඇති කිරීමට ආගම යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාකරන ආකාරය පැහැදිලි කර ඇත. **මැක්ස් වේබර්** ද සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා ක්‍රියා කළ වැදගත් සමාජ විද්‍යාඥයකු ලෙස සැලකිය හැකි ය. ඔහු සමාජ විද්‍යාවේ දී සමාජ ක්‍රියා (Social Action) අධ්‍යයනය කළ යුතු බව පැවසී ය. තව ද රාජ්‍යය, ආගම, පංතිය, තිල බල ක්‍රමය වැනි සංකල්ප සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් අධ්‍යයනය කිරීමට උත්සාහ දැරී ය.

මෙතෙක් සාකච්ඡා කරන ලද සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින්ගේ ඉගැන්වීම් පසු කාලීන සමාජ විද්‍යාඥයින් කෙරෙහි ද බලපෑම් කර ඇත.

## 1.2. සමාජ විද්‍යාවේ අරමුණු හා ප්‍රයෝජන

සමාජ විද්‍යාවේ ප්‍රධාන අරමුණ සමාජය අධ්‍යයනය කිරීමයි. සමාජයක් යනු කුමක්දැයි සමාජ විද්‍යාත්මක ව විමසා බැලිය යුතු වේ. පොදු අරමුණකින් හා අන්‍යොන්‍ය සමාජ සම්බන්ධතාවලින් යුත් මිනිස් සමූහය සමාජයක් ලෙස අර්ථකථනය කළ හැකි ය. අන්‍යොන්‍ය සමාජ සබඳතා මගින් සමාජ සංස්ථා හා සමාජ සංවිධාන ගොඩනැගේ. ඒ තුළින් සමාජීය වශයෙන් සංස්කෘතිය ක් නිර්මාණය වේ. මෙසේ සමාජ සබඳතා පදනම් ව ගොඩනැගෙන **සමාජ සංස්ථා, සමාජ සංවිධාන** හා **සංස්කෘතිය** සමාජ විද්‍යාව මගින් අධ්‍යයනය කරනු ලබයි.

සමාජ විද්‍යාව ප්‍රධාන තේමාවන් දෙකක් ඔස්සේ සමාජය අධ්‍යයනය කරනු ලබයි. එනම්

- සමාජ ස්ථිතිකත්වය (පැවැත්ම) (Social Statics)
- සමාජ ගතිකත්වය (වෙනස්වීම) (Social Dynamics)

සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රය යටතේ **සමාජ සමූහ, තත්ත්වය** හා **කාර්යභාරය, සමාජානුයෝජනය, සමාජ සංස්ථා, සංස්කෘතිය** ආදී සංකල්ප අධ්‍යයනය කරනු ලබයි.

සමාජ වෙනස්වීම යටතේ **නාගරීකරණය, බටහිරකරණය, කාර්මීකරණය, ගෝලීයකරණය** ආදී සංකල්ප අධ්‍යයනය කරනු ලැබේ. ඒ අනුව සමාජ විද්‍යාවේ සංකල්පීය විෂය ක්ෂේත්‍රය "යථානුභූත විද්‍යාවක්" (Positive Science) ලෙස ගොඩනැගී ඇත.

සමාජ ප්‍රශ්න (Social Problems) අධ්‍යයනය කිරීම ද සමාජ විද්‍යාවේ පරමාර්ථයකි. සමාජයක් විසංවිධානයට හේතු වන තත්ත්වයන් සමාජ ප්‍රශ්න ලෙස හැඳින්වේ. මේ යටතේ සිය දිවි හානි කරගැනීම, ගණිකා වෘත්තිය, අපරාධ, අපචාර, දුගී බව, මදිරාබාධය වැනි ප්‍රශ්න අධ්‍යයනය කරයි. ඒවා අධ්‍යයනය කිරීම තුළින් එම ගැටලු සඳහා බලපාන හේතු සාධක සහ ඒවා නිරාකරණය කරගැනීමට අවශ්‍ය විසඳුම් ද ඉදිරිපත් කළ හැකි ය.

සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන රාශියකි. තමා ජීවත් වන සමාජය හා වෙනත් සමාජ ගැන දැනුමක් ලබාගැනීමට සමාජ විද්‍යා දැනුම ප්‍රයෝජනවත් වේ. මිනිස් සමාජය හා ඒ වටා ගොඩනැගී ඇති සංස්කෘතිය, සමාජ විද්‍යාව මගින් අධ්‍යයනය කරනු ලැබේ. ඒ තුළින් ඕනෑම සමාජයක මානව චර්යාව කෙරෙහි බලපාන සමාජ හා සංස්කෘතික පසුබිම තේරුම් ගත හැකි වේ.

සෑම සමාජයක් තුළ ම ඒකීයත්වයක් මෙන් ම විවිධත්වයක් ද දක්නට ලැබේ. සමාජයක පැවැත්ම සහතික කරනු ලබන සමාජ සංවිධාන ද පවතී. මේවා මගින් සමාජයට ඉටු කරනු ලබන කාර්යයන්ගේ වෙනස්කම් තේරුම් ගැනීම මෙන් ම භෞතික සංවර්ධනය පමණක් සමාජ සංවර්ධනය ලෙස සැලකීමට නොහැකි බව තේරුම් ගැනීමට ද සමාජ විද්‍යා දැනුම ප්‍රයෝජනවත් වේ.

සමාජයක් ඒකාකාරී ව පවතින්නේ නැත. කලින් කලට යුගයෙන් යුගයට සමාජය වෙනස් වේ. එමෙන් ම ඕනෑ ම සමාජයක් තුළ සමාජ වෙනස්වීම හේතුකොට ගෙන සමාජ ගැටලු ඇති විය හැකි ය. මේවා ගැන සමාජ විද්‍යාත්මක අවබෝධයක් නොමැති අය ඒවායේ අයහපත් තත්ත්වයන් ගැන පමණක් කථා කරති. නමුත් සමාජ විද්‍යාව මේ ගැන දක්වන්නේ උපේක්ෂා සහගත ආකල්පයකි. සමාජ විද්‍යාව ඒවායේ හොඳ නරක කථා

කරනවාට වඩා ඒවායෙන් සමාජයේ පැවැත්මට සිදුකරන කෘත්‍යයයන් අධ්‍යයනය කරයි. මේ අනුව සමාජය පිළිබඳ ව පුළුල් දෘෂ්ටි කෝණයකින්

## 1.3. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හා එහි විෂය ක්ෂේත්‍රය

සමාජ විද්‍යා විෂය තුළ සමාජය හා අනුබද්ධිත සංකල්ප රැසක් සමාජ විද්‍යාඥයන් විසින් අධ්‍යයනය කරනු ලබයි. ඒ යටතේ

- සමාජ සංස්ථා
- සමාජානුයෝජනය
- සමාජ සමූහ
- තත්ත්වය හා කාර්ය භාරය
- සංස්කෘතිය
- සමාජ වෙනස්වීම

ආදී සංකල්ප කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

සමාජ අවශ්‍යතා ඉටුකරගැනීමේ අරමුණින් ඒවාට ම ආවේණික සිරිත් විරිත් හා සාරධර්ම පද්ධතියක් මත සංවිධානය වූ සමාජ ඒකකයක් **සමාජ සංස්ථාවක්** (Social Institutions) ලෙස හඳුන්වයි. සමාජයේ දිගුකාලීන යහ පැවැත්මට අවශ්‍ය වන සමාජ සංවිධානයක් ලෙස ද සමාජ විද්‍යාඥයින් විසින් සමාජ සංස්ථා විග්‍රහ කර ඇත.

පුද්ගලයා සමාජයට කෙසේ අනුවර්තනය වන්නේ ද? එහි ලා බලපෑම් කරනු ලබන සමාජ ආයතන කවරේ ද? එමගින් කුමන සමාජ බලපෑමක් සිදුකරයි ද? යන්න සමාජ විද්‍යාත්මකව අධ්‍යයනය කරනු ලබයි. එය සමාජ විද්‍යාවේ දී සංකල්පීය වශයෙන් **සමාජානුයෝජනය** (Socialization) යනුවෙන් හැඳින්වේ.

සමාජ පැවැත්ම යන පදනම තුළ පිහිටා සමාජ විද්‍යාඥයින් විසින් තවත් බොහෝ සංකල්ප හඳාරනු ලබයි. සමාජයක දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලෙස **සමාජ සමූහ** (Social Group) හඳුන්වා දිය හැකි ය. විවිධ පරමාර්ථ, විවිධ ගති ලක්ෂණ අනුව සකස් වූ සමාජීය සංකල්පයක් ලෙස සමාජ විද්‍යාව තුළ සමාජ සමූහ අධ්‍යයනය කරනු ලබයි.

එමෙන් ම සෑම සමාජයක ම පාහේ පුද්ගලයකුට හිමි වන **තත්ත්වයක්** හා **කාර්යභාරයක්** (Status and Duties) පවතී. ස්ත්‍රී පුරුෂ භාවය,

වයස, ජාති, කුල වශයෙන් ද ලැබෙන්නා වූ තත්ත්වයන් ආරෝපිත තත්ත්ව ලෙස ද, පුද්ගල උත්සාහය ආදී සාධක මගින් ලබා ගන්නා වූ තත්ත්වයන් සාධිත තත්ත්ව ලෙස ද හැඳින්වේ. ඒ ඒ තත්ත්වයන්ට අනුකූල ව රඟ දැක්විය යුතු කාර්යභාර්යයක් පවතී. සමාජ විද්‍යාවේ මූලික සංකල්පයක් ලෙස තත්ත්වය හා කාර්යභාර්ය ද හැඳින්විය හැකි ය.

සමාජයක ජීවත් වන ජනතාවගේ පොදු ජීවන ක්‍රමය **සංස්කෘතිය**යි (Culture). ඒ අනුව සංස්කෘතිය හා සමාජය අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතී. ඕනෑ ම පුද්ගලයෙකු සිය උපතින් පසු තමා අයත් සමාජයේ සංස්කෘතියට අනුව සකස්විය යුතු ය. එය සංස්කෘතියට අනුවර්ථනය වීම ලෙස ද හඳුන්වනු ලැබේ. පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි ද සංස්කෘතිය දැඩි බලපෑමක් කරනු ලැබේ. එම නිසා සමාජ විද්‍යාවේ මූලික සංකල්පයක් ලෙස සංස්කෘතිය අධ්‍යයනය කරනු ලබයි.

**සමාජ වෙනස්වීම** (Social Change) යන මූලික පදනම මත පිහිටා සමාජ විද්‍යාඥයෝ සමාජයක සිදුවන වෙනස්කම් අධ්‍යයනය කරති. නාගරීකරණය, කාර්මිකරණය, බටහිරකරණය සහ ගෝලීයකරණය ආදී සංකල්ප පිළිබඳ මෙහි දී අවධාරණය කෙරේ. මෙම සංකල්ප මගින් සමාජයක් සාම්ප්‍රදායිකත්වයේ සිට නවීනත්වය කරා යාම නිසා ඇති වන වෙනස්කම් අධ්‍යයනය කරයි. එසේ ම මෙම සංකල්ප අතර අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතාවක් ද පවතී.

## 1.4. බෞද්ධ භික්ෂූන් වහන්සේට සමාජ විද්‍යා විෂයයේ අවශ්‍යතාව

බෞද්ධ භික්ෂූන් වහන්සේ හා සමාජය අතර පවතින්නේ වෙන් කළ නොහැකි සම්බන්ධතාවකි. බෞද්ධ භික්ෂූන් වහන්සේ ගිහි සමාජයට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා පවත්වමින් සමාජ නායකත්වය ද ගෙන කටයුතු කරති. භික්ෂූන් වහන්සේ සමාජයට නායකයෙකු ලෙස ක්‍රියා කළ යුතු වේ. මේ වනාහි භික්ෂූන් වහන්සේ හා සමාජය අතර පැවතිය යුතු සම්බන්ධතාවෙහි ස්වභාවයයි. මෙම සම්බන්ධතා මනා ලෙස පවත්වා ගෙන යාම සඳහා භික්ෂූන් වහන්සේලාට සමාජය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

භික්ෂූන් වහන්සේට සමාජය පිළිබඳ ව පුළුල් අවබෝධයකින් තොර ව තම කාර්යභාරය ඉටු කළ නොහැකි ය. සමාජ විද්‍යා දැනුම ලබා දීම තුළින් බෞද්ධ භික්ෂූන් වහන්සේට නූතන සංකීර්ණ සමාජය හා ඒ ආශ්‍රිත සමාජ ගැටලු තේරුම් ගෙන අදාළ කාර්යභාරයන් සමාජයට ගැළපෙන අයුරින් ඉටු කළ හැකි වේ.

භික්ෂූන් වහන්සේ සමාජයට අනුශාසකයකු ලෙස කටයුතු කිරීමේ දී පවත්නා සමාජ සංකීර්ණභාවය තේරුම් ගත යුතු වේ. බුදුරජාණන් වහන්සේ ද තම අනුශාසකත්වය ලබා දී ඇත්තේ එකල පැවති සමාජ ස්වභාවය තේරුම් ගෙන එයට සරිලන පරිදි ය. උන්වහන්සේ පුද්ගලයා හා සමාජ ස්වභාවය මැනවින් තේරුම් ගෙන අනුශාසකත්වය දැරූහ. ඒ අනුව නූතන බෞද්ධ භික්ෂූන් වහන්සේට සමාජ අනුශාසකත්වය දැරීම සඳහා සමාජ විද්‍යා දැනුමේ ඇති අවශ්‍යතාව ප්‍රකට වේ.

නූතන සංකීර්ණ සමාජය තුළ අපරාධ, අපචාර, මානසික අසහනය, මත් උවදුර ආදී සමාජ ප්‍රශ්න දැකිය හැකි ය. එම නිසා සමාජය විසංවිධානයට ලක් වී ඇත. සමාජ විද්‍යාව තුළින් මෙම සමාජ ප්‍රශ්නවලට බලපාන හේතු සාධක අධ්‍යයනය කරනු ලබයි. ඒ තුළින් සමාජ ගැටලු විසඳීමේ හැකියාව ද ඇති කරයි. භික්ෂූන්වහන්සේලාට මෙම දැනුම ලබා දීමෙන් සමාජ ප්‍රශ්න සඳහා බලපාන හේතු සාධක විද්‍යාත්මක ව තේරුම් ගත හැකි වේ. ඒ අනුව සමාජ සංශෝධනය සඳහා අවශ්‍ය අනුශාසනා කළ හැකි ය.

විහාරස්ථානය හා සමාජය අතර සම්බන්ධතාව පවත්වා ගෙන යාමේ දී සමාජයේ ස්වභාවය තේරුම් ගත යුතු වේ. සමාජය කුමන ආර්ථික තත්ත්වයකින් යුක්ත ද කුමන සමාජ පරිසරයකින් යුක්ත ද ඔවුන් කුමන සමාජ ආර්ථික ගැටලුවලින් පෙළෙන්නේ ද යන්න පිළිබඳ ව භික්ෂූන්වහන්සේලාට දැනුමක් තිබිය යුතු වේ. ඒ අනුව සමාජ ස්වභාවය තේරුම් ගැනීමට බෞද්ධ භික්ෂූන් වහන්සේට සමාජ විද්‍යාත්මක දැනුම ප්‍රයෝජනවත් වේ.

සංකීර්ණ වූ සමාජයක් තුළ නූතන භික්ෂූන් වහන්සේට නායකත්වය දැරීමට සිදු වෙයි. විවිධ වූත් විෂම වූත් සංකීර්ණ වූත් සමාජයක නායකත්වය දැරීමේ දී භික්ෂූන්වහන්සේලාට විවිධ මානසිකත්වයන්ට මුහුණ දීමට සිදුවේ. නූතන සංකීර්ණ සමාජයේ පුද්ගල චරිත විවිධ පෞරුෂයන්ගෙන් යුක්ත ය. ආක්‍රමණශීලී චරිත, බුද්ධිවාදී චරිත, තර්කවාදී චරිත, භෞතිකවාදී චරිත ඒ අතර ප්‍රධාන වේ. මෙවැනි චරිතයන්ගෙන් යුත් සමාජයකට නායකත්වය ලබාදීමේ දී භික්ෂූන්වහන්සේලාට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වේ.

මෙම තත්ත්වයෙන් මිදී උපේක්ෂා සහගතව ක්‍රියා කිරීමට මිනිස් සමාජයේ චරිත ගැන අවබෝධයක් ලබාගත යුතු වේ. සමාජ විද්‍යාව නූතන සංකීර්ණ සමාජයේ මෙවැනි චරිත ගැන සාකච්ඡා කරනු ලබයි. සමාජ විද්‍යාත්මක දැනුම ලබාගැනීම තුළින් බෞද්ධ භික්ෂූන්වහන්සේට නූතන සංකීර්ණ සමාජයේ නායකත්වය කෙසේ ලබාදිය යුතු ද යන්න තේරුම් ගත හැකි වේ.

පැරණි සමාජය හා සසඳා බලන කල නූතන බෞද්ධයා පන්සල හා පවත්නා සම්බන්ධතාව අඩුවෙමින් පවතින බව පෙනේ. මේ සඳහා බලප ාන සාධක බොහෝ ය. එක් අතකින් මුදල් පසු පස හඹා යන සමාජයක් තුළ බෞද්ධයා ද එහි අනුකාරකයෙකු වී ඇත. කාමභෝගී, බහුභාණ්ඩික, ආත්මාර්ථකාමී ජීවිතයට බෞද්ධයා හුරු වීම නිසා තනිකම, හුදකලා බව, මානසික අසහනය, පීඩාකාරි බව මෙම ජීවිතයේ ප්‍රතිඵල වී ඇත. මෙම සමාජ ක්‍රමය තුළ බෞද්ධයන් සරල පැවතුම් ඇති කායික මානසික සෞඛ්‍යයෙන් යුත් සැනසිලිදායක පිරිසක් බවට පත් කිරීමේ වගකීම භික්ෂූන් වහන්සේ සතු වේ. එම නිසා පන්සලට බෞද්ධයා ආකර්ශනය කරගැනීමට නම් පවත්නා සමාජ ව්‍යූහය තේරුම් ගෙන බෞද්ධ සාරධර්ම මත පදනම් වූ ජීවන ක්‍රමයකට යොමු කිරීම සඳහා බෞද්ධ භික්ෂූන්වහන්සේට හැකියාව තිබිය යුතු ය. මේ සඳහා සමාජ විද්‍යාත්මක දැනුම ප්‍රයෝජනවත් වේ.

## 01 ක්‍රියාකාරකම්

01. සමාජ වෙනස්වීම් ක්‍රමානුකූල ව සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

02. සමාජ විද්‍යා විෂය පෝෂණය සඳහා දායකත්වය දැක්වූ සමාජ විද්‍යාඥයන් කිහිපදෙනෙකු නම් කර එයින් දෙදෙනෙකුගෙන් විෂයයේ සංවර්ධනයට ඉදිරිපත් වූ අදහස් කෙටියෙන් දක්වන්න.

03. වර්තමාන සමාජයේ බහුල ව දක්නට ලැබෙන සමාජ ප්‍රශ්න ලැයිස්තු ගත කරන්න. එම සමාජ ප්‍රශ්නවලට අදාළ සිද්ධි පිළිබඳ ලිපි එකතුවක් සතියක පුවත්පත් ඇසුරු කරගෙන සකස් කරන්න.

04. සමාජ විද්‍යාව ඉගෙන ගැනීමෙන් භික්ෂූණ්වහන්සේට අත්වෙන ප්‍රයෝජන සඳහන් කරන්න.

05. ''භික්ෂුවකගේ සැබෑ නායකත්වය තුළ සමාජයට පොලිසියක්, උසාවියක් අවශ්‍ය වන්නේ නැත''. භික්ෂූන් වහන්සේලාට සමාජ විද්‍යා දැනුමේ අවශ්‍යතාව තහවුරු කරමින් ඉහත ප්‍රකාශයට පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු ඉදිරිපත් කරන්න.

# 02 සමාජ පරිණාමය

සමාජ පරිණාමය සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයකි. කාලය පදනම් කරගෙන සමාජය තුළ සිදුවන විකාශනය සමාජ පරිණාමය යි. එක් අවස්ථාවක සමාජයේ පැවති ස්වභාවය ඊළඟ අවස්ථාවක දී වෙනස්වීම පරිණාමය නිසා සිදු වේ. පුද්ගල සබඳතා මගින් එකට එක්ව ක්‍රියාකිරීමෙන් සමාජයක් සෑදේ. කාලයත් සමග පුද්ගල සම්බන්ධතා වෙනස් වෙයි. මෙලෙස පවතින වෙනස්වීමේ ලක්ෂණ ගතික ස්වභාවය ලෙස හැඳින්වේ. ගතිකත්වය පුද්ගලයා තුළ නියත වශයෙන් පවතින තත්ත්වයකි. සමාජය පරිණාමය වීමට බලපානු ලබන මූලික හේතුව පුද්ගලයා තුළ පවතින මෙම ගතික ස්වභාවය යි. සමාජ විකාශනය වීමත් සමග කලින් කලට එහි ව්‍යූහය මෙන් ම පුද්ගල චර්යාවන් ද වෙනස් වෙමින් නව තත්ත්වයක් ඇති වේ. සමාජයෙහි ඇතිවන මේ වෙනස සමාජ වෙනස් වීම නැතහොත් සමාජ පරිණාමය නමින් හැඳින්වේ.

සමාජ පරිණාමය සමාජයක පැවැත් ම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. පැරණි සමාජය මුහුණ දුන් අභියෝග ජයගැනීම සඳහා සමාජයේ වෙනස්කම් සිදු වී තිබේ. සමාජයක් අභිවෘද්ධිය කරා යෑම සඳහා කාලානුරූප ව සමාජයේ ව්‍යූහාත්මක වූත් චර්යාත්මක වූත් වෙනස්කම් සිදුවිය යුතු ය. වෙනස්වීමෙන් සමාජය අලුත් අභියෝගවලට මුහුණ දීමට ශක්තිමත් වේ. පැරණි සමාජය නූතන සමාජය දක්වා පරිණාමය වී ඇත්තේ මේ නිසා ය.

## 2.1. නූතන හා පැරණි සමාජවල ස්වභාවය

සමාජ පරිණාමය නිසා සාම්ප්‍රදායික සමාජය නූතන සමාජය දක්වා වෙනස් වී ඇත. සමාජයක් අලුත් අභියෝගවලට මුහුණ දෙන විට මිනිසා තුළ ඇති වෙනස්වීමේ හැකියාව මත, පවත්නා සමාජය නව තත්ත්වයන් කරා මාරු වෙයි. පැරණි සමාජ වෙනස් වී නූතන සමාජයන් ගොඩනැගෙන්නේ මේ නිසා ය. මේ වෙනස්වීම නිසා පැරණි සමාජවල බොහෝ ලක්ෂණ, නූතන සමාජවල දක්නට නොලැබේ. ඇතැම් විට සමානතා තිබුණ ද පැරණි හා නූතන සමාජවල වෙනස්කම් රැසක් දක්නට ලැබේ. පැරණි සමාජය හා නූතන සමාජය ලෙස සමාජය වර්ග කර ඇත්තේ ද මේ වෙනස්කම් පදනම් කර ගෙන ය.



1. රූපය -
පැරණි තාක්ෂණය යොදා ගැනීම



2. රූපය -
නවීන තාක්ෂණය යොදා ගැනීම

| පැරණි සමාජ ලක්ෂණ | නූතන සමාජ ලක්ෂණ |
|---|---|
| ජන සංඛ්‍යාව අඩු වීම. | විශාල ජනකායක් සිටීම. |
| එකම කණ්ඩායමකට අයත් ජනතාවක් සිටීම. | විවිධ ජන කණ්ඩායම්වලින් සමාජය සකස් වී තිබීම. |
| සමාජ සම්බන්ධතා සීමාසහිත වීම හා ඒවා සමීප සබඳතා වීම. | සමාජ සම්බන්ධතා පුළුල් වීම හා ඒවා වැඩි වශයෙන් නෛතික ඒවා වීම. |
| සිරිත් විරිත් රැකීමට දැඩි උනන්දුවක් තිබීම. | සිරිතට වඩා නීතියට වැඩි තැනක් ලැබීම. |
| අධ්‍යාපනය ඉතා අඩු මට්ටමක තිබීම. | අධ්‍යාපනය අනිවාර්යය වී උසස් අධ්‍යාපනයක් ලැබීම. |
| සරල තාක්ෂණයක් යොදා ගැනීම. | දියුණු සංකීර්ණ තාක්ෂණය යොදා ගැනීම. |
| මට වඩා අපි යන සංකල්පයෙන් යුක්ත වීම (පොදු බව). | පෞද්ගලිකත්වයට වැඩි තැනක් ලැබීම. |
| ශ්‍රම විභජනය අවම වීම. | සංකීර්ණ ශ්‍රම විභජනයක් තිබීම. |
| ආරෝපිත තත්ත්වයක් ඉස්මතුවී තිබීම. | සාධිත තත්ත්වයන් ඉස්මතුවී තිබීම. |



3 රූපය ග්‍රාමීය ජනාවාස



4 රූපය නාගරික ජනාවාස

පැරණි සමාජ හා නූතන සමාජ අතර වෙනස්කම් පදනම් කරගෙන මේ සමාජ දෙකෙහි ලක්ෂණ අධ්‍යයනය කළ හැකි ය. පැරණි හා නූතන සමාජ අතර වෙනස්කම් කිහිපයකි. ජන සංඛ්‍යාව පිළිබඳ වෙනස්කම්, ජනතාවගේ ඒකීයත්වය හා විවිධත්වය පිළිබඳ වෙනස්කම්, සමාජ සම්බන්ධතා පිළිබඳ වෙනස්කම්, අධ්‍යාපන තත්ත්වය හා තාක්ෂණය පිළිබඳ වෙනස්කම්, සිරිත් විරිත් පිළිබඳ වෙනස්කම්, සාම්ප්‍රදායික ලක්ෂණ හා නෛතික ලක්ෂණ පිළිබඳ වෙනස්කම් හා තත්ත්වය පිළිබඳ වෙනස්කම් ආදිය වේ.

## 2.2. සමාජ පරිණාමය පිළිබඳ සමාජ හා මානව විද්‍යාඥයන්ගේ මතවාද

සමාජ පරිණාමය සමාජ විද්‍යාඥයන් විශේෂ අවධානය යොමු කළ විෂයය ක්ෂේත්‍රයකි. සමාජ පරිණාමය සිදුවීමේ දී කැපී පෙනෙන ලක්ෂණ කිහිපයකි. එනම් සමාජයේ වෙනසක් සිදුවීම, ඒ සඳහා කාලයක් ගතවීම, වෙනස් වූ තත්ත්වයන්ට අනන්‍යතාවක් තිබීම එම ලක්ෂණ යි. සෑම සමාජ විද්‍යාඥයෙකු ම පාහේ සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක්වීම සඳහා මතවාද ගොඩනංවා ඇත.

එවැනි මත ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයන් කිහිප දෙනෙකු දැක්විය හැකි ය.

- ඔගස්ට් කොම්ට් - (Auguste Comte),
- එමිල් ඩුර්කයිම් - (Emile Durkhiem),
- මැක්ස් වේබර් - (Max Weber),
- කාල් මාක්ස් - (Karl Marxs)

වැනි සමාජ විද්‍යාඥයන් මේ අතරින් වැදගත් වේ.

මේ සෑම සමාජ විද්‍යාඥයකු ම තම තමන්ට අනන්‍ය වූ මත ඉදිරිපත් කර ඇත. එහෙත් ඒ මතවාද අතර පොදු ලක්ෂණ ද තිබේ. මේ සෑම දෙනා ම සරල නොදියුණු මූලික සමාජයක් පැවති බව පිළිගනී. පැරණි සමාජය වෙනස් වී සංකීර්ණ නූතන නාගරික සමාජය බිහි වූ බව ද ඔවුන් සියලු දෙනාගේ ම පිළිගැනීමයි.

පැරණි සමාජය ඒකාකාරී ව ක්‍රියාත්මක වූ සරල සමාජයකි. සමාජය තුළ වූ ජීව සහ අජීව සියල්ලක් ම දේවබලයකින් ක්‍රියාත්මක වන බව සාම්ප්‍රදායිකයින්ගේ මතයයි. ශාස්ත්‍රානුසාරයෙන් ගොඩනැගුණු විමර්ශනශීලිත්වයක් නොතිබුණු පැරණි සමාජයේ පුරවැසියා පරිසරය දේවත්වයෙන් පිදීමට උත්සහ කළ බව **ඔගස්ටේ කොම්ටේ** නම් සමාජ විද්‍යාඥයාගේ අදහස යි. පාලකයා දෙවියන්ගේ නියෝජිතයා ය, යන මතය සමාජයේ තහවුරු කර තිබිණි. පාලකයාගේ නීතිය දේවධර්මය බව එම සමාජය විශ්වාස කළ අතර ජනතාව පාලකයාගේ කැමැත්තට අවනත විය යුතු බව ද පිළිගත් මතයකි.

නූතන සමාජය දේවවාදී සංකල්පයන්ගෙන් ඉවත් ව සමාජය දෙස යථාර්ථවාදී ව බැලීම නිසා ඇති වූ ප්‍රතිඵලයක් ලෙස සමාජ පරිණාමය දක්වයි. අධ්‍යාපනය ලැබීම නිසා දැනුවත් බව ඇති වීමෙන් විමර්ශනශීලීව ජීව අජීව වස්තූන් පිළිබඳ යථාර්ථවාදී අවබෝධයක් ලැබිමට නූතන සමාජයට හැකි වේ. පුද්ගලයා ගැන මෙන් ම අවට පරිසරය පිළිබඳව ද නිවැරදි අවබෝධයක් ලැබීමට නූතන සමාජයට අවස්ථාව ලැබිණි.

පැරණි සමාජ යාන්ත්‍රික ස්වරූපයෙන් ක්‍රියාත්මක වූ බව **එමිල් ඩුර්ක්හයිම්** නම් සමාජ විද්‍යාඥයාගේ අදහස විය. සම්ප්‍රදාය මත මෙහෙයවුණු මේ සමාජයට සම්ප්‍රදාය ඉක්මවා යාමට හැකියාවක් නොතිබුණි. පියාට හෝ තම පරපුරට හිමි වූ කාර්යය ම පමණක් ඔවුන් විසින් සිදු කෙරිණි. මේ නිසා සමාජය තුළ යාන්ත්‍රික ස්වරූපයක් ඇති විය. සමාජය තුළ සිදු වූ වෙනස්කම් මෙන් ම චින්තනයේ සිදු වූ වෙනස්කම් නිසා ද මේ සමාජය පරිණාමයට පත්වේ. පරිණාමය නිසා ගොඩනැගෙන අලුත් සමාජ, සාම්ප්‍රදායික බවෙන් මිදී නාගරික සමාජයක් බවට පත් වෙන බව ඩුර්ක්හයිම් පවසයි.

සමාජය පරිණාමය වීම සඳහා වැඩ බෙදාගැනීම හෙවත් ශ්‍රම විභජනය හේතු වන බව සමාජ විද්‍යාඥයින් ගේ අදහසයි. පැරණි සමාජයේ නිරායාසයෙන් ම ගොඩනැගුණු සම්බන්ධතා පැවතිය ද නූතන සමාජයේ නීතිය මූලික කොට ගෙන ඇතිවෙන සම්බන්ධතා දක්නට ලැබේ. ශ්‍රම විභජනය නිසා නූතන නාගරික සමාජයෙහි තම කැමැත්ත මත ක්‍රියා කිරීමේ හැකියාවක් දක්නට ලැබේ.

පැරණි සාම්ප්‍රදායික සමාජය අතාර්කික බවින් යුතු සමාජයකි. පැරණි ආගමික සංකල්ප මගින් ඔවුන්ගේ තාර්කිකත්වය හා විමසුම් සහිත බව දුර්වල කොට තිබිණි. පසළොස්වන හා දහසය වන සියවස්වල සිදු වූ ආගමික, කාර්මික, දේශපාලනික පුනර්ජීවයේ ප්‍රතිඵලයක් ලෙස සාම්ප්‍රදායික සමාජ ක්‍රමයෙන් පරිණාමය වන අතර සම්ප්‍රදායික බැඳීම් ද වෙනස් විය. මේ බැඳීම්වලින් මිදුණු සමාජයට තාර්කික ව කල්පනා කිරීමටත් ක්‍රියා කිරීමටත් අවස්ථාව ලැබිණි. තර්කානුකූලව කටයුතු කරන නූතන සමාජය දක්වා සම්ප්‍රදායික සමාජය වෙනස්වීම සමාජ පරිණාමය ලෙස මැක්ස් වේබර් දක්වා ඇත.

සමාජ පරිණාමයේ දී ආර්ථික සාධක ද හේතු වූ ආකාරය පෙනේ. පැරණි සමාජය තුළ පැවතියේ සරල ආර්ථික ක්‍රමයකි. මුල් ම අවධිය තුළ සාමූහික නිෂ්පාදන ක්‍රමයක් තිබුණු බැවින් ගැටලුවලින් තොර ව එම සමාජය පැවතිණි. නිෂ්පාදන ක්‍රමයේ වෙනස්කම් නිසා සමාජය පරිණාමයට පත්වුණු අතර තාක්ෂණික දියුණුව නිසා සාමූහිකත්වය ද වෙනස් විය. කාර්මික ජීවනෝපාය මුල් කරගත් නාගරික සමාජයක් දක්වා ප්‍රාථමික සමාජය පරිණාමය වූ අතර පසුව රදළයන් විසින් ඉඩම් අල්ලාගැනීමෙන් වැඩවසම් ක්‍රමයක් බවට සමාජය පරිණාමය විය. වැඩවසම් ක්‍රමය තුළ සිටි රදළයා හා ප්‍රවේනි දාසයන් අතර ඇති වූ ගැටුම් හා තාක්ෂණයේ වර්ධනය හේතුවෙන් එම නිෂ්පාදන ක්‍රමය ද වෙනස් වී කාර්මික නිෂ්පාදන යුගයක් හෙවත් ධනවාදී (capitalistic) අවස්ථාවක් දක්වා සමාජය වෙනස් වී ඇත. ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ ධනපතියා විසින් නිර්ධනයන් පීඩනයට පත්කරන බැවින් ගැටුම් හෝ පීඩාකාරීතත්වයෙන් තොර සමාජවාදී අර්ථ ක්‍රමයක් ලෝකයේ පහළ වන බව කාල් මාක්ස් සඳහන් කරයි.

පරිණාමය පිළිබඳ මතවාද ඉදිරිපත් කළ සමාජ හා මානව විද්‍යාඥයින්ගේ අදහස් විමසා බැලීමේ දී සරල,නොදියුණු,ඒකාකාරී තත්ත්වයක පැවති ප්‍රාථමික සමාජ කාර්මීකරණය, නාගරීකරණය, වෙළඳපොළ ක්‍රමය වැනි දියුණු තත්ත්වයන් කරා පරිණාමය වූ ආකාරය පෙන්වා දී ඇති බව පෙනේ.

මේ නාගරික සමාජය තුළ බහු මාධ්‍යකරණය (Mass Media), පෞද්ගලික අරමුණු බහුල වීම සහ ලාභ අපේක්ෂාවෙන් යුතුව කටයුතු කිරීම හේතුවෙන් සමාජ ප්‍රශ්න හා පාරිසරික ගැටලු නිර්මාණය වේ. විශේෂයෙන් අධි පරිභෝජන රටාවක් තිබීම නිසා මානසික අසහනය තරගකාරිත්වය වැනි තත්ත්වයන් නූතන නාගරික සමාජය තුළ දක්නට ලැබේ.

## 2.3. සමාජ පරිණාමය සිදුවෙන ආකාරය බෞද්ධ දෘෂ්ටිකෝණයෙන්

වෙනස්වීම නම් සංකල්පය බුදුදහමේ මූලික ඉගැන්වීමකි. ලෝකයේ පහළ වී තිබෙන සියලු ම වස්තූන් කෙරෙහි වෙනස්වීමේ ලක්ෂණ දැකිය හැකි ය. වෙනස්වීම හෙවත් පරිණාමය බුදුදහමෙහි ඉදිරිපත් කෙරෙන්නේ අනිත්‍යතාව නම් සංකල්පයෙනි. අනිත්‍යතාව නම් යමක් එක ම ආකාරයෙන් නොපවතින බවයි. මිනිසා තම ජීවිතයේ දී ළදරුවිය, ළමාවිය, යොවුන්විය, වැඩිහිටිවිය, මහලුවිය ආදී වශයෙන් විවිධ අවස්ථාවන්ට පත් වේ. එවැනි තත්ත්වයන්ට පත්වන්නේ කාලයත් සමග සිදුවෙන වෙනස්වීම නිසා ය. මේ වෙනස්වීම නිසා දුක හටගන්නා බව බුදුදහමේ ඉගැන්වේ. **විපරිණාම දුක්ඛ** යනුවෙන් එම තත්ත්වය හැඳින්වේ.

විපරිණාමය කාලය අනුව සිදුවන්නකි. ඕනෑ ම වස්තුවක් තුළ ඇතිවීම, පැවතීම, නැතිවීම යන ලක්ෂණ තුන දක්නට ලැබේ. **උප්පාද ඨිති භංග** යන සංකල්පය ඔස්සේ මේ තත්ත්වය විග්‍රහ කෙරේ. **උප්පාද** යනු ඉපදීම හෙවත් බිහිවීමයි. **ඨිති** යන්නෙන් දැක්වෙන්නේ උපන් දෙය යම් කාලයක් තුළ පවතින බවයි. **භංග** යනු බිඳීයාම හෙවත් මිය යාම ලෙස දක්වා ඇත. සමාජය වෙනස් වීම සඳහා මේ ලක්ෂණ බලපායි.

සමාජ සම්බන්ධතා මගින් එකට බැඳී සිටින පුද්ගල කණ්ඩායම සමාජයයි. එබැවින් සමාජයෙහි ඇති වන වෙනස්වීම ප්‍රකට වන්නේ පුද්ගල සම්බන්ධතා පද්ධතිය තුළිණි. සමාජය පරිණාමය වූ නැතහොත් දිගුකාලීන ව විකාශනය වූ එකකි. එසේ විකාශනය වීම තුළ සිදුවන වෙනස්කම් එම සමාජයේ චර්යා පද්ධතිය තුළ ද වෙනසක් සිදුවීම කෙරෙහි බලපානු ලබන සාධකයකි.

පෘථිවියේ ජීවය පහළ වූ අවස්ථාවේ සිට මේ දක්වා ම සමාජය විකාශනයට ලක්වෙමින් පවතී. බුදුදහම සමාජයේ පහළවීම පිළිබඳ ව මෙන් ම සමාජය විකාශනය වන ආකාරය පිළිබඳ ව ද කරුණු දක්වා ඇත. දීඝ නිකායේ

අග්ගඤ්ඤ සූත්‍රයේ සමාජයෙහි ආරම්භය හා විකාශනය සම්බන්ධ කරුණු රැසක් සඳහන් වේ. පෘථිවියේ පහළ වූ මුල් ම ජීවීහු ප්‍රභාමත් ශරීරවලින් හෙබියෝ ය. අහසින් යන ගමන් ඇති ඔවුහු ප්‍රීතිය ආහාර කොටගෙන විසූහ. පෘථිවියේ රස අනුභව කිරීමත් ඒ රස පිළිබඳ ව ඇති කර ගත් තණ්හාවත් නිසා ඔවුන් තුළ පැවැති ප්‍රභාමත් බව අතුරුදහන් වීය. අහසින් යාමට ද නොහැකිවී ඝන ශරිර පහළ වූ ආකාරය මෙහි දැක් වේ. සමාජයෙහි අපරාධ, දඬුවම්, පමණක් නොව රාජ්‍ය ද බිහිවන්නේ මිනිසා තුළ වූ තණ්හාව නිසා බව එහි දැක් වේ. පස්පව් දසඅකුසල් කිරීම නිසා සමාජය පිරිහී යයි. ඒවායෙන් වෙන්ව ධාර්මික ව ජීවත්වීම නිසා යහපත් සමාජයක් බිහි කරගැනීමට මග පෑදෙන ආකාරය දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ දී බුදුන් වහන්සේ දේශනාකර ඇත. විශේෂයෙන් පන්සිල්, අටසිල්, දසසිල් රැකීම සමාජයේ යහ පැවැත්මට හේතු වේ. එවැනි යහපත් චර්යාවන් මගින් සමාජය ආර්ය සමාජයක් බවට පරිණාමය වේ. යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කරගැනීම සඳහා සීල ප්‍රතිපත්තිය මැනවින් උපකාරී වන ආකාරය ප්‍රකට වේ. ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා නිවන් මග විවර කරයි.

යහපත් සමාජයක් නිර්මාණය වීම සඳහා පාලකයා සතු කාර්යභාරය දීඝ නිකායේ **චක්කවත්ති සීහනාද** සූත්‍රයෙන් ඉදිරිපත් කෙරේ. සමාජයේ හොර මැරකම් අධික වීම සිදුවන්නේ පාලකයාගේ වරදින් බවත් සොරු න් විනාශ කිරීමෙන් පමණක් සොරකම නැති කළ නොහැකි බවත් මෙහි දැක් වේ. සොරුන් ඇතිවන්නේ දුප්පත්කම නිසා වන අතර පාලකයා සමාජයේ දුප්පත්කම නැති කිරීමට ක්‍රියා කළ යුතු ය. ඒ සඳහා ප්‍රාග්ධනය සම්පාදනය කර දීම පාලකයාගේ වගකීම වන බව දැක්වේ. හොරු, හොරකම් සඳහා ආයුධ දරති. ඔවුන් මර්දනය කිරීම සඳහා ද සොරුන්ගෙන් ආරක්ෂා වීම සඳහා ද සමාජය ආයුධ දරයි. එයින් සමාජය තුළ හිංසනය රජ වෙයි.

**රජුන් අදමිටු වත්**

**වෙති මැතිදෝ ද එ පවත්**

**දැක උන්ගේ පවත්**

**බමුණු ගහපතියෝ ද එ ගනිත්**

යනුවෙන් බුදුගුණ අලංකාරයේ සඳහන් වෙන්නේ රජු අධාර්මික වන විට සමස්ත සමාජය ම අධාර්මික වන බවයි. රජු ධාර්මික වීම සමාජයක්

යහපත් වීම කෙරෙහි අත්‍යවශ්‍ය සාධකයකි. එවැනි රජෙක් ඇති සමාජයක් සුරපුරයට ද වඩා සිය ගුණයෙන් යහපත් වන බව සුභාෂිත කාව්‍යයේ දැක් වේ.

සමාජය පරිණාමය වන්නේ පුද්ගල චර්යාවන්හි පවතින ස්වභාවයන් මත බව බුදුදහමෙහි පැහැදිලි ව දක්වා තිබේ. සැමවිට ම රාගා දී කෙලෙස් වලට බැඳීම පුද්ගල ස්වභාවයයි. ඒ හේතුවෙන් ආත්මාර්ථකාමිත්වය, අපරාධ බහුලවීම ආදිය ඇති වේ. එවැනි විෂම සමාජයක ජීවත් වෙමින් වැනසී යන ජන ජීවිතය ඉන් මුදවා යහපතෙහි පිහිටුවීම බුදුරජාණන් වහන්සේ ලා පහළවීමේ පරමාර්ථයයි. රාග, ද්වේෂ, මෝහාදී අඳුරින් මිදී උතුම් චර්යා ඇති කරගැනිමෙන් උත්තරීතර තත්ත්වයට හෙවත් ආර්ය තත්ත්වයට සමාජය පත් කරගත හැකි ය. බුදුදහමට අනුව සමාජය වෙනස් විය යුතු වන්නේ එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා ය.

## 2.4. විහාරස්ථානය ආශ්‍රයෙන් සිදු වූ සමාජ වෙනස්වීම

මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකික ජන සමාජයට දායාද වූ වැදගත් ආයතනයකි, විහාරස්ථානය. දෙවනපෑතිස් රජුගේ අනුග්‍රහය ලැබීමෙන් ලක් දෙරණෙහි ශාසනය තහවුරු කරනු පිණිස අරිට්ඨ කුමරු වැනි ස්වදේශිකයන් පැවිදි බිමට පැමිණීමත් සමග භික්ෂු ශාසනයේ වර්ධනය සිදු විය. මේ නිසා රට පුරා විවිධ ප්‍රදේශවල පන්සල් ඉදි විය. වැවයි දාගැබයි, ගමයි, පන්සලයි, යන ප්‍රකට සංකල්පය, ගොඩනැගෙන්නේ විහාරස්ථානය සහ ග්‍රාමීය ජන ජීවිතය අතර ඇති දැඩි සබඳතාව හේතුවෙනි. සමාජයට සිදු වූ මෙහෙවරත් නිසා විහාරස්ථානය ගැමි සමාජය තුළ කෙතරම් හොඳින් තහවුරු වූවා ද යන්න මෙ මගින් අවබෝධ වේ.

විහාරස්ථානය ශ්‍රී ලාංකික සමාජයෙහි ක්‍රියාත්මක වන්නේ බහුකාර්ය ආයතනයක් ලෙසයි. එක් අතකින් එය බෞද්ධයාගේ විමුක්තිය සඳහා මග පෙන් වූ ආධ්‍යාත්මික සංවර්ධනයේ මූලස්ථානය වශයෙන් ක්‍රියා කළේ ය. තව අයුරකින් සමාජයේ එදිනෙදා ගොඩනැගෙන ගැටලු විසඳාගැනීමට මග පෙන් වූ ආයතනයක් වශයෙන් ද ක්‍රියා කෙරේ. අද දක්වාත් විහාරස්ථානය මේ වගකීමෙන් බැහැර වී නැත. ජනතාවගේ ධර්ම ඥානය දියුණු කරලීම පිණිස කටයුතු කරමින් සිටින විහාරස්ථානය ඔවුන්ගේ විමුක්තිය උදෙසා මග පෙන්වන ආයතනයයි. එසේ ම බණ, පිරිත, පාංශුකූලය මෙන් ම දරුවෙකුට නම් තැබීම, අකුරු කියවීම ආදී මංගල-අවමංගල ලෞකික හා ලෝකෝත්තර කටයුතු කෙරෙහි ද පන්සලේ නායක හිමියන්ගේ උපදේශකත්වය මෙන් ම සහභාගිත්වය ද ලැබේ. සිංහල ජාතියත් බුදුදහමත් ගසට පොත්ත මෙන්

එකට බැඳී ඇතැයි ප්‍රකාශ කරනු ලබන්නේ විහාරස්ථානයත් සමාජයත් අතර ඇති අවියෝජනීය සම්බන්ධතාව මත පුද්ගල චර්යාවන්හි සිදු වූ සංවර්ධනය නිසා ය.

දෙස් විදෙස් වියතුන්ගේ අප්‍රමාණ ගෞරවාදරයට පත් වූ ශ්‍රී ලාංකික සමාජයේ චර්යාමය සංවර්ධනය උදෙසා විහාරස්ථානයෙන් සිදු වූයේ අනුපමේය සේවයකි. ආත්මාර්ථයට වඩා පරාර්ථය ගරු කරන උත්තරීතර මනුෂ්‍ය ධර්මය සමාජගත වන්නේ විහාරස්ථානයේ කාර්යභාරය නිවැරදි ව ඉටු ව තිබීම හේතුවෙනි. අන්‍ය ජාතියකට නැති පරෝපාකාරය, ආගන්තුක සත්කාරය, දයාව, කරුණාව වැනි ශ්‍රේෂ්ඨ ගුණාංග සමාජය තුළ තහවුරු වූයේ බුදුදහම නිසා ය. ගමික වත, ආරාමික වත, වැසිකිලි වත ආදී වශයෙන් විහාරස්ථානය ඇසුරේ ක්‍රියාත්මක වූ උතුම් චාරිත්‍රවල ආලෝකයෙන් සමස්ත බෞද්ධ සමාජය තුළ වැදගත් චර්යාමය වෙනසක් සිදු වී තිබේ. ජාතියක් වශයෙන් අප සතු උදාරත්වය පිටුපස තිබෙන ගාමක බලවේගය වන්නේ විහාරස්ථානයේ බලපෑම ය.

රැස් කිරීමෙන් කරදරයට පත්වන සමාජයට පරිත්‍යාගයෙන් සැනසීම ලද හැකි ය යන උතුම් වදන සමාජයට එළිපෙහෙළි කරන ලද්දේ විහාරස්ථානය තුළිනි. මම ය මාගේ ය යන අදහසින් යුතුව වස්තුව, නම්බු නාම, තනතුරු, රැස් කරගැනීම නිසා සමාජය ඉමහත් පීඩාවකට පත්ව සිටී. මේවා රැස්වන තරමට කරදර වැඩිය පරිත්‍යාග කළ තරමට කරදර අඩු ය. භික්ෂූන් වහන්සේලා සතු ව ඇත්තේ පාසිවුරු පමණකි. උන්වහන්සේගේ පැවැත්ම සරල ය, බර අඩු ය. මේ නිසා ජවන හංසයකු මෙන් වේගයෙන් නිවන කරා යා හැකි බව සඳහන් වේ. සැබෑ සතුටක් ඇති වන්නේ රැස් කරගැනීම නිසා නොව අත් හැරීමනිසා ය, යන පණිවිඩය සමාජයට ලැබෙන්නේ විහාරස්ථානයෙනි. අත්හරින්නා දන් දෙයි. දීම නිසා දානපතියා තුළ සැහැල්ලු බවක් සතුටක් ඇති වේ. අන්‍යන්ගේ ප්‍රසංශාවට ලක් වේ. ඔහුගෙන් දානය ලබන දුගියා සුවපත් වේ. ඔහු ද සතුටට පත් වේ. දුන් අයට මෛත්‍රී වඩයි. මේ නිසා අත් හැරීම නම් චර්යාව නිසා සමාජය තුළ විශාල ආකල්පමය වෙනසක් ඇතිවේ.

මිහිඳු හිමියන් ලංකාවට වැඩම කරන විට ලක් රජු හා පිරිස විනෝදය පිණිස දඩ කෙළියේ යෙදී සිටිය හ. එයින් පැහැදිලි වන්නේ මහින්දාගමනයට පෙර පැවති සමාජය තුළ ජීවිතවල වටිනාකම පිළිබඳ බලවත් හැඟීමක් හෝ තැකීමක් නොතිබුණු බව ය. සියලු සත්ත්වයෝ දඬුවමට බිය වෙති. ජීවිතයට ආශා කරති. තමන් ද එසේ වන බැවින් අන් අයගේ ජීවිතවලට හානි නොකළ යුතු ය, යන පණිවිඩය බුදු දහමින්

සමාජයට ලැබිණි. ඒ තුළ හිංසනයෙන් තොර සමාජයක් ලෙස සමාජය වෙනස් වූ අයුරු පෙනේ. මෙය භික්ෂූන් වහන්සේලාගේ දහම් පණිවිඩයෙන් සමාජය ලද පාඩමකි. දෙවන පෑතිස් රජු මිහිඳු මහරහතන් වහන්සේ ඉදිරියේ දුනු හී අත් හැරීමෙන් සංකේතවත් වන්නේ එම උතුම් ගුණාංගය පිළිගත් බවයි. අභය දානයේ වැදගත්කම සමාජයේ තහවුරුවීම නිසා පුද්ගල චර්යාවල විශාල වෙනසක් සිදු වී ඇත. එම චර්යාමය වෙනස්කම් සමාජයේ ව්‍යාප්ත වන්නේ විහාරස්ථානය නිසා ය. සමාජය තුළ නව චර්යා පද්ධතියක් අගනාකම් පද්ධතියක් බිහිවීමට මේ තත්ත්වය ද හේතු වේ.

අසරණ භාවයට පත්වූවන්ට පිහිටවීම බුද්ධ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණයකි. සුනීත, සෝපාක වැනි පහත් යැයි සම්මත කුලවල අය ද පුණ්ණා වැනි වහලුන් ද අංගුලිමාල වැනි මිනීමරුවන් ද පැවිදි බව ලබා නිවන් අවබෝධ කළේ බුදුන්වහන්සේ තුළ වූ මානව දයාව හා සමානාත්මතාවය නිසායි. බුද්ධ පුත්‍රයන් වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ තමාගේ බොහෝ සම්බන්ධතා අතහැර පැවිදි වී ඇත. තමාට කිසිදු ඥාතිත්වයක් නැති ගුරු හිමියන්හට පියෙකු මෙන් සැලකීම ද, සිසුන්ට දරුවන් මෙන් සැලකීම ද දක්නට ලැබේ. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව විහාරස්ථානයේ ගුරු සිසු දෙපක්ෂය අතර පියපුතු මෙන් සම්බන්ධතාවක් පැවතිය යුතු ය.

එහි දී භික්ෂූන් වහන්සේ ලා තුළින් ප්‍රකට වන්නේ උතුම් මානව දයාව හා සමානාත්මතාවයි. ධනය, නිලය, බලය ආදී කුමන තත්ත්වයක් තිබුණ ද සියලු දෙනා වෙත සමානාත්මතාවකින් කටයුතු කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වෙති. මේ හරවත් පණිවිඩය සමාජය වෙත ගලා ගියේ විහාරස්ථානයෙනි. සමාජයේ ආචාර ධර්ම සකස්වීම කෙරෙහි මේ ඉගැන්වීම් බොහෝ සෙයින් හේතු වේ. සමාජය තුළ පැවති ආත්මාර්ථකාමී පක්ෂපාතී අදහස් වෙනස් වී යහපත් චර්යා ධර්ම පද්ධතියක් නිර්මාණය වීම පිණිස මේ කරුණු බලපෑවේ ය.

## 2.5. පිරිවෙන ආශ්‍රයෙන් සිදු වූ සමාජ වෙනස්වීම

පිරිවෙන යන පදය පාලි භාෂාවේ එන '**පරිවේන**' යන වචනයෙන් බිඳී ආ පදයක් ලෙස සැලකේ. මුල් යුගයේ දී පිරිවෙන නමින් හඳුන්වා ඇත්තේ භික්ෂූන් වහන්සේලා හෝ භික්ෂුණීන් වහන්සේලා වැඩ සිටි කුටිය හෝ ගෘහයයි. ගඳකිළි පිරිවෙන (බුදුන් වහන්සේ වැඩ සිටි කුටිය) දීඝ චංකමන පිරිවෙන (මිහිඳු හිමියන් සක්මන් කළ ස්ථානයේ සෑදූ කුටිය) ඵලග්ග පිරිවෙන (සමවත් සුවයෙන් සක්මන් කළ කුටිය) මෙවැනි යෙදුම්වලින් ඉහත කී කරුණු සනාථ වේ. විහාරය තුළ ම වෙන වෙන ම සැකසූ පවුරු

ආදියෙන් වෙන් වූ සංඝාවාස පිරිවෙන නමින් හඳුන්වා ඇති ආකාරය ද පැරණි පොතපත විමසන විට පෙනෙන කරුණකි. පසුකාලීන ව ශාසනික අධ්‍යාපනය මුල් කරගත් ආයතන හැඳින්වීම සඳහා පිරිවෙන යන නම ව්‍යවහාර කළ ආකාරය පෙනේ. පිරිවෙන යන්න අද වන විට හුදු ආගමික අධ්‍යාපන ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වනු දැකිය හැකි ය.

භික්ෂූන් වහන්සේලා සිය ආරාම තුළ පවත්වාගෙන යනු ලබන පිරිවෙන විශේෂ අධ්‍යාපන ආයතනයකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේද යන ත්‍රිවිධ සාසනයේ පැවැත්ම හා පෝෂණය තහවුරු කරලීම පිණිස ධර්ම විනය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට පුහුණු කරන ලද්දේ මෙහි ය. විශාල විහාරාරාම තුළ පවත්වාගෙන යනු ලැබූ පිරිවෙන් මහා විහාර නමින් හඳුන්වා ඇත. නාලන්දා, වික්‍රමශිලා ආදී විශ්වවිද්‍යාලයන් ද මහා විහාර නමින් හඳුන්වා තිබීමෙන් මෙය තහවුරුවේ. පාහියන් වාර්තාවල සෑගිරියේ භික්ෂූන් 2000ක් ද මහා විහාරයේ භික්ෂූන් 3000ක් ද අභයගිරියේ භික්ෂූන් 5000 ක් ද සිටි බව සඳහන් ය. මේ අනුව මුල් යුගයේ පිරිවෙන විශාල භික්ෂු පිරිසක් අධ්‍යාපනය ලැබූ මහා විහාරයක් වූ බව සැලකිය හැකි ය. ලක්දිව පළමු පිරිවෙන වන්නේ දේවානම් පැතිස් රජු විසින් තනවන ලද කාලප්‍රාසාද පිරිවෙනයි. ග්‍රන්ථාකාර පිරිවෙන, පධානඝර පිරිවෙන, මයුරපාද පිරිවෙන ආදී පිරිවෙන් දෙවන පැතිස් රජ සමයේ ආරම්භ කරන ලදි. සිතුල්පව්ව, තිස්සමහාරාමය, මුතියංගනය, කැළණිය වැනි ඈත ප්‍රදේශවල ද මේ යුගයේ සිට පිරිවෙන් ආරම්භ කෙරිණි.

රට පුරා අධ්‍යාපනය ක්‍රමයෙන් ව්‍යාප්ත වූ ආකාරය මෙයින් පැහැදිලි ය. පිරිවෙන් අධ්‍යාපනයේ මූලික අරමුණ ත්‍රිපිටක ඥානයෙන් හා භාෂා ඥානයෙන් භික්ෂූන් වහන්සේලා පෝෂණය කිරීම වුව ද ගිහි අධ්‍යාපනයේ පෙරගමන්කරුවා ලෙස ද පිරිවෙන ක්‍රියා කරයි. ධාතුසේන කුමාර කථාව, සංඝබෝධි විස්තරය, වෝහාරික තිස්ස රජු දේව නම් මහතෙර කෙනෙකුන්ගෙන් ත්‍රිපිටක ධර්මය ඉගෙන ගත් බවට සඳහන් වන කරුණු ආදියෙන් ගිහි අධ්‍යාපනයට පිරිවෙන මග පෑදූ බවට හොඳ නිදසුන් ය. පිරිවෙන් අධ්‍යාපනය වර්ධනය වීමත් සමග පොදු සමාජයේ අධ්‍යාපනය වර්ධනය වූ ආකාරය පෙනේ. නිදසුන් ලෙස සීගිරි ගී ලියූවන් අතර ගොවියන්ද, වෙළෙන්දන්ද, වහලුන් වැන්නෝ ද වූහ. වහලුන්ගේ පවා සාක්ෂරතාව මෙතරම් වර්ධනය වූයේ පිරිවෙන නිසා ය. විහාරස්ථානය මුල් කරගෙන ලැබුණු අධ්‍යාපනය සමස්ත සමාජය තුළ ම විශාල චර්යාමය වෙනස්කම් මෙන් ම ගුණාත්මක වර්ධනයකට ද මග පෑදූ බව මෙයින් පැහැදිලි ය.

අනුරාධපුර යුගයේ ඇරඹුණු පිරිවෙන ජන ජීවිතයට අවශ්‍ය ශාස්ත්‍ර, කලා ශිල්ප හා ගුණ දහම් ප්‍රගුණ කළ ආයතනයක් ලෙසින් ක්‍රියා කළේ ය. මිහින්තලා පිරිවෙන් පරිශ්‍රයේ සිදු කළ කැණීම්වලින් ලැබුණු තියුණු සැත්කම් සඳහා භාවිත කරනු ලබන වෛද්‍ය උපකරණ එකල වෛද්‍ය විද්‍යාව දියුණුව පැවැති බවට නිදසුන් සපයයි. බුද්ධදාස රජු වැනි වෛද්‍ය විශාරදයන් ද බිහිවන්නේ මේ අධ්‍යාපනය තුළිනි. සතුන්ට පවා ප්‍රතිකාර කිරීමත් සෑම ගමකට ම වෛද්‍යවරුන් පත් කිරීමත් සිදුවූයේ ද වෛද්‍ය ශාස්ත්‍රඥානය මෙන් ම පිරිවෙනෙහි ලැබුණු ගුණ දහම් පෝෂණය ද නිසයි. අනුරාධපුර යුගයෙන් පසු මූලායතන, අෂ්ඨායතන ආදී නම්වලින් හැඳින්වුණු පිරිවෙන් කෝට්ටේ යුගය දක්වා වර්ධනය වෙමින් පැවතිණි. විල්ගම්මුල මාහිමි, ධර්මසේන මාහිමි වැනි පඬිවරුන් බිහිවන්නේ ද ඉහත පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රතිඵල ලෙසිනි. ජන විඤ්ඤාණය වර්ධනය කිරීම සඳහා මේ පඬිවරුන්ගෙන් සිදු වූයේ අනුපමේය සේවයකි. කෝට්ටේ යුගය පිරිවෙන් අධ්‍යාපනයේ දියුණු ම අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. එකල කීර්තිමත් පිරිවෙන් ආයතන කිහිපයක් දක්නට ලැබිණි.

- තොටගමුවේ විජයබා පිරිවෙන
- කෑරගල පද්මාවතී පිරිවෙන
- වීදාගම සිරිසනානන්ද පිරිවෙන
- දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරිවෙන
- පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන

වැනි පිරිවෙන් නිසා කෝට්ටේ යුගයේ ඉතා දියුණු භාෂා සාහිත්‍යයක් දක්නට ලැබිණි. තොටගමුවේ රාහුල මාහිමි, වීදාගම මහා මෛත්‍රී හිමි, කෑරගල වනරතන හිමි වැනි වියත්හු පිරිසක් මේ යුගයේ පහළ වන්නේ පිරිවෙන් අධ්‍යාපනය දියුණු වූ නිසා ය. හංස සංදේශයෙහි එන කෑරගල පද්මාවතී පිරිවෙන් වැනුමත්, ගිරා සංදේශයේ එන තොටගමු විජයබා පිරිවෙන් වැනුමත් පිළිබඳ ව අවධානය යොමු කරන විට පැහැදිලි වන්නේ ත්‍රිපිටක අධ්‍යයනයට මුල් තැන ලැබීමත් භාෂා, ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර ශාස්ත්‍ර ආදී විෂයයන් ඉගැන් වූ බවත් ය. විදේශීය සිසුන් පවා ශාස්ත්‍රෝත්ග්‍රහණය කළ මෙවැනි පිරිවෙන් ආයතන විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපනයක් ලබාදුන් ආයතන වශයෙන් පැවතිණි.

කෝට්ටේ යුගය අවසන් වන්නේ බටහිර ජාතීන්ගේ බලපෑමත් සමගයි. බටහිර යුරෝපියානු ජාතීන්ගේ පැමිණීම නිසා මෙරට දේශපාලන

ස්ථාවරත්වය බිඳ වැටුණි. ඒ මත සමාජ ආර්ථික ක්‍රමයන් තුළ ද දුබලතා මතු විය. යුධ ගැටුම් වැඩි විය. මේ වාතාවරණය නිසා පිරිවෙන් අධ්‍යාපනය ද බිඳ වැටුණි. භික්ෂූන් වහන්සේලාට සිදු වූ විවිධ අතවර නිසා භික්ෂු ශාසනය ද පිරිහිණි. මහනුවර යුගයේ දී ගණින්නාන්සේලා අතට ශාසනයේ භාරකාරිත්වය පැවරිණි. පන්සලත් පිරිවෙනත් ඇසුරු කරගෙන මෙතෙක් අඛණ්ඩ ව පැවති අධ්‍යාපනය ද මේ නිසා ම බිඳ වැටුණි. මහනුවර රාජධානියේ මුල් යුගයේ (ක්‍රි.ව 1592 - 1706) මේ තත්ත්වය වඩාත් කැපී පෙනේ. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මා හිමියන් පහළ වන්නේ මේ යුගයේ දී ය. උන්වහන්සේ පිරිහී වැළලී ගිය ධර්ම අධ්‍යාපනයත් සඟ සසුනත් නැවත ඇති කරලීමට මහත් ආයාසයක් ගත්හ. විවිධ උගතුන් සොයාගෙන ගොස් පාලි භාෂාව ඉගෙන ගත් උන්වහන්සේ නියමකන්දේ පිරිවෙන ආරම්භ කොට තම ශිෂ්‍ය භික්ෂූන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කටයුතු කළහ.

නැවතත් ධර්ම ශාස්ත්‍රයේ දියුණුවක් ඇතිවීමට මෙය රුකුලක් විය. නියමකන්ද පිරිවෙනෙහි අධ්‍යාපනය ලද ගාල්ලේ මේධංකර නම් තෙරණු කෙනෙකුන් විසින් පැල්මඩුල්ල පුරාණ විහාරයේ ඇති කළ පිරිවෙනෙහි අධ්‍යාපනය ලැබූ වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන් විසින් 1841 දී රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙන ආරම්භ කෙරිණි. නූතන යුගයේ පැරණිතම පිරිවෙන ලෙස හැඳින්විය හැකි එහි අධ්‍යාපනය ලද හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියෝ 1873 දී මරදානේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළහ. එහි ම අධ්‍යාපනය ලද රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමියන් විසින් 1875 දී විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කෙරිණි. ප්‍රාචීන භාෂා උගන්වන විද්‍යාලයක් ලෙස විද්‍යෝදය පිරිවෙනට 1878 දී රු 600ක් රජයෙන් ආධාර ලැබිණි. ඒ අනුව රජයේ ආධාර ලැබූ ප්‍රථම පිරිවෙන විද්‍යෝදය පිරිවෙනයි. විද්‍යාලංකාර පිරිවෙන රජයෙන් ලැබුණු ආධාර ප්‍රතික්ෂේප කොට ස්වාධීන ආයතනයක් ලෙස පවත්වා ගෙන යන ලදි. නූතන පිරිවෙන් අධ්‍යාපනයේ දියුණුව සඳහා පරමධම්ම චේතිය පිරිවෙන මෙන් ම විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් මගින් විශාල මෙහෙයක් සිදු විය. මෑත කාලීන උගතුන් බොහෝමයක් එම ආයතනවලින් පුහුණුව ලද අයයි. 1959 දී විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත් කිරීමෙන් වඩා පුළුල් සේවයක් සිදුවිය.



විද්‍යෝදය පිරිවෙන - මරදන

1880 දී ඕල්කට්තුමාගේ මුලිකත්වයෙන් අරඹන ලද පරම විඥානාර්ථ සමාගමත් එහි කටයුතු කළ අනගාරික ධර්මපාලතුමන් විසින් ඇති කළ මහා බෝධි සංගමය නිසා බෞද්ධ අධ්‍යාපනයට ගිහි පැවිදි විශාල පිරිසකගේ උනන්දුවත් සහයෝගයත් ලැබිණි. එය ද පිරිවෙන් අධ්‍යාපනයේ උන්නතියට බල පෑ වැදගත් කරුණකි.

ප්‍රාචීන භාෂා අධ්‍යාපනයේ ඇති වී තිබුණ විෂමතා හා දුබලතා පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස 1902 අධ්‍යාපන අධ්‍යක්ෂ මහාචාර්ය බාරොස් මහතා විසින් පරිවෙණාධිපතිවරුන් රැස්වීමක් සඳහා කැඳවන ලදී. එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස 1902 ජූලි 24 දින ප්‍රාචීන භාෂෝපකාර සංගමය ආරම්භ කරන ලදි. සිංහල, පාලි, සංස්කෘත යන ප්‍රාචීන භාෂා ඉගෙන ගත් භික්ෂූන් වහන්සේලා රැසක් සමාජය පුරා දක්නට ලැබෙන්නේ මෙම සමාගමේ කාර්යභාරය නිසා ය. පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ ප්‍රාචීන පඬිවරුන් හේතුවෙන් සමාජය තුළ විශාල පරිවර්තනයක් සිදු වූ බව පෙනේ.

පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ උනන්දුව වැඩි වනවිට රට පුරා පිරිවෙන් ආයතන බිහිවීම ආරම්භ විය. විශේෂයෙන් 1956 ස්වභාෂා පණත නිසා සිංහල භාෂාවට ලැබුණු පිළිගැනීම හේතු කොටගෙන පිරිවෙන් අධ්‍යාපනයේ ද විශාල දියුණුවක් ඇති විය. මෙලෙස ඇරඹුණු පිරිවෙන් ආයතනවල පාලනය පිණිසත් අධ්‍යාපන කටයුතු ක්‍රමවත් කිරීම පිණිසත් 1970 වර්ෂයේ කොමිසමක් පත් කෙරිණි. එහි නිර්දේශ මත 1979 අංක 74 දරණ පාර්ලිමේන්තු පණත සම්මත විය. 1980 වගන්ති 35 කින් සමන්විත පිරිවෙන් නියෝග මාලාවක් ද සකස් කෙරිණි. වත්මන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වෙන්නේ මේ නීති රෙගුලාසි යටතේ ය.

පිරිවෙන් අධ්‍යාපනයේ මුලික අරමුණ වන්නේ විනයධර ධර්මධර භික්ෂූන් වහන්සේ නමක් බිහි කරගැනීමයි. බුදුදහමත් ප්‍රාචීන භාෂාත් ඉගෙනීමට කැමති ගිහි පිරිමි දරුවන් සඳහා පිරිවෙනෙහි අවස්ථාව ලැබේ. පිරිවෙන තුළින් ධර්ම ශාස්ත්‍ර අධ්‍යාපනයත් ශික්ෂණයත් ලැබේ. එසේ ම පිරිවෙන පවතින්නේ විහාරස්ථානයක වන බැවින් ඉන් ලැබෙන සංවරය මනා පෞරුෂ වර්ධනයකට මග පෑදේ. නූතන පිරිවෙන් තුළ ඉංග්‍රීසි භාෂාවට ද විශේෂ තැනක් ලැබී ඇත. එබැවින් දෙස් විදෙස් ධර්ම ප්‍රචාරක කටයුතුවල දී තරුණ භික්ෂූන් වහන්සේට විශාල වැදගත්කමක් ලැබී ඇත. නූතන සමාජයේ ආකල්ප වර්ධනයටත් උසස් පෞරුෂ ලක්ෂණ ගොඩනැංවීමටත් පිරිවෙනෙන් ලැබෙනුයේ විශාල දායකත්වයකි.

වර්තමාන ලංකාවේ පිරිවෙන් 720කට අධික සංඛ්‍යාවක් පවතී. මේවා ප්‍රධාන වශයෙන් කොටස් 3ක් යටතේ ක්‍රියාත්මක වෙයි.

1. මූලික පිරිවෙන
2. මහ පිරිවෙන
3. විද්‍යායතන පිරිවෙන

පිරිවෙන් අධ්‍යාපන රටාව පහත සඳහන් පරිදි සකස් වී තිබේ.

| පිරිවෙන් වර්ගය | ශිෂ්‍ය කණ්ඩායම් | ඉගැන්වෙන කාලය | ඉගැන්වෙන පාඨමාලාව |
|---|---|---|---|
| මූලික පිරිවෙන | ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි සිසුන් | මූලික වර්ෂ 5ක කාලයක් හෝ (මූ. පි. අවසානය) තෙක් | මූලික පිරිවෙන් පාඨමාලාව (සාම්ප්‍රදායිකව පිරිවෙන් විෂය මාලාවට අදාළ මූලික දැනුම හා විනය නීතිරීති අනුව භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම) |
| මහ පිරිවෙන | මූලික පිරිවෙන් සිසුන්, මූලික පිරිවෙන් අවසන් කළ පැවිදි /ගිහි සිසුන් සහ ඊට සමාන සුදුසුකම් ඇති සිසුන් | • මූලික පිරිවෙන් අවසානය දක්වා<br>• ප්‍රාචීන ප්‍රාරම්භයේ සිට අවසානය දක්වා<br>• අ.පො.ස. (උ.පෙළ) දක්වා<br>•වි. වි. උපාධිය දක්වා | •මූලික පිරිවෙන් පාඨමාලාව<br>•ප්‍රාචීන විභාග පාඨමාලාව<br>•අ.පො.ස (උ.පෙළ) හා විශ්ව විද්‍යාල විභාගවලට සිසුන් පුහුණු කිරීම |
| විද්‍යායතන පිරිවෙන | • ප්‍රාචීන විභාගය සඳහා සිසුන්<br>• අ.පො.ස (සා.පෙළ)(උ.පෙළ) විශ්ව විද්‍යාල උපාධි පාඨමාලා හදාරන පැවිදි හා ගිහි පිරිමි සිසුන් | •ප්‍රාචීන විභාගය දක්වා<br>6-11පාසල් ශ්‍රේණි<br>•අ.පො.ස. (සා.පෙළ) (උ. පෙළ) වි.වි. උපාධි පාඨමාලා අවසානය දක්වා | •ප්‍රාචීන විභාග පාඨමාලාව<br>•අ.පො.ස. (සා. පෙළ) (උ.පෙළ) (විද්‍යා, කලා, වාණිජ) හා විශ්වවිද්‍යාල විභාගවලට සිසුන් පුහුණු කිරීම<br>6-11පාසල් ශ්‍රේණි විෂය ධාරාව |

## 02 ක්‍රියාකාරකම

01. පැරණි ග්‍රාමීය සමාජයක් නූතන නාගරික සමාජයකින් වෙනස් වන්නේ කෙසේදැයි උදාහරණ මගින් ගෙනහැර දක්වන්න (උදාහරණ 5ක් වත් ඉදිරිපත් කළ යුතු ය).

02. පහත දැක්වෙන අදහස් ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් නම් කරන්න.

- පාලකයා දෙවියන්ගේ නියෝජිතයා ය. ...............................
- පැරණි සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාවයේ පැවතුණි. ...............................
- පාලකයාගේ නීතිය දෙවියන්ගේ තීන්දුවයි. ...............................
- පැරණි සමාජය අසංවිධානාත්මක වූවකි. ...............................
- පැරණි ආගමික සංකල්ප මිනිසුන්ගේ තාර්කිකත්වය දුර්වල කර තිබුණි. ...............................
- ධනවාදය තුළ ධනපතියා විසින් නිර්ධනයා පීඩනයට පත් කරනු ලබන බව .............................
- පරිණාමයට භාජනය වීම නිසා නවීන නාගරික සමාජයක් බිහිවන බව ...............................

03. I. සමාජ පරිණාමය පිළිබඳ කරුණු දක්වන බෞද්ධ සූත්‍ර ධර්ම මොනවා ද?

II. ''මුල් ම ජීවිහු ප්‍රභාවත් ශරීරවලින් යුක්ත වූහ''. යන ප්‍රකාශය ඇතුළත් සූත්‍රය නම් කර එම ප්‍රභාවත් ශරීර වෙනස් වූ ආකාරය (ජීවීන්ගේ වෙනස්වීම සිදුවූ ආකාරය) පැහැදිලි කරන්න.

04. බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වීමේ අවශ්‍යතාව, සමාජ විද්‍යාත්මකව පැහැදිලි කරන්න.

05. කෙටි සටහන් ලියන්න

I වැවයි දාගැබයි ගමයි පන්සලයි.

II අතීතයේ දී විහාරස්ථානය බහුකාර්ය ආයතනයකි.

III විහාරස්ථානය ඇසුරින් සිදුවන චර්යාමය වෙනස.

IV ජවන හංසයෙකු මෙන් නිවන කරා යා හැකි වන්නේ භික්ෂුවකට ය.

V හිංසනයෙන් තොර සමාජයක් බුදුදහම මගින් බිහිකරයි.

06. අනුරාධපුර යුගයේ හා කෝට්ටේ යුගයේ පැවති ප්‍රසිද්ධ පිරිවෙන් ආයතන 5 බැගින් ලියා දක්වන්න.

07. "කෝට්ටේ යුගයෙන් පසු භික්ෂු අධ්‍යාපනය" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

# 03 සංස්කෘතිය



## 3.1. සංස්කෘතිය (Culture) හඳුන්වාදීම

**'සංස්කෘතිය'** යන වචනය හොඳ නරක යන තේරුම දුන්න ද මානව විද්‍යාවේත්, සමාජ විද්‍යාවේත් එය විද්‍යාත්මක අර්ථයෙන් හඳුන්වා දී තිබේ. සංස්කෘතික පදනමකින් තොර ව ගොඩනැගුණු සමාජයක්, මානව ආචාර ධර්මයන්ගෙන් තොර අපචාරී සමාජයක් වෙනවා පමණක් නොව එවන් පිරිසකට කිසියම් ක්‍රමානුකූල රටාවකට අනුව මානව චර්යා ඉදිරිපත් කළ නොහැකි ය. එයට හේතුව සමාජයක පවත්නා පොදු සිතුම් පැතුම් වලට ගැලපෙන ආකාරයට ජීවත් වීමට ශිෂ්ටාචාරගත නොවීමයි. පොදුවේ සලකා බැලුවහොත් සංස්කෘතිය යනු එක්තරා අන්දමක හැඩ ගැසීමකි. තව ද මිනිස් චර්ගයා පාලනය කරන, මෙහෙයවනු ලබන ප්‍රධාන බලවේගය ද සංස්කෘතිය වීමයි. මේ පිළිබඳ ව විවිධ සමාජ හා මානව විද්‍යාඥයින් නිර්වචන එකසිය හැටපහක් පමණ ඉදිරිපත්කර ඇත.

ඒ අතරින් 1871 දී බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා වන ඊ.බී. ටයිලර් **(E.B. Tylor)** ඉදිරිපත් කළ නිර්වචනය ප්‍රධානත්වයෙහි ලා සැළකෙයි. ඔහුට අනුව සංස්කෘතිය යනු ''යම් කෙනෙකු සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ලබා ගන්නා දැනුම, විශ්වාස, කලාව, සාරධර්ම, නීතිය, සිරිත් හා වෙනත් පුරුදු වල එකතුවයි''.

රැල්ෆ් ලින්ටන් **(Ralph Linton)** පවසන්නේ "මිනිසා පරපුරෙන් පරපුරට දයාදයක් වශයෙන් ගෙනයන ජීවන රටා සමුදය සංස්කෘතිය" වශයෙනි.

තව ද ප්‍රකට සමාජ විද්‍යාඥයකු වන මැලිනොවුස්කි ට **(Malinoueski)** අනුව මිනිසාගේ "මනෝ කායික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ඇතිකර ගත් දෙය සංස්කෘතිය" යි.

රේමන්ඩ් විලියම්ස් (**Raymond Williams**) 1976දී සඳහන් කර ඇත්තේ සංස්කෘතිය යන වචනය ඉංග්‍රීසි භාෂාවේ තිබෙන ඉතා ම සංකීර්ණ වචන දෙක තුනෙන් එකක් බවයි. සමාජ විද්‍යාඥයන් විසින් මෙන් ම සාමාන්‍ය පුද්ගලයන් විසින් ද දිනපතා ම මෙම වචනය භාවිත කරනු ලැබේ. මිනිසා නිපදවන දේ හා කරන දේ සියල්ල ම සංස්කෘතියට අයත් ය. මිනිසාගේ

මැදිහත් වීමකින් තොර ව සිදු වන හෝ පවතින දේ සංස්කෘතියට අයත් නොවේ. ඒවා ස්වාභාවික ලෝකයට අයත් වේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන බලන විට සංස්කෘතිය යන්නට මානව සමාජය සතු ව තිබෙන සියලු ම සංකේත, සියලු ම ඉගෙන ගත් දේ සහ සියලු ම නිර්මාණ, කාලය හෝ ස්ථානය ගැන නො සලකා ඇතුළත් කළ හැකි ය.

නූතන සමාජ විද්‍යාඥයෝ සංස්කෘතිය යන්න සමාජ උරුමය ලෙස හඳුන්වති. සමාජ උරුමය යනුවෙන් ඔවුන් අදහස් කළේ පුද්ගලයා සතු ඥානය, විශ්වාසය, චාරිත්‍ර, කෞශල්‍යය යන ඒවායි. එමෙන් ම මෑතක දී සංස්කෘතිය යන්න පහත සඳහන් පරිදි විග්‍රහ කොට ඇත. පුද්ගලයාට තම පරම්පරාව මගින් දායාදය කොට දුන් භෞතික වස්තූන්ට ද සංස්කෘතිය යන නම යෙදීමට පුරුදුවීම මින් එකකි. අපේ පැරණි නගරවල නටඹුන් පැරණි සංස්කෘතියේ නෂ්ටාවශේෂ ලෙස හැඳින්විය හැකි ය. මේ විග්‍රහයට අනුව නූතන සමාජයේ සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ මිනිසාගේ විවිධ චර්යා, ආගමික හා කලා ශිල්ප පමණකි.

එමෙන් ම සංස්කෘතියෙන් තොරව සමාජයක් හෝ සමාජයකින් තොරව සංස්කෘතියක් හෝ නොපවතින බව ද මානව විද්‍යාඥයෝ ප්‍රකාශ කරති.

## 3.2. සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධය

සමාජයක් ගොඩනැගීම සඳහා පුද්ගලයන් සමූහයක් සිටිය යුතුය. මීට අමතර ව නිශ්චිත භූමියක් තිබීම, සංස්කෘතියක් පැවතීම, දේශපාලනික ස්වාධීනත්වයක් පැවතීම, ප්‍රජනන ක්‍රියාවලියක් පැවතීම අවශ්‍ය බව සමාජ විද්‍යාඥයින්ගේ අදහසයි. එයින් සුවිශේෂී කරුණක් වශයෙන් සංස්කෘතිය හැඳින්විය හැකි ය. සංස්කෘතියක් මගින් සිදු කරනු ලබන්නේ සමාජයේ ජීවත්වන මිනිසුන්ට පරම්පරාවෙන් පරම්පරාවට හුරුකරගත් හැසිරීම් රටාවක් හා ධර්මතා පද්ධතියක් හඳුන්වා දීමයි. සමාජයක් බිහිවීම සඳහා මෙවැනි කාරණා හේතු සාධක වන්නාසේ ම එම සමාජය පවත්වා ගෙන යෑමට යම් යම් සාධක අවශ්‍ය වේ. එයින් විශේෂ වූ සාධකය නම් සමාජයට අනුකූලවීමේ අවශ්‍යතාවයි. සමාජය විසින් අගයනු ලබන ආකල්ප, සාරධර්ම හා වටිනාකම්වලට අනුරූප වූ හැසිරීමක් පවත්වා ගැනීමයි. මෙම සමාජයට අනුකූලවීම සමාජානුයෝජනය නම් වේ. දෙමාපියන් පිළිගත් ධර්මතාවන් දරුවන් විසින් අභ්‍යන්තරීකරණය කර ගෙන හොඳ යහපත් සිතක් තනා ගැනීමේ ක්‍රියාවලිය **සමාජානුයෝජනය** නම් වේ.

මේ අනුව සංස්කෘතියක් මගින් ද සිදු කරනුයේ පරම්පරාවෙන් පරම්පරාවට හුරු පුරුදු කරගත් හැසිරීම් රටාවන් හා ධර්මතා හුරු කරවීමයි. එහි දී පවුල, පාසල, ස්වේච්ඡා සංවිධාන, ජනමාධ්‍ය හා මිත්‍ර කණ්ඩායම් මගින් විශේෂිත කාර්යයන් ඉටු කරනු ලබයි. මෙලොවට බිහිවන දරුවකු සමාජානුයෝජනය වීමේ දී සංස්කෘතිය මගින් ද ඉටු කරනු ලබන කාර්යය ඉමහත් ය. කුඩා බිළිඳා පළමු ව මවගේ උණුසුම හඳුනා ගනී. ඇගේ කටහඬ හඳුනා ගනී. මව්කිරි බීමෙන් පසු සුවසේ නිදා ගනී. දකින දෙය විමසිල්ලෙන් බැලීම, ඔබ මොබ දණ ගෑම යන කරුණු පවුල් සංස්ථාව තුළ දී දරුවා ලබන සමාජානුයෝජනයයි. කුඩා ළමයෙකුට දෙමාපියන්ගෙන් ලැබෙන ආදරය හා සෙනෙහස ඔහුගේ පෞරුෂත්ව වර්ධනය කෙරෙහි බෙහෙවින් බලපාන බව මනෝ විද්‍යාඥයින්ගේ මතයයි. පියාගේ මවගේ හැසිරීම් කතා බහ, ගති පැවතුම්, ආකල්ප අනුකරණය කොට ඒ තුළින් තම චර්යාවට යම් යම් සංස්කෘතික අංග එකතු කර ගැනීමට අනුකරණශීලී මනසක් සහිත දරුවා නිරතුරු ව සූදානමින් සිටීම ද පවුල තුළ දී ළමයා ලබන සමාජානුයෝජනයයි.

එමෙන් ම සමාජානුයෝජනය මගින් කුඩා කාලයේ දී ම සංස්කෘතික වටිනාකම් පවරා දීම සිදුවෙයි. ආහාර ගැනීමට පෙර අත් සේදීම, වැසිකිලි කැසිකිලි යෑමේ දී පිරිසිදු වීමට මෙහි දී ඉගෙන ගනී. දෙමාපියන් හා තම වැඩිමහල් සහෝදර සහෝදරියන් අඳින පළඳින ඇඳුම් ආදිය අනුකරණය කර දරුවා ඇඳුම් අඳින්නට පුරුදු වෙයි. දරුවා වැඩිහිටියෙකු බවට පත්වීමේ දී එම අගනා සංස්කෘතික වටිනාකම් තේරුම් ගනී. නිදසුනක් ලෙස බෞද්ධ දරුවකු පන්සලට ඇතුළුවන විට හිස්වැසුම් පාවහන් ගලවා යෑම, දෑත් නළලේ තබා බුදු පිළිම වහන්සේට වැඳීම ආදියට හුරු වෙයි. මෙසේ සමාජානුයෝජනයට ලක්වෙන කරුණු එම සංස්කෘතියේ අංග ලක්ෂණ බව පැහැදිලිව තේරුම්ගත හැකි ය. බෞද්ධ විහාරස්ථානවල වැඩ සිටින ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා සමඟ හැදෙන වැඩෙන කුඩා සාමණේරයන් වහන්සේලා පැවිදි සමාජයේ සංස්කෘතියට අනුව හැකියාවන් ඇතිකර ගනිති. ඒවා හුරු පුරුදු වෙති. එනම් අලුයම අවදී වී මළු පෙත්මං ඇමදීම, වන්දනාමාන කිරීම ආදී කටයුතු ද පාලි සංස්කෘත වැනි භාෂාවන් ඉගෙනීම ආදී පැවිදි ජීවිතයට අවශ්‍ය වන භූමිකාව හඳුනා ගැනීම සිදු කරයි. එසේ ම සිව්පසය පරිභෝජනය කිරීමේ දී ප්‍රත්‍යවේක්ෂා කිරීම වැනි ශාසනික පිළිවෙත් ද ඉගෙන ගනී.

මේ අනුව ගිහි සමාජයේ දරුවා පවුල් සංස්ථාව තුළ දී ද සාමණේර හිමිවරු තම විහාරස්ථානය මගින් ද ඔවුනට අවශ්‍ය සංස්කෘතිය ඉගෙන ගනිති. පවුලේ සුවිශේෂ හැසිරීම් රටාවන්ට හැදෙන වැඩෙන දරුවා මහා සමාජයේ පොදු හැසිරීම් රටාවට අනුගත කිරීමට පාසල ක්‍රියාත්මක වේ. සමාජය තුළ ක්‍රියාත්මක වන සංස්කෘතියේ බොහෝ අංග හඳුනා ගැනීමට ද ඒවා අනුව චර්යාව හැඩ ගස්වා ගැනීමට ද විවිධ සංස්කෘතීන්ගෙන් උපසංස්කෘතීන්ගෙන් පැමිණෙන සාමාජිකයින් සමඟ ක්‍රියා කිරීමට ද දරුවාට පාසලේ දී අවස්ථාව සැලසේ. එය දරුවන්ගේ සමාජානුයෝජනයෙහිලා වැදගත් අවස්ථාවකි. හැකියාවන් හා දක්ෂතාවන් අනුව දරුවන් ඇගයීමට ලක්වීම පාසලේ ප්‍රධාන ලක්ෂණයකි. එමගින් පුද්ගලයා සමාජයට අනුයෝජනය වූ උදාර පුරවැසියෙකු බවට පත්කර ගත හැකිය. එසේ ම සම වයස් කණ්ඩායමක සමාන සිතුම් පැතුම් මධ්‍යයේ දරුවා කායික ව පමණක් නොව මානුෂීය අතින් ද මුහුකුරා යයි. පිළිගැනීම, වගකීම් දැරීම, මූලිකත්වය ගැනීම වැනි ගුණාංග පංති කාමරය තුළ දී ඔහුගේ දෛනික ජීවිතයට හුරුවේ.

දරුවාට පවුල් සංස්ථාව තුළින් ලබා ගැනීමට නොහැකි ව මඟ හැරෙන සංස්කෘතික කරුණු දරුවන් ඉගෙන කියා ගන්නේ අනෙකුත් ආයතන සමූහ ආශ්‍රයෙන් ය. සම වයස් කණ්ඩායම් මෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පවුල තුළ දී ඉගෙන ගත් දේවල් පිළිබඳ ව මෙන් ම ඉගෙන ගැනීමට නොලැබෙන දේවල් සම්බන්ධයෙන් ද යම් අවබෝධයක් ලබා ගැනීමට චර්යාව හැඩ ගස්වා ගැනීමට සම වයස් කණ්ඩායම් නොයෙක් ආකාරයෙන් දායක වේ. සංස්කෘතික හා සමාජ දැනුම ලබා ගැනීමේ මූලාශ්‍රයක් ලෙස සම වයස් කණ්ඩායම් ක්‍රියාත්මක වේ. සංස්කෘතියේ පවතින්නා වූ අගනාකම් (Values) හා ධර්මතාවන්ට (Norms) අනුව හැසිරීමට නවක සාමාජිකයෝ පුරුදු වෙති. සාමාන්‍ය සමාජය තුළ පවත්නා අගනාකම් ධර්මතාවන් විවිධ සංස්කෘතික අංග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සම වයස් කණ්ඩායම්වලින් ලැබෙන උපකාරය ඉමහත් ය.

ජන සන්නිවේදන මාධ්‍යයන් ද දරුවෙකු සමාජගත කිරීමේ දී මහත් වූ කාර්යභාරයක් ඉටු කරයි. ගුවන්විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය, චිත්‍රපටි, වේදිකා නාට්‍ය, වීදි නාට්‍ය මගින් ද තමා අවට ලෝකයේ ක්‍රියාත්මක සංස්කෘතිය හඳුනා ගනී. දෙමාපියන් ඇතුළු වැඩිහිටියන්ගෙන් දැන කියා ගත නොහැකි බොහෝ දේ ඔවුන් තේරුම් ගන්නේ සම වයස් කණ්ඩායම්

මත යැපීමෙන් හා ජනසන්නිවේදන මාධ්‍යයන් මඟිනි.

මේ කරුණු පිළිබඳ ව අධ්‍යයනය කරන විට සංස්කෘතිය හා සමාජානුයෝජනය වෙන් වෙන් ව හැඳෑරීම තරමක් අපහසු බව පැහැදිලි ය. තමා ජීවත්වන සමාජ හෝ සංස්කෘතික වටිනාකම්, උරුමයන් පරම්පරාවට පවරා දීම සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සිදු කරනු ලබන කාර්යයකි.

## 3.3. බුදුදහමින් දයාද වූ ගති ලක්ෂණ මත සිංහල සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පත් වූ ආකාරය

ශ්‍රී ලංකාව බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ බෞද්ධ රාජ්‍යයක් බවට පත් වූයේ ධර්මාශෝක රජතුමාගේ ධර්ම දූත සේවාව නිසා ය. මිහිඳු මහ රහතන් වහන්සේ වෙතින් ලැබුණු එම තිළිණය ලාංකික සමාජය ආලෝකමත් කිරීමට හේතු විය.

ප්‍රාග් බෞද්ධ මහින්ද යුගයේ ලංකාවේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාසයන් ද ඈත අතීතයේ සිට ඉන්දියාවෙන් ලැබුණු ඒවා ය. ක්‍රි.පූ. 06 වැනි සියවසේ විජය කුමරු ඇතුළු පිරිස තම්බපණ්ණියට ගොඩ බැසීමත්, ඉන් පසුව ද විවිධ කොටස් පැමිණීමත් මගින් පෙන්නුම් කරන්නේ ඉන්දියාවේ බලපෑම නිරන්තරයෙන් සිදු වූ බව ය.

ඈත අතීතයේ සිට ම ඉන්දියාවෙන් ලංකාවට දේශපාලන බලපෑම් හා ආගමික බලපෑම් ඇති විය. එයට ප්‍රධාන හේතුව අසල්වැසි මහා රාජ්‍යය කුඩා රාජ්‍යයකට කරන බලය පතුරුවාලීමේ දේශපාලන ක්‍රියාදාමයයි. ශ්‍රී ලංකාවේ මුල් ම ජනාවාස බිහි කළේ ද ඉන්දියාවෙන් පැමිණි ආර්යයන් විසිනි. ඔවුහු දැදුරු ඔයේ සිට වලවේ ගඟ දක්වා ගංගා නිම්න ඇසුරු කරගෙන ශිෂ්ටාචාරය බිහි කළහ. ලංකාව වටා ගොඩබිමට ළඟා විය හැකි ස්වභාවික වරායන් පිහිටා තිබුණි. මහාතිත්ථ, ජම්බුකෝළ පට්ටන, කළ්‍යාණතිත්ථ, ගෝකණ්ණතිත්ථ යන තොටුපොලවල් එයින් ප්‍රමුඛ ඒවා විය.

මහින්දාගමනයට පෙර ද ශ්‍රී ලංකාද්වීපයට බුදුරජාණන් වහන්සේ තෙවරක් වැඩම කොට තිබුණි. එනම් මහියංගනය, නාගදීපය, කැළණිය යන ස්ථානවලට ය. එහෙත් බෞද්ධ සංස්කෘතියක් ස්ථාපිත නොවී ය. එකල ආදිවාසින්ගේ ආගමික විශ්වාස බෙහෙවින් සංකීර්ණ ව පැවතුණ බව මහාවංශයේ දැක්වෙන ලිඛිත සාක්ෂිවලින් තහවුරු වේ.

උදාහරණ ලෙස බ්‍රාහ්මණ, නිගණ්ඨ, ශ්‍රමණ, ආජීවක වැනි ආගමික කොටස්වල ජනතාවගේ අනුග්‍රහය ලැබූහ. එකල ජෝතිය, ගිරි යන නිගණ්ඨාශ්‍රම සාදා තිබුණි. මේ හැර චිත්තරාජ, කාලවේල, වලවාමුඛී, පශ්චිම රාජිනි වැනි යක්ෂ යක්ෂණියන් ද වැඳුම් පිදුම් ලැබූහ. ඔවුහු, තම ඥාතීන් මිය යාමෙන් පසු යක්‍ෂ නාග ආදීන් ලෙස උප්පත්තිය ලබන බව විශ්වාස කළහ. මළවුන් පිදීම ඒ විශ්වාසය මත ආරම්භ වන්නට ඇත.

එමෙන් ම ඔවුහු ඉර හඳ, ග්‍රහවස්තූන්, තාරකා, ජලය, ගින්න, වෘක්ෂ, කඳු, පර්වත වැනි ස්වභාවික වස්තූන්ට දේවත්වය ආරෝපණය කොට තම බිය පක්ෂපාතීත්වය දැක්වූහ. විවිධ බිලි පූජා සිදුකළහ. මිනිසා ලෝකයේ ඇදහිලි නිර්මාණය කළේ මුලින් ම තමා බියට පත් වූ විට හා ස්වභාවික විපත් උවදුරුවලින් බේරී සිටීමට ය.

මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකා ගමන සිදුවූයේ ක්‍රි.පූ. 03 වන සියවසේ දී ය. අශෝක රජතුමා විසින් තම ධර්ම දූත සේවාව මගින් බලාපොරොත්තු වූයේ බුදුදහම පැතිරවීමත් රටවැසියන් ආර්ථික වශයෙන් සුඛිත මුදිත කිරීමත් ය. දේවානම්පියතිස්ස රජුට මිහින්තලාවේ දී මුණ ගැසෙන මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු දූත පිරිස පිළිගත්තේ රාජකීය ආරාධිත අමුත්තන් ලෙසින් ය.

එයට හේතු වූ තවත් කරුණක් වූයේ ශ්‍රී ලංකාවට සමීපතම අසල්වැසි ඉන්දීය අධිරාජ්‍යයේ මහා බලවත් ධර්මාශෝක රජතුමා විසින් මෙම පිරිස පිටත් කර එවීම ය. අසිරිමත් ගුරුවරයෙකු ලෙස මිහිඳු මහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජු අමතා තම අරමුණු ඉටු කරගන්නේ අඹ ප්‍රශ්නය හා ඥාති ප්‍රශ්නය විමසා බැලීමෙනි.


මිහිඳු මහරහතන් වහන්සේ
ලංකාවට වැඩමවීම

ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල රහතුන් වහන්සේලා සමග සුමනසාමණේරයන් මෙන් ම භණ්ඩුක උපාසකයා ද පැමිණි අතර රජතුමාට පහසුවෙන් ම අවබෝධ කරගැනීමට මිහිඳු හිමියන්ගේ භණ්ඩුක නම් සත් හැවිරිදි උපාසකතුමා පැවිදි කර පෙන්වූහ. ගිහි සාමාජිකයන් හිස මුඩු කොට පැවිදි සමාජයට එකතුවන බව තහවුරු කිරීම එමගින් සිදු විය.

දේවානම්පියතිස්ස රජතුමා ඇතුළු මැති ඇමතිවරුන් ද බිසෝවරුන් ද තෙරුවන් සරණ ගොස් බෞද්ධ උපාසක උපාසිකාවන් බවට පත්වීමත්, බෞද්ධාගම රාජ්‍ය ආගම බවට පත්වීමත් සිංහල සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය දක්වා ප්‍රසාරණය වීමට ප්‍රබල සාධක විය. ශ්‍රී මහා බෝධින් වහන්සේ ලංකාවට වැඩමවන අවස්ථාවේ සංඝමිත්තාවන් සමග දහ අට වැදෑරුම් ශිල්ප කුලයන් පැමිණි අතර ඉන්දීය ශිල්ප ක්‍රම එමගින් ලංකාවට දයාද විය.

කුඹල් කර්මාන්තය, පේෂ කර්මාන්තය, වාරි කර්මාන්තය, ආයුධ කර්මාන්තය, වෛද්‍ය කර්මය ආදිය ඉන් ප්‍රමුඛ කිහිපයකි. මෙම ප්‍රවේණි කුල ක්‍රමය බටහිර යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමයට කිසිසේත් ම සමාන නොවන අතර භාණ්ඩ නිෂ්පාදනය කළේ වෙළඳාමට නොව අත්‍යවශ්‍ය සේවාවන් ලෙස හුවමාරු ක්‍රමයක් වශයෙන් පමණි.

බුදුදහම කුල භේදය නො පිළිගන්නා අතර පැරණි බමුණු කුලය බිඳ වැටුණේ ද බෞද්ධ ඉගැන්වීම් නිසා ය. එසේ ම බුදු දහමේ ඉගැන්වීම් තුළින් සැම දෙනාට ම සමාන ව මිනිස් අයිතිවාසිකම් ලබා දුන්නේ ය. පුද්ගලයා උසස් පහත් වන්නේ ජාතියෙන් නොව හොඳ නරක සිදු කිරීමෙන් බව **"න ජච්චා වසලො හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණෝ"** වශයෙන් පෙන්වා දුන්හ. මෙබඳු සමාජ දර්ශනයක් තුළ සමගිය, පරාර්ථකාමී බව, කළගුණ දැක්වීම, හිතමිතුරු බව, අවිහිංසාව ප්‍රධාන ඉගැන්වීම් බවට පත්විය. ශ්‍රී ලංකාව ධර්මද්වීපයක් කිරීමේ දී බෞද්ධ ප්‍රතිපත්ති මත සකස් වූ පදනමක් රාජ්‍ය අනුග්‍රහය මත ඇති විය.

මහින්දාගමනයෙන් පසු ලැබුණු වාරි තාක්ෂණය නිසා කෘෂිකර්මාන්තයෙන් මෙරට සමෘද්ධිමත් විය. මහා වෙහෙර විහාර ඉදි කිරීමත් සමග "වැවයි. දාගැබයි" යන සංකල්පය ගමේ ජීවනාලිය විය. ඉහත සංකල්පයට අනුව ගොඩනැගුණු බෞද්ධ පූජනීය ස්ථාන අතිශයින් සුන්දර විය.

රජතුමා රට වැසියන් මෙන් ම සතා සිව්පාවා, ගහකොළ, ඇළදොළ, ගංගා ආදී සොබාදහම පවා ආරක්ෂා කිරීමට ක්‍රියා කළේ ය. සියල්ලන්ට ම හිතානුකම්පී වූ පරිසර හිතකාමී ජීව හිතකාමී බුදුදහම නිසා ශ්‍රී ලංකාවේ පරිසරය සමතුලිත විය.

භික්ෂූන් වහන්සේ ජාතියේ මුර දේවතා ව විය. විහාරස්ථානය ආගමික මෙන් ම අධ්‍යාපනික මධ්‍යස්ථානය බවට ද පත් විය. රජුන් තනන්නා ද රජුන් නෙරපන්නා ද භික්ෂූන් වහන්සේලා ම වූහ. බෞද්ධ රජවරු පඤ්ච

ශීල ප්‍රතිපත්තිය, දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු පිළිපදිමින් ධාර්මික රාජ්‍ය පාලනයක් ගෙන ගියහ.



හේමමාලා දන්ත කුමරු

කළිඟු රට සිට හේමමාලා කුමරිය හා දන්ත කුමරු යන රාජකීයයන් විසින් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයට වැඩමවීමත් සමග දන්ත ධාතූන් වහන්සේ ආරක්ෂා කිරීම, දිනපතා පුද පූජා පැවැත්වීම, ශ්‍රී ලංකා රාජ්‍ය සේසතින් දළදා වහන්සේට පූජා කිරීම සිදුවිය. පාලකයා අනිවාර්යෙන් ම බෞද්ධයකු විය යුතු ය.

ගජබා රජතුමාගේ කාලයේ දළදා පෙරහැර, පොසොන් උත්සවය, කඨින පූජෝත්සවය වැනි උත්සවයන් ආරම්භ විය. අස්වැන්න නෙළා ගැනීමෙන් පසුව ලබන නිදහසේ සතුට භුක්ති වින්දේ ප්‍රීති උත්සව පැවැත්වීමෙන් ය. බෞද්ධ සංස්කෘතික පදනමින් ආරම්භ වූ මෙම උත්සව වූයේ ගම්මඩු නැටීම, වන්දනා ගමන් යෑම, දන් පිං කිරීම, ඇසළ පෙරහැර පැවැත්වීම, ආවාහ විවාහ මංගල කටයුතු සිදුකිරීම ආදියයි. ආගමික කටයුතු ඉතා ම සතුට ගෙන දෙන්නක් විය. සිංහල සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පත්වීමේ දී බොහෝ ප්‍රාථමික ඇදහිලි විශ්වාසයන්ට නව අර්ථකථන ලැබිණි.

උදාහරණ ලෙස ශ්‍රී මහා බෝධිය වැඩමවීමත් සමග ම වෘක්ෂ වන්දනාව බෝධිපූජාව දක්වා ද ගිනි දෙවියන් පිදීම ආලෝක පූජාව දක්වා ද කඳු පර්වත පිදීම සමනල කන්දේ ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීම හා රුවන්වැලිසෑය වැනි චෛත්‍යයන් වන්දනා කිරීම දක්වා ද මළවුන් පිදීම මියගිය අයට පිංපෙත් පැමිණවීම දක්වා ද බිලි පූජා පැවැත්වීම සතුන්ට ජීවිත දානය දීම දක්වා ද වෙනස්වීම දැක්විය හැකි ය.

බුදු දහමින් පෝෂිත වූ ලක් වැසියෝ සියලු ම සත්ව ප්‍රජාව වෙත මෙත් සිත් පැතිර වූහ. පරහිතකාමී බව මෙන් ම සහජීවනය පෙන්නුම් කළහ. නිදසුන් ලෙස සෙවණ දෙන ගස් මග දෙපස සිටුවීම, විඩාව සංසිඳුවා ගැනීමට මල් වතු, පලතුරු වතු හා උයන් වතු සෑදීම, පැන් පොකුණු පිංතාලි මග දෙපස සකස්කර තිබීම, රාත්‍රියේ නවාතැන් ගැනීම සඳහා අම්බලම් ඉදිකිරීම යනාදිය පෙන්වා දිය හැකි ය.

එකල පළතුරු ගසේ උඩ ම අත්ත සතුන්ට වෙන් කෙරිණි. කුඹුරේ ලියද්දක් කුරුලු පාලුව ලෙස වෙන් කළේ ය. වියළි දේශගුණයක් සහිත අනුරාධපුරය හා පොළොන්නරුව වැනි ප්‍රදේශවල විශාල වැව් අමුණු ද සකස් කළේ පරිසරය සිසිල් කිරීමට ය. මිනිසාට මෙන් ම සතා සිව්පාවටද ජීවත්වීම පහසුකිරීමට ය. මෙම චින්තනය ජීව හිතකාමී හා පරිසර හිතකාමී වූ අතර ගොවිතැන් කිරීමේ දී සතුන් විනාශ නොකර දේශීය කෙම් ක්‍රම භාවිතයට නැඹුරු විය.

පහන් වැටි දැල්වීම, දුම් ගැසීම, දිය ටොක්ක, ටකය ගැසීම, පැල් කවි කීම මෙන් ම හඬ නගා ශබ්ද කිරීම මගින් සතුන් බිය ගන්වා පළවා හැරීම සිදුවිය. මෛත්‍රිය හා කරුණාව මුල් කරගත් බෞද්ධයෝ අවිහිංසාවාදීහු වූහ. තෙරුවන් වන්දනාමාන කිරීමෙන් දෛනික කටයුතු සුපුරුදු ලෙස ආරම්භ කිරීම ඔවුහු චාරිත්‍රයක් කරගත්හ.

අලුයම බුද්ධ වන්දනාවෙන් දවස ආරම්භ කළ ඔවුහු සවස තෙල් මල් රැගෙන පන්සලට යෑමෙන් දිනය අවසන් කළහ. සවස විඩාව සංසිඳුවා ගත්තේ බෞද්ධ කලානිර්මාණ තැනීමෙන් හා තෙරුවන් නැමදීමෙනි. උපත, ඉඳුල් කට ගෑම, අකුරු කියවීම, විවාහය, දරු එල ලැබීම යන අවස්ථා බෞද්ධ චාරිත්‍රානුකූල ව කිරීමෙන් ආශීර්වාදය ලබාගත්තේ ය. පරිසරය හා සමාජය බෞද්ධ සංස්කෘතියේ ම කොටසක් ලෙස පිළිගැනීම සාමුහික බවේ සංකේතය ලෙස සඳහන් කළ හැකි ය.

## 3.4. ලංකා සමාජයේ පවතින අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ මූලික තුලනාත්මක විමසුමක්

ශ්‍රී ලාංකික ජන සමාජය සකස් වී තිබෙන්නේ බහු ජාතික බහු ආගමික බහු සංස්කෘතික සම්මිශ්‍රණයකිණි. මෙම ලාංකික විවිධත්වය අන්‍යෝන්‍ය වශයෙන් සංස්කෘතීන් පෝෂණය වීමට හේතු වී ඇත. ක්‍රි.පූ. 03 වැනි සියවසේ දී සිදු වූ ඓතිහාසික සිදුවීම වූයේ බුදුදහම මත පදනම් වූ අලුත් ශිෂ්ටාචාරයක් බිහිවීම ය. බුදුදහම ආගමික සහජීවනය මත පදනම් වූ දර්ශනයකි. ආගම්වලට බලහත්කාරයෙන් හරවා ගැනීමේ උපායමාර්ග කිසිවිටෙකත් අපේක්ෂා නොකරයි. මේ නිසා ශ්‍රී ලංකාවේ අන්‍යාගමික ඇදහිලි විශ්වාස දෙස උපේක්ෂාවෙන් බලයි.

ශ්‍රී ලංකාවේ බහුතර ජනතාව සිංහල බෞද්ධයෝ වෙති. ද්‍රවිඩ, හින්දු ක්‍රිස්තියානි, ඉස්ලාම් බැතිමතුන්හු ද වෙති. මෙම ප්‍රධාන ආගම් හා ජන වර්ග තුනට ම අනන්‍ය වූ උපසංස්කෘතීන් තිබේ. ඔවුහු ශ්‍රී ලංකාවේ පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා ද නැගෙනහිර සිට බස්නාහිර දක්වා

ද වාසය කරති. එම ප්‍රදේශවල ආගමික සිද්ධස්ථාන බොහොමයක් ඉදිකර තිබේ. ප්‍රධාන ආගමික උත්සව වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ද විශේෂ නිවාඩු ද ලබා දී ඇත. අධ්‍යාපන ආයතනවල, සියලු ජන කොටස් නියෝජනය වෙයි. රැකියා ආයතන මහජන නියෝජිතයින් සිටින දේශපාලන යාන්ත්‍රණය තුළ මෙන් ම ක්‍රීඩා කණ්ඩායම් තෝරාගැනීමේ දී ශ්‍රී ලාංකික පදනම දක්නට ලැබේ. බොහෝ ආගමික බැතිමත්තු බෞද්ධ, හින්දු පූජනීය ස්ථානවලට පැමිණෙති. ශ්‍රී දළදා මාලිගාව, කතරගම දේවාලය මෙහි දී ප්‍රධාන වේ. ශ්‍රී ලංකාවේ බහු ආගමික මධ්‍යස්ථාන වශයෙන් කතරගම පුදබිම, ගම්පොල අම්බුලුවාව දැක්විය හැකිය. එක ම ස්ථානයක විහාර මන්දිරය, පල්ලිය, කෝවිල හා දේවස්ථානය දක්නට ලැබෙන අතර ඒ ඒ ආගමික බැතිමතුන් ආගමික පුදසිරිත්වල නියැලීම එහිදී දැකිය හැකි ය.

| ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සංයුතිය | |
|---|---|
| සිංහල | 74.9% |
| ශ්‍රී ලංකා දෙමළ | 11.2% |
| ඉන්දියානු දෙමළ | 4.2% |
| ශ්‍රී ලංකා යෝනක | 9.2% |
| බර්ගර් | 0.2% |
| මැලේ | 0.2% |
| වෙනත් | 0.1% |

| ශ්‍රී ලංකාවේ ආගමික සංයුතිය | |
|---|---|
| බෞද්ධ | 70.2% |
| හින්දු | 12.6% |
| ඉස්ලාම් | 9.7% |
| රෝමානු කතෝලික | 6.1% |
| වෙනත් ක්‍රිස්තියානි | 1.3% |
| වෙනත් | 0.1% |

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව2012

## හින්දු ආගම

ලෝකයේ ම පැරණි ම ආගම හින්දු ආගමයි. ලංකාවට හින්දු ආගම පැමිණියේ ක්‍රි.පු. 03 වන සියවසටත් පෙර සිට ය. ඉන්දියාවෙන් ලද දායාදයක් වන හින්දු ආගමික ඇදහිලි අනුරාධපුර යුගයේ තිබුණු බවට සද්ධර්මාලංකාරය සාක්ෂි දරයි. කෝට්ටේ යුගය වන විට බෞද්ධ සිද්ධ ස්ථානවල විෂ්ණු දේව රූප සඳහා වෙන ම ස්ථානයක් තිබිණි. කෝට්ටේ යුගයේ පිරිවෙන්වල වේද ශාස්ත්‍රය ඉගැන්වූ බව සඳහන් වේ. හින්දු ආගම බහු දේවවාදය පිළිගන්නා අතර බ්‍රහ්ම, විෂ්ණු, ශිව යන ත්‍රිමූර්තිය ප්‍රධාන වෙයි. ලංකාවේ ශිව ඇදහිල්ල හා විෂ්ණු දෙවියන් ඇදහීම ද සිදුකෙරේ. එමෙන් ම දෙවියන්ට කන්නලව් කිරීමට ද පඬුරු බැඳීම ද යාඥා කිරීම ද උපවාස කිරීම ද හින්දු භක්තිකයෝ සිදුකරති. කර්මය, පුනරුත්පත්තිය,

පිං පව් පිළිගනිති. දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම සිදු කරති. ලංකාවේ හින්දු සංස්කෘතියේ හිමිකරුවෝ දමිළ ජනතාව ය.

හින්දු ආගමික ඉගැන්වීම් අනුව අපරාධ කිරීම, හොරකම් කිරීම, පරදාර සේවනය කිරීම, මත් ද්‍රව්‍ය භාවිතය තහනම් වන අතර එමගින් සමාජ පාලනය සිදුවන බව මානව විද්‍යාඥයෝ ප්‍රකාශ කරති. හින්දු විශ්වාසයට අනුව දරුවකු ඉපදී දින 31කින් කෝවිලකට ගෙන ගොස් පූජා පවත්වයි. හින්දු ආශ්‍රම ධර්මවලට අනුව අවුරුදු 50 ඉක්ම වූ පසු වඩාත් දෙවියන්ට සමීප වෙති. සිත කය වචනය පිරිසිදු කරගෙන විමුක්තිය ලබාගැනීම ඉන් අදහස් කරති. හින්දු විශ්වාසයන්ට අනුව කෝවිලක් නැති ගමක ජීවත්වීම නුසුදුසු ය. මේ නිසා ශිව, ගනේෂ්, මුරුගා දෙවිවරුන්ගේ කෝවිලක් හින්දු ජනතාව වාසය කරන සෑම ප්‍රදේශයක ම දක්නට ලැබේ. හින්දුහු දැඩි ආගමික භක්තිකයෝ වෙති. උතුරේ සිට කතරගම දක්වා දුෂ්කර මග ගෙවා පැමිණ ගිනි පාගති, තියුණු කොකු ශරිරය පුරා ගසාගෙන දෙවියන්ට භක්තිය පුද කරති. හෝලි උත්සවය, වේල් උත්සවය පවත්වති. හින්දූන්ගේ ප්‍රධාන උත්සව තුනකි.

1. තෛපොංගල් උත්සවය
2. මහා ශිවරාත්‍රී උත්සවය
3. දීපාවාලි උත්සවය  ඉන් ප්‍රධාන වේ.

මහනුවර ඇසළ පෙරහැරට සතර මහා දේවාලවලින් පැමිණෙන කාවාඩි නැටුම් සිත් සතන් ප්‍රබෝධමත් කරයි. එමෙන් ම භජන් ගීතිකා එක සේ රස විඳිය හැකි ය. I වැනි රාජසිංහ රජතුමා කලක් හින්දුභක්තිකයෙකු වූ බව පැවසේ. හින්දු හා බෞද්ධ සංස්කෘතීන් අතර ආගමික සහජීවනයක් ද පවතී. ආනන්ද කුමාරස්වාමි වියතාණන් බෞද්ධ කලා ශිල්ප කෘතිය රචනා කර ඇත. ලක්ෂ්මන් කදිරගාමර් මහතා වෙසක් උත්සවය ජාත්‍යන්තර නිවාඩු දිනයක් බවට පත්කිරීමට විශාල මෙහෙයක් කළේ ය.

හින්දු ධර්මය අනුව කුල ක්‍රමය පිළිගනී. බ්‍රාහ්මණ වංශය උසස් ම කුලයයි. ලංකාවේ වෙල්ලාල කුලය ඉහල ම කුලයයි. පහළ ම කුල වන්නේ කෝඩියාර් කුලය හා තලවාර් කුලයයි. ඉන්දීය දෙමළ වතු කම්කරුවන් 5.1% වන අතර ශ්‍රී ලාංකික දෙමළ ජනතාව 4.3 % කි. වෙල්ලාල කුලය ට අයත් දෙමළ ජනයා ව ලන්දේසීන් විසින් දුම් කොළ වගාව සඳහා ගෙන එන ලදී. ඉංග්‍රීසින් විසින් දකුණු ඉන්දියාවෙන් උඩරට වතු වගාවට කම්කරුවන්

ලෙස ද්‍රවිඩ පිරිස ගෙනාවේ ය. ද්‍රවිඩ ජනතාව හින්දු, කතෝලික, බෞද්ධ වශයෙන් දක්නට පුළුවන. ඔවුන් අතර සමජාතීය ආවාහ විවාහ සහ වෙනත් ජාතීන් සමග සිදුවන ආවාහ විවාහ කටයුතු ද දක්නට ලැබේ.

## ඉස්ලාම් ආගම

ලෝකයේ වැඩි ම ආගමික අනුගාමිකයින් සිටින්නේ ඉස්ලාම් ආගමට ය. ඔවුන් මුස්ලිම් ජාතිකයෝ ය. ශ්‍රී ලංකාවට මුස්ලිම්වරු පැමිණියේ අරාබිකරයේ සිට සේද මාවත ඔස්සේ වෙළඳාම් කිරීමට ය. දෙමළ භාෂාව කථා කරන මොවුන් ඉස්ලාම් ආගමික කටයුතු කරන්නේ අරාබි භාෂාවෙන් ය. ඒක දේවවාදය අනුව අල්ලා එක ම මැවුම්කරුවා ය. අල්කුරාණය එක ම ආගමික ග්‍රන්ථය වන අතර, අනාගත වක්තෘවරයා මුහම්මද් නබි නායකතුමා ය.

අල්ලා දෙවියන් විශ්වාස කිරීම දිනකට 05 වරක් යාඥා කිරීම හෙවත් සලාතය, ඇති අය නැති අයට උදව් උපකාර කිරීම හෙවත් සකාතය, රාමසාන් මාසයේ උපවාසය කිරීම, හජ්ජි වන්දනාවේ ගොස් නබිතුමා උපන් මක්කම වැඳ පුදා ගැනීම ප්‍රධාන ඉගැන්වීම් ය. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනගහනය 7.9%කි. නැගෙනහිර, බස්නාහිර, මධ්‍යම වැනි පළාත්වල මොවුන් වැඩි ප්‍රතිශතයකින් යුක්ත ය. ඉස්ලාම් ඉගැන්වීම් අනුව පිං පව්, ස්වර්ගය, අපාය ඔවුහු විශ්වාස කරති. සිත, කය, වචනය හොඳ විය යුතු බව එම ධර්මයෙහි ඉගැන්වේ. දන් පිං කිරීමේ දී එය දෙවියන් වහන්සේගේ නාමයෙන් පමණක් ම කළ යුතුය. අවුරුදු 04ත් 10ත් අතර ළමුන් උදෙසා සිකුරාදා හැර දින 06 ක්ම පැය 02 බැගින් ඉස්ලාම් ධර්මය මුස්ලිම් දේවස්ථානයේ දී උගන්වයි.

මුස්ලිම් ජාතිකයින්ගේ ප්‍රධාන ජීවනෝපාය වෙළඳාම් කිරීමයි. ඔවුහු කෘෂිකාර්මික කටයුතු ද සිදුකරති. කෙනෙකු මිය ගොස් පැය 24ක් යාමට පෙර භූමදානය කිරීම සිදුවෙයි. ශ්‍රී ලංකා සමාජයේ යෝනක ජාතිකයෝ අන්‍යෝන්‍ය අන්තර් ආගමික සහයෝගීතාවයෙන් කටයුතු කරති. මොහිදින් බෙග් "සුවදේ මට සීතල සුළඟ පවා හිමි බුදුවුණ බුද්ධගයාවේ" වැනි බෞද්ධ ගීත ගායනා කළ අතර අල්හාජ් නියාස් මවුලවි තුමා, අන්තර් ආගමික සහයෝගීතාව ඇති කිරීමට මෑත කාලයේ පුරෝගාමී ව කටයුතු කරන අයෙකි.

## ක්‍රිස්තියානි ආගම

බටහිර යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ක්‍රිස්තියානි

ආගම පැමිණියේ ක්‍රි.ව. 1505 දී පෘතුගාලයේ සිට පෘතුගීසීන් පැමිණීමත් සමග ය. මොවුහු බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගම් ඇදහීම තහනම් කළ අතර භික්ෂූන් වහන්සේලා හා අන්‍යාගමික වෙනත් පූජකවරු බලහත්කාරයෙන් උපැවිදි කරවූහ. නැතහොත් ඝාතනය කර දැමූහ. ක්‍රිස්තියානි ආගම ඒක දේවවාදී වන අතර දෙවියන් වහන්සේගේ එක ම නියෝජිතයා මෙන් ම අනාගත වක්තෘවරයා ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. බයිබලය ආගමික ග්‍රන්ථයයි. ලන්දේසීන් ඕලන්දයේ සිට මෙරටට පැමිණියේ ක්‍රි.ව. 1656 දී ය. මොවුහු රෙපරමාදු නිකාය මෙරට ව්‍යාප්ත කළෝ ය. පෘතුගීසීන්ගේ රෝමානු කතෝලික පල්ලි විනාශ කළ අතර ඔවුන් මරා දමන ලදී. රෝම ලන්දේසි නීතිය ක්‍රියාත්මක කළ අතර කුරුඳු වගාව මෙරටට හඳුන්වා දෙන ලදි. ඉංග්‍රීසීන් මෙරටට පැමිණෙන්නේ ක්‍රි.ව. 1796 දී ය. මොවුහු ක්‍රි .ව. 1815 වන විට ශ්‍රී ලංකාවේ ම බලය තහවුරු කරගත්හ. ලන්දේසීන් පලවා හැරියහ. රෙපරමාදු නිකාය තහනම් කළහ. ඇන්ග්ලිකන් නිකාය ව්‍යාප්ත කෙරිණි. කතෝලික පල්ලිය මුල් කරගෙන අධ්‍යාපනය ව්‍යාප්ත විය.

දේවස්ථානය මුල් කරගෙන මංගල අවමංගල චාරිත්‍ර සිදු කළ අතර දරුවකු ඉපදී දින 15කින් බෞතීස්ම කරන ලදි. සෑම ක්‍රිස්තියානුවෙකු ම ඉරිදා දේව මංගල්‍යයට සහභාගිවිය යුතු ය. ක්‍රිස්තියානි ආගමික ඉගැන්වීම්වල මූලධර්ම 10ක් ඇත. දස පනත නමින් එය හැඳින්වේ. ආගමික ජීවිතයක අන්තර්ගතය මානව ගුණ ධර්ම ජීවිතයට එකතු කිරීමට මග පෙන්වයි. එකම දෙවියන් වහන්සේට වන්දනාමාන කිරීම, සොරකම් නොකිරීම, වැරදි කාම සේවනයෙන් වැලකී සිටීම, අසල්වැසියාට ප්‍රේම කිරීම, මුනිවරු පිදීම, නත්තල් දින තෑගි බෙදා දීම යනාදිය වේ. ශ්‍රී ලංකාවේ මහා සංස්කෘතිය තුළ ඇති උප සංස්කෘතීන් අතර අන්තර් ආගමික සංහිඳියාවක් දක්නට පුළුවන. අර්නස්ට් පෝරුතොට පියතුමා, මර්සලින් ජයකොඩි පියතුමා ආදීහු බෞද්ධයින්ගේ ගෞරවයට පාත්‍ර වූහ.

## 03 ක්‍රියාකාරකම

01. "සංස්කෘතිය" යන්නට ඉදිරිපත් වී ඇති නිර්වචන (ඔබේ පුස්තකාලයේ වෙනත් පොත්පත් සඟරා ඇසුරින් ) 5ක් එකතු කරන්න.

02. "වැඩිහිටියන් විසින් කුඩා දරුවන්ට සංස්කෘතිය පවරා දිය යුතුය" මෙය සිදු කරන්නේ කෙසේ ද?

03. "සිංහල සංස්කෘතිය" සහ "සිංහල බෞද්ධ සංස්කෘතිය" යන මාතෘකාව යටතේ ළමා පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

04. ශ්‍රී ලංකාවේ වෙසෙන විවිධ ජන කොටස් හා ඔවුන්ගේ ආගම් ලැයිස්තු ගත කරන්න.

05. " හින්දු විශ්වාසයන්ට අනුව කෝවිලක් නැති ගමක ජීවත් වීම නුසුදුසු ය" මෙයින් කියවෙන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

06. කෙටි පිළිතුරු ලියන්න.

I. මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන ආගම කුමක් ද?

II. ඔවුන්ගේ ආගමේ ප්‍රධාන ඉගැන්වීම් මොනවා ද?

III. ශ්‍රී ලංකාවට ක්‍රිස්තියානි ආගමේ සම්ප්‍රාප්තිය සිදුවන්නේ කෙසේ ද?

IIV. පන්සලේ පියතුමා ලෙස විරුදාවලි ලද කතෝලික පූජකවරයා කවුරුන් ද?

07. I. ක්‍රිස්තියානි ආගම ලංකාව පුරා ව්‍යාප්ත වූ ආකාරය විස්තර කරන්න.

II. දස පනතින් උගන්වන්නේ මොනවා ද?

# 04 පුද්ගලයා හා සමාජය

## 4.1. පුද්ගලයා හා සමාජය අතර පවතින සම්බන්ධතාවය

පුද්ගලයා වශයෙන් අප හඳුන්වන්නේ මම, ඔබ, නැත්නම් විවිධ නම් වශයෙන් හඳුන්වා ගන්නා අයයි. පුද්ගලයාගෙන් තොරව සමාජයක් ගැන සාකච්ඡා කළ නොහැක. පුද්ගලයා සමාජයක සිටින කුඩා ම ඒකක යයි. එවැනි කුඩා ඒකක අතර සම්බන්ධතා නැත්නම් පුද්ගලයින් රාශියක් සිටි පමණින් සමාජයක් ලෙස හැඳින්විය නොහැක. උදාහරණයක් ලෙස දුම්රියේ ගමන් කරන මිනිස්සු තමන්ට අවශ්‍ය දුම්රිය පොළවලින් බැස යති. නමුත් දුම්රියේ සිටින මිනිසුන් සමාජයක් ලෙස හඳුන්වන්නේ නැත. ඔවුන් සමූහයකි. සමාජයක තිබිය යුතු මූලික ලක්ෂණ කීපයක් ඇත. එනම් සමාජයක් යනු ගොඩනැගෙන නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ සමාජ අන්තර් ක්‍රියා ඇසුරින් අන්‍යෝන්‍යය සබඳතා මත ඇතිවන පුද්ගල එකතුවක් වේ. වර්තමානයේ ද ලෝකයේ මිනිසුන් නොමැති දූපත් දක්නට ඇත. නමුත් අපි ඒවා සමාජ ලෙස හඳුන්වන්නේ නැත. භූමියක මිනිසුන් සිටි පමණින් ද සමාජයක් වන්නේ ද නැත.

බොහෝ සත්තු ද සමූහ වශයෙන් ජීවත් වෙති. නමුත් සතුන්ට මිනිසුන්ට මෙන් සිතීමේ ශක්තියක් නොමැත. මිනිස්සු සිතීමේ ශක්තිය නිසා සමාජයේ සෙසු පුද්ගලයින් සමග හැසිරෙන ආකාරය තීරණය කරති. අපට තනි ව ජීවත්විය නොහැක. ඔබ අද දවස තුළ පුද්ගලයින් රාශියක් සමග සම්බන්ධතා පවත්වනවා ඇත. තම ගමේ දායක දායිකාවන් දෙමාපියන්, සහෝදර සහෝදරියන් හා වෙනත් ඥාතීන් ද ඊට අමතර ව අසල්වැසියන්, පිරිවෙනේ ගුරුභවතුන් හා ළමයින් ද සහෝදර භික්ෂූන් වහන්සේලා ද ආදී වශයෙනි. පුද්ගලයා මේ අය සමග සම්බන්ධතා පැවැත්වීමේ දී භාෂාව යොදාගන්නා අතර ඊට අමතර ව විවිධ සංකේත ද යොදා ගනී. මෙම සංකේතවලට ද සමාජය තේරුමක් ලබා දී ඇත. උදාහරණයක් ලෙස ඔබට කිසියම් තැනක සුදු කොඩියක් දැකිය හැකි ය. එවිට එක් වර ම සිහියට නැගෙන්නේ මරණයක් පිළිබඳවයි. මේ ආකාරයට සමාජය තුළ විවිධ සංකේතවලින් පණිවුඩ ලබාදීම සිදු වේ.

ශ්‍රී ලංකා සමාජය ගැන අවධානය යොමු කිරීමේ දී අවුරුදු 2500කටත් වඩා පැරණි ඉතිහාසයක් තිබෙන විජය රජු ප්‍රමුඛ ආර්යයන්ගෙන් පැවත

එන එකක් බව සඳහන් වේ.

සමාජය පුද්ගලයාට එම සමාජයේ පවතින හොඳ නරක හා වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ උගන්වයි. ඔබට ඔබේ දෙමව්පියන් විසින් කුඩා කල සිට ම කෑම කන ආකාරය, ඇඳුම් ඇඳීම, වැඩිහිටියන්ට ගරු කිරීම හා වෙනත් සිරිත් විරිත් යනාදිය උගන්වා ඇත. අද ඔබ ඒවාට අනුව ක්‍රියාකරන්නේ වැඩිහිටියන් විසින් ඔබට එම දැනුම ලබාදී ඇති නිසා ය. ඔබ ඉදිරියේ දී ඔබේ දරුවන්ට මෙම සංස්කෘතිකාංග පවරාදෙයි. මෙයින් පැහැදිලිවන්නේ වැඩිහිටි පරපුර විසින් ඊළඟ පරපුරේ සාමාජිකයින්ට එම සමාජයේ සංස්කෘතියට අනුකූල ව ජීවත් වන, හැසිරෙන ආකාරය උගන්වන බව ය. මෙය සමාජානුයෝජනය ලෙස හැඳින් වේ.

ඔබ ජීවත්වන ශ්‍රී ලාංකික සමාජයේ ජාති, ආගම්, කුල, නාගරික, ග්‍රාමීය, වතු යනාදී වශයෙන් මෙන් ම උඩරට, පහතරට වශයෙන් ද විවිධත්වයක් ඇත. මෙම විවිධත්වය තුළ භාෂාවේ, රැකියාවේ මෙන් ම හැසිරීම් රටාවේ ද විෂමතා දක්නට ලැබේ. නමුත් මේ සියලු දෙනා තමන්ට හිමි විවිධත්වය ආරක්ෂා කරගෙන ප්‍රධාන සමාජය වන ශ්‍රී ලංකා සමාජයේ සංස්කෘතියට අනුව හැසිරීම සිදුකරයි. මේ අනුව පුද්ගලයාගෙන් තොර සමාජයක් ගැන කතා කළ නොහැකිවා සේ ම සමාජයෙන් තොර පුද්ගලයෙක් පිළිබඳව ද කථා කළ නොහැකි ය. සමාජය ඉදිරියට ගමන් කිරීමේ දී අන්තර් පුද්ගල සබඳතා මූලික වේ.

සමාජානුයෝජනය නිසි ආකාරයට සිදුවීමේ දී පුද්ගලයෙකුට ආයතන කිහිපයක් ම වැදගත්වේ. පළමු ආයතනය පවුලයි. දෙමව්පියන් හා ලේ ඥාතීන්ගෙන් එම ආයතනය සමන්විත වේ. එහිදී අලුත උපන් දරුවා තම ජීවිතයේ මූලික දේ පවුල ඇසුරෙන් ඉගෙන ගනී. ඒ අනුව ආහාරපාන ගන්නා හැටි, ඇඳුම් පැළඳුම් භාවිතය, ඥාති සම්බන්ධතා ගරු කිරීම්, සිරිත් විරිත්, ආචාර ධර්ම, තම ආගමට අනුව හැඩගැසීම යනාදිය ඉගෙන ගනී. එමෙන් ම කිසියම් දුරකට පෞරුෂයක් ගොඩනගා ගැනීම සිදු කරයි. පවුලේ කාර්ය නිසි ආකාරයට සිදුවන තැන්වල දී ළමයින් හොඳින් සමාජානුයෝජනය වී මනා පෞරුෂයක් සහිත ව වර්ධනය වන අතර එසේ නොමැති අවස්ථාවල ළමයින් භින්න (බිඳුන) පෞරුෂයක් සහිත ව වැඩෙන බව දැකිය හැකි ය.

දෙවනුව ඉතා වැදගත් වන්නේ පෙර පාසල් හෝ විධිමත් අධ්‍යාපන ආයතනවලින් ලබා දෙන සමාජානුයෝජනයයි. දරුවා තම පවුල් සංස්ථාවෙන් පසු මුහුණ දෙන පළමු ආයතන මේවායි. අද ශ්‍රී ලංකාවේ සෑම ළමයෙකු

ම පාහේ පෙර පාසල් අධ්‍යාපනයට යොමු වේ. ඒ නිසා පෙර පාසලෙන් ලබා දෙන සමාජානුයෝජනය ඉතා ම වැදගත් ය. සම වයස් කණ්ඩායම් සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්න මෙහි දී ළමයින් ඉගෙන ගනී. එමෙන් ම විධිමත් අධ්‍යාපන ආයතනය වන පාසලෙන් විනය නීතී, වෙලාවට වැඩකිරීම, පිළිවෙළ, ආචාර ධර්ම, නායකත්වය, ජය පරාජය බාරගැනීමේ ශක්තිය, තර්කානුකුලභාවය වැනි දේ ඉගෙන ගනී. ළමා කාලයෙන් වැඩි කාලයක් පාසල් අධ්‍යාපනයෙන් සමාජානුයෝජනය ලබයි. මෙම සමාජානුයෝජන ක්‍රියාවලිය නතරවීමක් නොමැත. පාසල් අවධියෙන් පසුව ද සේවයෙහි නියැලෙන විවිධ ස්ථාන, ඔහු ජීවත්වන සමාජ වටපිටාවන් ඇසුරෙන් ද නිතර ම සමාජානුයෝජනය සිදු වේ. නමුත් මේ සියලු ම දේ රඳා පවතින්නේ ඔහු කුඩා කල පවුල, පාසල, පන්සල, වැනි ආයතනවලින් ලැබූ සමාජානුයෝජනය මතයි. තමා නියෝජනය කරන ආගමික ආයතනවලින් ළමයා සමානුයෝජනය වේ. බුදුදහමට අනුව සමාජානුයෝජනය වන ළමයා අවම වශයෙන් පංච ශීලය සමාදන් වී සමාජය තුළ යහපත් පුද්ගලයෙකු ලෙස ජීවත් වෙයි. අනෙක් ආගම්වල ද සමාජයට යහපත් ලෙස කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව උගන්වයි.

තව ද සමාජය ට බිහිවෙන පුද්ගලයෙකුට කිසියම් තත්ත්වයක් හිමි වේ. ගිහියෙක් ලෙස හෝ ආගමික පූජක වරයෙක් ලෙස එකිනෙකට වෙනස් තත්ත්ව දැකිය හැකි ය. එම තත්ත්වවලට හිමි කාර්යය කොටසක් සමාජය ඔහුගෙන් අපේක්ෂා කරයි. බෞද්ධ භික්ෂූන් වහන්සේගෙන් සමාජය බලාපොරොත්තු වන කාර්ය කොටසක් ඇත. එය නිසි ආකාරයට ඉටුවෙනවා නම් මිනිස්සු භික්ෂූන් වහන්සේට ගරු කරති. "අපේ හාමුදුරුවෝ" "අපේ පන්සල"වැනි වචනවලින් ආමන්ත්‍රණය කරති. එයින් පෙනී යන්නේ පන්සලේ හාමුදුරුවන්ගෙන් සමාජයට යහපත් සේවයක් වෙතැයි යන්න මිනිසුන්ගේ පිළිගැනීම බව ය. එමෙන් ම සමාජයේ එක් එක් පුද්ගලයා හැසිරිය යුතු ආකාරය පිළිබඳ කිසියම් පිළිගත් රටාවක් සමාජය අපේක්ෂා කරයි. ළමයෙක්, වැඩිහිටියෙක්, කාන්තාවක් යනා දී අය හැසිරිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව සමාජ සම්මතයක් ඇත. ඇඳුම් පැළඳුම්, භාෂා විලාසය, ක්‍රියාකාරකම් එකිනෙකාගෙන් බලාපොරොත්තුවන ආකාරය වෙනස් ය. භාෂාව ප්‍රිය මනාප ලෙස භාවිත කිරීමත් තවත් කෙනෙකුට කරදරයක් නොවන ආකාරයට හැසිරවීම තුළින් තමා සමාජයට යහපත් පුද්ගලයෙක් ය යන අදහස ලබා දෙයි. එසේ නොවන පිරිස් සමාජ සාරධර්මවලට පටහැනිව කටයුතු කරන පිරිසක් ලෙස හැඳින්විය හැකි ය.

## 4.2. සමාජය යනු කුමක් ද?

මේ වන විට "පුද්ගලයා හා සමාජය අතර පවත්නා සම්බන්ධතාව" යන මාතෘකාවෙන් ඔබට සමාජය පිළිබඳ මූලික අදහසක් දැනටමත් ලැබී ඇත. ඒ අනුව අපට සමාජය පිළිබඳ සරල නිර්වචනයක් ඉදිරිපත් කළ හැකි ය.

"නිශ්චිත භූමි ප්‍රදේශයක නිශ්චිත කාලයක ජීවත්වෙන මිනිසුන් විසින් අන්‍යෝන්‍ය බැඳීම් සමග ගොඩනගා ගන්නා සංස්කෘතිමය ඒකකය සමාජය" ලෙස හැඳින්විය හැකි ය.

මෙසේ සමාජය තේරුම් ගැනීමට උත්සාහකරන ආකාරයට ම අතීතයේ සිටි දාර්ශනිකයින් ද සමාජය තේරුම් ගැනීමට විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. එයින් සමාජ විද්‍යාඥයින් හා මානව විද්‍යාඥයින් සමාජය පිළිබඳ කර ඇති නිර්වචන වැදගත් වේ. ඒවා වර්තමානයේ තවදුරටත් භාවිත කෙරෙයි. අපි එදිනෙදා ජීවිතයේ දී පැරණි සමාජය, නවීන සමාජය, යනාදී වචන භාවිත කරමු. වැඩිහිටියෝ තරුණ කණ්ඩායම් පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමේ දී "දැන් හැදෙන සමාජය කිසිම වැඩකට නැහැ" "අපේ කාලෙ ඔහොම නැහැ" යනාදී යෙදුම් භාවිත කරති. මේ ආකාරයට සමාජය තුළ කලින් කලට ඇතිවන වෙනස අතීතයේ ද සමාජ විද්‍යාඥයන්ගේ අධ්‍යයනයට ලක් වී ඇත.

ලෝකයේ තිබෙන සමාජ වර්ග කිරීමට විවිධ සමාජ හා මානව විද්‍යාඥයින් උත්සාහ දරා ඇත. එම වර්ගීකරණයන්ට අනුව ප්‍රධාන සමාජ වර්ග තුනක් හඳුනාගෙන තිබේ. එනම් ගෝත්‍රික සමාජය, ගැමි සමාජය හා දියුණු කාර්මික සමාජය වශයෙනි. ගෝත්‍රික සමාජ යනු හුදකලාව අනෙකුත් සමාජවලින් බැහැර ව ජීවත්වන ආදී වාසී ජන කොටස් ය. ගැමි සමාජය යනු සරල කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන සරල දිවි පෙවතක් ඇති සමාජයයි.


දියුණු කාර්මික සමාජවල ජනයා නගරවල වාසය කරයි. ජපානය, සිංගප්පූරුව වැනි රටවල් දියුණු කාර්මික සමාජ ලෙස හැඳින්විය හැකි ය. එම සමාජවල ඉතා ම දියුණු තාක්ෂණයක් දක්නට ලැබේ. ඔවුහු විශ්වයේ සිදුවන වෙනස්වීම් තේරුම් ගැනීමට විද්‍යාව යොදාගනිති. නිදසුන් ලෙස ස්වභාව ධර්මයේ සිදුවන ව්‍යසනයන් ගැමි සමාජවල දී ආගමික ඉගැන්වීම් වලට අනුව විග්‍රහ කළත් දියුණු කාර්මික සමාජවල එය සිදුකරන්නේ විද්‍යාත්මක දැනුම පදනම් කරගෙන ය. මේ ආකාරයට නූතන ලෝකයේ පිළිගන්නා

ගෝත්‍රික සමාජය, ගැමි සමාජය හා කාර්මික සමාජ යන සමාජ ක්‍රම තුන අපට හඳුනාගත හැකි වේ.

## 4.3. සමාජයේ විවිධත්වය හා සංකීර්ණත්වය

සෑම සමාජයක් ම එක හා සමාන නැත. එක් එක් සමාජ එකකට එකක් වෙනස් වේ. එකම සමාජය තුළත් විවිධත්වයක් ඇත. ගෝත්‍රික සමාජයේ ප්‍රධාන ජීවනෝපාය දඩයම් කිරීම වන අතර සිංහල බෞද්ධ සමාජය සතුන් මැරීම පාප කර්මයක් ලෙස සලකයි. ඇස්කිමෝ සමාජයේ වයෝවෘද්ධ වැඩිහිටියන් මරාදැමීම දරුවන්ගේ යුතුකමක් ලෙස සලකයි. නමුත් ශ්‍රී ලංකා සමාජයේ වැඩිහිටියන්ට සැලකීම සමාජ යුතුකමකි. මේ අනුව අපට කිව හැක්කේ සමාජවලට විවිධත්වයක් ඇති බවය. එමෙන් ම එකම සමාජය තුළ ද විවිධත්වයක් ඇත. ගිහි සමාජය හා භික්ෂු සමාජය වශයෙන් වෙනස්කම් පවතී. ගිහි සමාජයේ පුද්ගලයින් හැසිරෙන ආකාරයට භික්ෂූන් වහන්සේලා නොහැසිරෙති. භික්ෂූන් වහන්සේලාගේ හැසිරීම සම්බන්ධයෙන් සාසනික සම්ප්‍රදායන් ඇත.

සමාජයක විවිධ ආයතන තිබේ. ඔබේ පවුල් ඒකකය, පන්සල, පාසල, රැකියා කරන ස්ථානය, පොලීසිය, අධිකරණය, බන්ධනාගාරය යනාදී වශයෙන් ආයතන රාශියක් ඇත. මේ එක් එක් ආයතනවලට අනෙක් ආයතන සම්බන්ධ වේ. එකකින් සිදුවන කාර්යය අනෙක් ආයතනයට වැදගත් වේ. පවුලක් තුළින් නිවැරදි ගුණධර්මවලට අනුව හැඩ නොගැසුණු ළමයා පාසල තුළ යහපත් හැසිරීමක් ඇති ළමයෙකුගේ තත්ත්වයට පත් නොවේ. අද බන්ධනාගාරවල සිටින බොහෝ දෙනා යහපත් පවුල් පසුබිමක් නැති, නිසි අධ්‍යාපනයක් නො ලැබූ පිරිස් ය. එමෙන් ම පන්සලට ගමේ දායකයින් අවශ්‍ය වේ. ඒ අනුව ගමේ පවුල් රාශියක් සමග භික්ෂූන් වහන්සේලා කටයුතු කරති. බෞද්ධ භික්ෂූන් වහන්සේ අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන අතර ගිහියන් විසින් භික්ෂූන් වහන්සේට සිව් පසයෙන් උපස්ථාන කරනු ලැබේ. මේ ආකාරයට අනෙකුත් ආගම්වල ද අනුශාසකත්වය ලබාදිය හැකි ය. සමාජයේ සෙසු ආයතන ද මෙලෙස අනෙකුත් ආයතනවලට සම්බන්ධ වේ. ඒ නිසා එක් එක් ආයතන සමග අන්තර් සම්බන්ධයක් පවතී. මේ තුළ කිසියම් සංකීර්ණත්වයක් ද දැකිය හැකි ය.




මේ එක් එක් ආයතනවලින් ඉටුවෙන නිශ්චිත කාර්යයන් ඇත. ඒවා නිසි ආකාරයට ඉටුවීමෙන් සමාජය යහපත් වේ. සමාජයක පවතින මෙම සංකීර්ණතාව නිසා "සමාජය යනු සංකීර්ණ දැල් රටාවක්" යනුවෙන් හඳුන්වයි.

## 4.4. බුදුදහමේ සමාජ සම්බන්ධතා පිළිබඳ දක්වන ආකල්පය

සමාජ සම්බන්ධතා වර්ධනය කරගැනීම තුළින් යහපත් පරහිතකාමී සමාජයක් ගොඩනගා ගෙන මෙලොව පරලොව දියුණුව උදාකර ගත හැකි ධර්මතා රාශියක් බුදුරජාණන් වහන්සේ තම මුළු ජීවිත කාලය තුළ දී ම විවිධ අවස්ථාවල දී දේශනා කර ඇත. ඒ අතර ඉතා ම වැදගත් යයි සැලකෙන ධර්මතා කිහිපයක් මෙසේ කෙටියෙන් සඳහන් කළ හැකි වේ.

- සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරය
- සිගාලෝවාද සූත්‍රයේ සතර සංග්‍රහ වස්තු
- සප්ත අපරිහානි ධර්ම සහ දසරාජ ධර්ම
- මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු
- පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීම දැක්වෙන කරුණු
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව පරලොව දියුණුවට හේතු වන කරුණු
- කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් විවිධ ධර්ම කරුණු
- කාලාම සූත්‍රයේ දැක්වෙන නිදහස් චින්තනය හා සම්බන්ධ ධර්ම කරුණු
- පංච ශීල ප්‍රතිපදාව

සිඟාලක ගෘහපති පුත්‍රයාට එක්තරා දිනක උදෑසන බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සදිසා නමස්කාරය අර්ථවත් ව සිදුකරන ලෙස ය. සිඟාලක පුත්‍රයා තම පියතුමන්ගේ අන්තිම උපදේශය පිළිගෙන අනවබෝධයෙන් සදිසාවන්ට නමස්කාර කළේ ය. ඒ වෙනුවට බුදුරජාණන්වහන්සේ මෙම සදිසාවන්ට සමාජයේ ප්‍රධාන ඒකක හයක් සම්බන්ධ කර දේශනා කළසේක. එයින් අදහස් කර තිබෙන්නේ එක් එක් සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය බැඳීම හා අවබෝධය තුළින් අර්ථවත් සදිසා වන්දනය කළ හැකි බවකි.

- නැගෙනහිර - මව්පියෝ
- දකුණ - ගුරුවරු
- බටහිර - අඹුදරුවෝ
- උතුර - මිතුරෝ
- යට - සේවකයෝ
- උඩ - පූජ්‍ය / පූජක ලෙස අර්ථ දක්වා ඇත.

එක් එක් සමාජ කණ්ඩායම් තමන්ගෙන් යුතුකම් ඉටු කළ යුතු බව දේශනා කරන අතර ඉන්පසු එම සමාජ කණ්ඩායමෙන් ඉටුවිය යුතු වගකීම් කීපයක් ද දක්වා ඇත. මේ ආකාරයට නිසි පරිදි සමාජ යුතුකම් හා වගකීම් සම්පූර්ණවීමත් සමග සමාජීය සම්බන්ධතා වර්ධනය වීමක් පෙන්නුම් කරන බව දක්නට ලැබේ.

සමස්ත සමාජයේ සෑම ඒකකයක් ම නියෝජනය වන පරිදි සදිසාවන්ට සමාජ ඒකක සම්බන්ධ කිරීම තුළින් මනා සමාජ සම්බන්ධතා සහිත සමාජ නිරායාසයෙන් ම ගොඩනැගෙන බවත් සදිසා නමස්කාරය අර්ථවත් වන බවත් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත.

සිඟාලක ගෘහපති පුත්‍රයාට දේශනා කළ සිඟාලෝවාද සූත්‍රයේ මව්පිය දූදරු සම්බන්ධයේ පටන් සමාජයේ පවතින සෑම අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ම පවත්වා ගත හැක්කේ ඔවුනොවුනට ක්‍රම හතරකින් කෙරෙන සංග්‍රහයන් නිසා ය. ඒ සතර සංග්‍රහ වස්තු නම්

i . දානය ii . ප්‍රියවචනය
iii . අර්ථචර්යාව iv. සමානාත්මතාව යි.

දානය යනු දීමයි. "ලෝභ" යන අකුසල් මූලය යටපත් කරගෙන නැති බැරි සෑම කෙනෙකුට ම සැලකීම හෙවත් දීම මෙයින් අර්ථවත් වෙයි. ඒ තුළින් පුද්ගලයාගේ චිත්ත සන්තානය තුළ පරිත්‍යාග ශීලීත්වය වර්ධනය වෙයි. සමාජයේ සෑම පුද්ගලයෙක් තුළ ම මෙම පරිත්‍යාගශීලීත්වය වර්ධනය වීමත් සමග සමාජ සම්බන්ධතාව දියුණු වෙයි.

පුද්ගලයෙකුට ඉතා ම පහසුවෙන් ම භාවිත කළ හැකි සංග්‍රහ ඒකකයක් ලෙස "ප්‍රියවචන" නම් කළ හැකි ය. ඒ සඳහා කිසිදු වැයවීමක් නැත, වෙහෙස වීමක් නැත, පුද්ගල චිත්ත සන්තානය ප්‍රබෝධමත් කරලීමට මහෝපකාරී වන ඒකකයක් ලෙස ප්‍රිය වචනය භාවිත කළ හැකි ය. "පොඩි හාමුදුරුවෝ " "ලොකු හාමුදුරුවෝ "" උපාසක මහත්තයා" "දායක මහත්තයා" "උපාසක අම්මා" ආදී වචන බෞද්ධ සමාජයට ඉතා ම ප්‍රිය වචන වෙයි. මෙය පන්සලෙන් ගමට ලබා දිය යුතු ඉතා ම වටිනා සංග්‍රහ ඒකකයක් ලෙස නම් කළ හැකි ය.

තව ද පුංචි හාමුදුරුවන් වහන්සේ නමකට නම පමණක් කියා ආමන්ත්‍රණය කිරීමට වඩා වැදගත් වන්නේ උන්වහන්සේගේ නමත් සමග (තමාට ගැළපෙන පරිදි) ආයුෂ්මතුන් වහන්සේ, පොඩි හාමුදුරුවෝ, ආදි වශයෙන් ආමන්ත්‍රණය කිරීමයි. එය අසන්නාට ප්‍රිය වෙයි. ඔහුගෙන් ද එවැනි යහපත් ප්‍රියවචන සම්භාරයක් ලැබේ. ඒ තුළින් සමීප සම්බන්ධතාවක් සමාජය තුළ ගොඩනැගේ.

අර්ථචර්යාවට ද එසේ ම ය. තම කටයුතු අර්ථවත් ව පවත්වාගෙන යාම මෙයින් අදහස් කරයි. අන්කෙනෙකුට එයින් බාධාවක් නොවන පරිදි කටයුතු කිරීම මෙයින් කියැවෙයි. තම දෛනික ජීවිතයේ දී සිදු කරන සෑම කටයුත්තක් ම සමාජ සේවයක් ලෙස සලකා කටයුතු කිරීම යහපත් අර්ථ චර්යාවක් වන බැවින් සමාජ සම්බන්ධතා ද මනාව වර්ධනය වෙයි.

සමානාත්මතාව බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දී දේශනා කර ඇත. තමාට අන් සියලු සමාජ කණ්ඩායම් සමාන කර කටයුතු කරන ලෙස උන්වහන්සේගේ දේශනාවයි. තව ද මේ පිළිබඳ ව පංච ශීල ප්‍රතිපදාවෙහි පළමු වැනි ශික්ෂා පදයෙන් ද දේශනා කර තිබේ. ධම්ම පදයේ විවිධ ගාථා පාඨ තුළින් ද වෙනත් සූත්‍රගත දේශනා තුළින් ද සමානාත්මතාවයේ අගය දේශනා කරයි. සමාජ සම්බන්ධතා වර්ධනය වීමට සමානාත්මතාව වැදගත් වන ආකාරය මේ තුළින් පැහැදිලි වේ.

සප්ත අපරිහානි ධර්ම, දසරාජ ධර්ම බුදුරජාණන් වහන්සේ අගය කළ ධර්මතාවන් ය. ලිච්ඡවී රජදරුවන්ගේ රාජ්‍ය පාලනයේ යහපත් ලක්ෂණ සහ අඛණ්ඩ පැවැත්ම මෙම අපරිහානි ධර්ම බවත් ඒ තුළින් සමාජ සම්බන්ධතා ද වර්ධනය වී තිබෙන බවත් උන්වහන්සේ අගය කළහ.

(1) නිතර රැස්වීම (2) සමගි ව රැස්වීම, සාමූහික ව කටයුතු කිරීම, සාමදානයෙන් විසිරී යාම (3) නොපැන වූ නීති නොපැන වීම, පැන වූ නීති කඩ නොකිරීම, පැරණි සම්ප්‍රදායන් අනුගමනය කිරීම (4) වැඩිහිටියන්ට ගරු කිරීම, ඔවුනොවුන්ගේ අදහස්වලට සවන් දීම (5) විවාහක අවිවාහක යන දෙපක්ෂයේ ම කාන්තාවන්ට කරදරයක් නොවන සේ කටයුතු කිරීම (6) වජ්ජීන්ගේ රට තුළ හා ඉන් පිටත පිහිටි පූජනීය ස්ථානවලට ඇප උපස්ථාන කිරීම (7) සියලු ම ආගමික පූජකයන්ට පහසුකම් සැලැස්වීම හා ඔවුන්ට ඇප උපස්ථාන කිරීම, යන මේවා අපරිහානි ධර්ම ලෙස දැක්විය හැකි ය.

දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම සහ විරුද්ධ නොවීම යන මෙම දස රාජ ධර්ම ආරක්ෂා කිරීමත් සමාජ සම්බන්ධතාවලට හේතුවන බව ප්‍රකාශ වෙයි.

මහා මංගල සූත්‍රයේ දැක්වෙන මංගල කරුණු තිස්අටම සමාජ සම්බන්ධතා තහවුරු වන ප්‍රධාන ධර්ම කරුණු බව දේශනා කර තිබේ. "මාතා පිතු උපට්ඨානං" "කාලේන ධම්ම සාකච්ඡා" "පණ්ඩිතානංච සේවනා" "පතිරූප දේස වාසෝච" "සමනානංච දස්සනං" සහ "පූජාච පූජනීයානං" ආදී ගාථා පාඨවලින් දැක්වෙන්නේ එම මංගල කරුණු කිහිපයකි. මෙසේ සමස්ත කරුණු තිස්අටම මනා සමාජ සම්බන්ධතා තහවුරු වන කරුණු බව අවධාරණය කළ හැකි වේ.

පරාභව සූත්‍රයේ දැක්වෙන්නේ පුද්ගලයා පිරිහීමට හේතුවන කරුණු දහඅටකි. එම කරුණුවලින් ඈත් වී කටයුතු කරන ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ. එම පිරිහීමේ කරුණු තුළ ඇලීගැලී නො සිටීම ද සමාජ සම්බන්ධතාවලට හේතුවන බව මෙයින් ගම්‍යය වේ. එයින් කීපයක් මෙසේ ය.

උට්ඨාන වීර්යය නැති බව, නිදන සුලු බව, අසත් පුරුෂයන්ට ප්‍රිය වීම, සත් පුරුෂයන් අප්‍රිය වීම සහ හැකියාව තිබියදීත් මහලු මව්පියන්ට නොසැලකීම ආදියයි. පිරිහීමට හේතු වන කරුණුවලින් ඈත් වී වෙසෙන්නාට සමාජ සම්බන්ධතා වර්ධනය කර ගත හැකි බව දේශනා කරයි.

ඉහතින් දක්වා ඇති සෙසු සූත්‍රගත ධර්ම කරුණු ද එකිනෙකක් ගැන විමසීමෙන් ද පැහැදිලි වන්නේ බුදු දහමේ සමාජ සම්බන්ධතා වර්ධනය කරගත හැකි ආකාරය පෙන්වා දෙන ස්වභාවයයි. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ද කරණීය මෙත්ත සූත්‍රයේ ද කාලාම සූත්‍රයේ ද ඉතා වැදගත් ධර්ම කරුණු ඇතුළත් වේ.

තව ද පංචශීල ප්‍රතිපදාව සමාජ සම්බන්ධතා වර්ධනය කරන්නකි. ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමින් වැළකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම, බොරුවෙන් වැළකීම සහ රහමෙර පානයෙන් වැළකීම ලෙස දක්වා ඇති මෙම ශික්ෂා පද පිළිගෙන ක්‍රියාවට නගන්නා තුළ සමාජ සාරධර්ම ආරක්ෂාවන බව දේශනා කර ඇත.

## 04 ක්‍රියාකාරකම

01. සමාජය යන්න සමාජ විද්‍යාත්මක අදහස් ඇසුරින් විස්තර කරන්න.
02. සමාජානුයෝජනය යනු කුමක් ද? එය සමාජයේ යහපැවැත්මට හේතුකාරක වන අයුරු සැකෙවින් දක්වන්න.
03. පුද්ගලයෙකු සමාජානුයෝජනය වන අවධි (අවස්ථා) පිළිවෙළින් දක්වන්න.
04. ගෝත්‍රික සමාජ, ගැමි සමාජවලින් වෙනස් වන්නේ කෙසේ ද? කරුණු දක්වන්න.
05. දියුණු කාර්මික රටවල සමාජය පිළිබඳ විස්තරයක් කරන්න?
06. "ගිහි සමාජීය කාර්යයන් සංකීර්ණ ය" හේතු දක්වන්න.
07. "සමාජයේ විවිධත්වය තුළ ඇත්තේ ඒකීයත්වයකි " සමාජයේ දැල් රටාවක් නිර්මාණය කරමින් ඉහත අදහස සනාථ කරන්න.
08. ප්‍රියවචන භාවිත කිරීම සමාජ සම්බන්ධතා වර්ධනය වීමට හේතු වන අයුරු පැහැදිලි කරන්න.

# 05 සමාජ පාලනය



## 5.1. සමාජ පාලනයක අවශ්‍යතාව

මානවයා සමාජ සත්ත්වයකු ලෙස ජීවත්වීමට හැඩගැසීමත් සමග මූලික අවශ්‍යතා සපුරාගැනීමේ දී පෞද්ගලිකත්වය අභිබවා පොදුවේ කාටත් පිළිගත හැකි එකඟතාවන් ගොඩනගා ගත්තේ ය. තම සමූහයේ බහුතර පිරිසකගේ අනුමැතිය ලත් චර්යාවන් ගොඩනගා ගැනීමටත් ඒවා පවත්වා ගැනීමටත් පැනනැගුණු එකඟතාව පදනම් ව සමාජ පාලනය යන සංකල්පය බිහි වූ බව පෙනේ. ස්වකීය සමූහයා තුළ පිළිගත් චර්යාවන් සමුදායක් සංගත ව පවත්වා ගැනීමටත් එයින් අපගමනය වීම වැළැක්වීමටත් මෙම සමාජ පාලනය නම් ක්‍රියාවලිය අතිශය වැදගත් වේ.

19 සියවසේ සිට ම සමාජ පාලනය පිළිබඳ ව වාද විවාද පවතී. සමාජ පාලනය නිරායාසික ක්‍රියාවලියක් ද නැතහොත් යම් බලවේගයක් විසින් මෙහෙයවන්නක් ද යන්න විමසීමට එහිදී උත්සාහ දරා ඇත. සරල සමාජවල පටන් සංකීර්ණ සමාජ දක්වා ම සමාජ පාලනයක් ක්‍රියාත්මක වේ. සමූහයක් වශයෙන් විවිධ කටයුතුවල නිරත වීමේ දී එකිනෙකා අතර එකඟතාවන්, පිළිගැනීම් මෙන් ම අවශ්‍යතා ඉටුවිය යුතු යුතුකම් සහ වගකීම් සමුදායක් පවතී. එහෙත් මේ සියල්ල සමතුලිත සුබනම්‍ය ලෙසට ඉටුවේ යැයි අපේක්ෂා කළ නොහැකි ය. මෙසේ අපේක්ෂිත චර්යාවලින් අපගමනයක් සිදුවීම නිසා විසංවිධානකාරී තත්ත්වයන් සමාජය තුළ උද්ගත වේ. මෙම විසංවිධානකාරී තත්ත්වයන් නිසා සමාජගත ඇතැම් සාමාජිකයන් අතර අනවබෝධය, අසහනය වැනි තත්ත්වයන් ගොඩනැගේ. මෙම විසංවිධානකාරී තත්ත්වයන් ගොඩනැගීම වැළැක්වීමටත් ගොඩනැගුණු තත්ත්වයන් සමනය කරගැනීමටත් සමාජ පාලනයක අවශ්‍යතාවක් පැන නගී.

කවර හෝ සමාජයක සමාජ පාලනය ක්‍රියාත්මක විය යුත්තේ සමාජ ප්‍රගතිය උදෙසා ය. එමගින් සාමාජිකයන් අතර සාමය, සංවර්ධනය ගොඩනැගේ. කිනම් හේතු මත හෝ සමාජයෙහි ප්‍රතිවිරෝධතා, ගැටුම්, අපරාධ, ආදිය ඇති වේ නම් එම සමාජයයෙහි ඉදිරි ගමන ඇන හිටී.

සාම්ප්‍රදායික සමාජයේ කුඩා සමූහ තුළ සමාජ පාලන ක්‍රියාවලිය ද සරල එකක් විය. ආවේණික සම්ප්‍රදායන් සමූහයක් අනුගමනය කිරීමට සමූහයේ සාමාජිකයන් අතර පොදු එකඟතාව ඇති කරවීමට වැඩිහිටියන් නිරන්තරව කටයුතු කිරීම එහි දී ප්‍රමාණවත් විය.

සමාජ පාලනය සිදුවන ප්‍රධාන ක්‍රම දෙකකි.

1. අවිධිමත් සමාජ පාලනය
2. විධිමත් සමාජ පාලනය

## අවිධිමත් සමාජ පාලනය

සමාජයේ පොදු පිළිගැනීමට ලක් වූ හර පද්ධතියක් රැකගෙන ජීවත්වීමට සමූහය තුළින් කෙරෙන බලපෑම පදනම් ව අවිධිමත් සමාජ පාලනය ඇති වේ. සාමූහිකව ජීවත්වීමත් සමග සිදුවන "හරහුරුව" මෙහි දී කැපී පෙනේ. ඒ සමාජයට ආවේණික වූ පොදු විග්‍රහය මගින් මෙම හර පද්ධතිය තීරණය කෙරේ. එසේ ම සමාජයෙන් සමාජයට ඇතිවන විවිධත්වය සලකුණු කිරීමට ද මෙම අනන්‍ය හර පද්ධතිය ඉතා වැදගත් ය. ස්වකීය සමාජ සමූහය තුළ අනන්‍යතාව පවත්වාගැනීමට මෙම සම්ප්‍රදායන්, චාරිත්‍ර වාරිත්‍ර, ධර්මතා ආදිය දැඩි ලෙස වැදගත් වේ.

අවිධිමත් සමාජ පාලනයේ දී පුද්ගල හෘද සාක්ෂියට ද සැලකිය යුතු තැනක් හිමි වේ. තමා විසින් තමා අයත් සමූහයේ (සමාජයේ) උන්නතිය හා ආරක්ෂාව සඳහා කැපවීමක් පවත්වා ගැනීම හෘද සාක්ෂිය හෙවත් අභ්‍යන්තර විනිශ්චය පදනම් වූ පෙළඹවීමක් ලෙස ද මෙය දැක්විය හැකි ය. මෙහි විශේෂත්වය වන්නේ ඒ ඒ පුද්ගලයා දක්වන කැපවීම ඔවුනට ආවේණික හා විවිධ වීම ය. එහෙත් සමාජයෙන් පුද්ගලයන්ට ලැබෙන ප්‍රතිලාභ හා තෘප්තිමත් බව වැඩිවන විට මෙම කැපවීම සඳහා පෙළඹවීම ද වැඩි වේ.

අතීත ශ්‍රී ලංකාවේ අවිධිමත් සමාජ පාලන බලවේගයක් ලෙස පන්සල මූලික භික්ෂු සංස්ථාවට දැඩි **බලවන්තභාවයක්** ලැබී තිබිණි. රජවරුන් ඇතුළු පාලකයෝ ද භික්ෂු සමාජය කෙරෙහි අතිශය ගෞරවපූර්වක වූවා සේ ම ඔවුන් වෙතින් නිරතුරු ව රාජ්‍ය පාලන කටයුතු පිළිබඳව උපදෙස් ලබා ගත් බව ඉතිහාසය වීමසීමේ දී පෙනී යයි. එදා භික්ෂූන් වහන්සේලා පාලකයන් මත ප්‍රතිජනනාත්මක බලපෑම් සිදු කළ අතර ම පාලක යන්ගේ ගෞරවය දිනාගැනීම නිසා නිරායාසයෙන් සාමාන්‍ය ජනතාවගේ ගෞරවයට ද පාත්‍ර විය.

සමාජය පාලනය කිරීම සඳහා අවිධිමත් බලවේගයක් ලෙස දයක වන චර්යා මාර්ගයක් වශයෙන් සිරිත් විරිත් හඳුනාගත හැකි ය. ඒ ඒ සමාජ විසින් සිරිත්විරිත් පද්ධතියක් ගොඩනගා ගන්නා අතර එයට අනුකූල ව සංස්කෘතිය පවරා දීම ද නිරායාසයෙන් සිදුවෙයි. සමාජයේ (සමූහයේ) අනන්‍යතාව අඛණ්ඩ ව පවත්වාගෙන යාමටත් සමාජය පාලනය කිරීමටත් මෙම පවරාදීම අවිධිමත්ව දායක වෙයි.

## විධිමත් සමාජ පාලනය

සමාජය පුළුල් වීමත් ප්‍රාථමික සමූහ ඉක්මවා ද්විතීයික සමූහ බිහිවීමත් සමග ම අවිධිමත් සමාජ පාලනය පමණක් ප්‍රමාණවත් නොවී ය. සිරිත් විරිත්, සම්ප්‍රදායන් වෙත ස්වකීය සමාජය නැඹුරු කරවීම සඳහා යම් ආධිපත්‍යයක් හා **බලවන්තභාවයක්** සහිත සමාජ පාලන ක්‍රම ස්ථානගත වූ අතර එය නීතිරීති පද්ධතියක් ලෙස හැඳින්වීමට බඳුන් විය. මෙම නීතිරීති පද්ධතිය චාරිත්‍ර වාරිත්‍ර වලින් වෙන් වීමේ ප්‍රධාන ම ලක්ෂණය වූයේ ඒවා ලේඛනගත ව පැවතිමයි. යම් සමාජයක් තුළ දිගුකාලීන ව පිළිගැනීමට ලක් වූ චාරිත්‍ර හෝ සම්ප්‍රදායන් එම සමාජයේ දිගුපැවැත්මට අත්‍යවශ්‍ය වේ. එසේ ම සාමූහික පිළිගැනීමට ලක් වී එය ලිඛිත ව ස්ථාපනය වී පුද්ගලිකත්වයක් නොමැති ව ක්‍රියාත්මක කිරීමට බලකිරීම නීති පද්ධතියේ ප්‍රධාන ම ලක්ෂණයකි. සමාජ පාලනය උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීමේ දී මූලික ලක්ෂණ තුනක් කැපී පෙනේ.

- බලාධිපත්‍ය — Authority
- සාමූහික වගකීම — Collective Responsibility
- සාම්‍යය — Reconciliation

බලාධිපත්‍යය යනු නීතිය මත ආරෝපණය කර ඇති උත්තරිතරභාවයයි. අතීතයේ දී එය දෙවියන්ගෙන් පහළවූවක් ලෙස හෝ කිසියම් ආගමික නැඹුරුවක් සහිත ශුද්ධ වූ ප්‍රකාශයක් ලෙස සලකා එයට බලය ආරෝපණය කෙරිණි. එය අනුගමනය කිරීමට බල කරනු ලබන අතර එයින් බැහැරවන්නන් සඳහා දණ්ඩනය ද සම්මත කර තිබීම විශේෂත්වයකි.

නීතිය සමාජ පාලන බලවේගයක් ලෙස සාමූහික පිළිගැනීමකට යටත් වේ. එය පොදුවේ ජන විඥානය තුළ තැන්පත් කෙරෙන්නේ සැම දා එයට එකඟ විය යුතු ය යන සම්මතය සහිතව ය. මෙම පොදු පිළිගැනීම බිඳ වැටුණහොත් එම නීතිරීති තවදුරටත් සමාජ පාලනයට ඉවහල් කරගත නොහැකි ය. නීතියක් පොදු සම්මතයක් ලෙස පවතින්නේ කිසියම්

දේශසීමාවක් තුළ නිශ්චිත සමාජයක් සඳහා පමණි.

නීතියේ පවතින සාමාන්‍යතාව යනු සැමට සමාන ව ක්‍රියාත්මක වීමයි. නීතිය බිඳින්නා දණ්ඩනයකට යටත් කිරීමත් එය අපෞද්ගලික රාමුවක් තුළ ක්‍රියාත්මකවීමත් මෙහි දී කැපී පෙනේ. දඬුවමට යටත් කළ පුද්ගලයා නැවත සමාජයට මුදා හැරෙන්නේ නිවැරදි කළ පුද්ගලයකු ලෙසයයි ඇති කරගන්නා පිළිගැනීම ද මෙහි දී කැපී පෙනෙන ලක්ෂණයකි.

## 5.2. සමාජ පාලනයෙහි ලා චාරිත්‍ර වාරිත්‍රවල වැදගත්කම

සාමූහික ව පිළිගැනීම් සමුදයකට එකඟ වීම පදනම් කරගෙන මිනිසා සංස්කෘතික සත්ත්වයෙකු ලෙස හැඳින්වීමට සමාජ විද්‍යාඥයෝ පෙළඹුනහ. එනම් තනි තනි ව ස්වකීය අවශ්‍යතා සපුරාගැනීම වෙනුවට සාමූහික ව අවශ්‍යතා සපුරාගැනීමට යොමුවීමත් සමග මිනිසාට අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා වෙත පිළිපැදිය යුතු යම් යම් චර්යාවන් ප්‍රගුණ කිරීමට සිදුවිය. ඒවා පරම්පරාවෙන් පරම්පරාවට පවරාදීමත් සමග එය සංස්කෘතිය වශයෙන් හඳුන්වන්නට විය. සංස්කෘතිය තුළ පවතින ඉතා බලවත් සමාජ පාලන බලවේගයක් ලෙස චාරිත්‍ර වාරිත්‍රවලට ප්‍රමුඛස්ථානයක් හිමි වේ.

චාරිත්‍ර වාරිත්‍ර යන පදයේ සරල තේරුම ගත් කල අනුගමනය කළ යුතු චර්යාවන් සමූහයක් හා අනුගමනය නොකළ යුතු චර්යාවන් සමූහයක් පිළිබඳ ව ඉන් අදහස් වේ. ඒ ඒ සමාජයට ආවේණික වන සේ චාරිත්‍ර වාරිත්‍ර ගොඩනැගේ. ඒවා පැහැදිලි ලෙසට සමාජයෙන් සමාජයට වෙනස් අනන්‍යතාවෙන් යුතු වේ.

චාරිත්‍රයක් ගොඩනැගෙනුයේ කිසියම් චර්යාවක් පොදුවේ ජන විඥානය තුළ අවශ්‍ය ම අංගයක් ලෙස පිළිගැනීමට ලක්වීමත් සමග ය. ජර්මන් සමාජ විද්‍යාඥයකු වූ **ෆර්ඩිනන් ටෝනිස්** සමාජ පාලනයේ ප්‍රධාන උපක්‍රම අතුරින් එකක් ලෙස චාරිත්‍ර වාරිත්‍ර හඳුන්වා දී ඇත.

චාරිත්‍ර වාරිත්‍ර ඕනෑ ම සමාජයක නිසඟයෙන් ම ක්‍රියාත්මක වේ. එහි සමාජ අනන්‍යතාවක් සහිත වන්නා සේ ම වැඩිහිටියෝ අවවාදයෙන් හා ආදර්ශයෙන් බාල පරපුර ඒ සඳහා පුහුණු කරති. බෞද්ධ සමාජය තුළ මෙවැනි චාරිත්‍ර වාරිත්‍ර සමුදායක් ඉතා පැහැදිලි ව හඳුනාගත හැකි ය. එහි දී ගිහි පැවිදි වශයෙනුත් එම චාරිත්‍ර වාරිත්‍රවල අනන්‍යතා හඳුනාගත හැකි වේ.

චාරිත්‍ර වාරිත්‍ර සමාජය තුළ පිළිගැනීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලවන්ත භාවය අනුව කොටස් දෙකකට බෙදිය හැකි ය.

01. ජනචර්යා Folkways

02. ගණචර්යා Mores

ජනාචාර / ජනචර්යා යනු සමාජය තුළ ක්‍රියාත්මක කිරීමට බල කරන නමුත් එය නොසලකා හැරීම හෝ බිඳලීමට එරෙහිව දැඩි සමාජ ප්‍රතික්‍රියා රහිත චර්යා සමුදායකි. සංස්කෘතිය තුළ පිළිගත් ධර්මතාවල ප්‍රතිඵලය ලෙස ප්‍රකට සමාජ විද්‍යාඥයකු වූ **සම්නර්** මෙම දෙවර්ගය ම හඳුන්වා දෙන අතර ඒවායින් ලිහිල් ම කොටස ජනචර්යාවලට ඇතුළත් වන බව පවසයි. ජන චර්යා බිඳ හෙළීමෙන් බොහෝ විට වාචික අප්‍රසාදය ප්‍රතිශෝධාත්මක සරල ප්‍රතිචාරවලින් පමණක් එයට එරෙහි ව හඳුනාගත හැකිය. මෙය නිතර සමාජයේ දක්නට ලැබෙන අතර ම එවැනි ප්‍රතිචාර දිගුකාලීන ව නො පවතින්නකි. නිදසුනක් ලෙස පූජනීය ස්ථානයකට පාවහන් පැළඳ යෑම වැනි දේ දැක්විය හැකි ය.

ගණාචාර නැතහොත් ගණ චර්යා ලෙස හඳුන්වන්නේ ජනාචාරවලට වඩා බලවත් ලෙස සමාජ පිළිගැනීමට ලක් වූ හර පද්ධතියයි. ගණාචාර බිඳ ලූ විට ඇතිවන සමාජ ප්‍රතිරෝධය වඩාත් බලවත් වේ. උපැවිදිවීම, පතිවත පතිනිවත බිඳලීම, ආගම වෙනස් කිරීම, තහනම් ඥාතීන් අතර විවාහ වැනි ඇතැම් චර්යා දෙස සමාජය බලනුයේ වඩාත් අවමන් සහගතව ය. මෙය ජනාචර කඩවීමෙන් සිදුවන සමාජ ප්‍රතික්‍රියාවට වඩා ප්‍රතිශේධාත්මක බලවන්ත භාවයකින් යුතු ව ක්‍රියාත්මක වේ.

සිරිත් විරිත් පිළිබඳ සමාජ පිළිගැනීම ද කාලීනව වෙනස් වේ. පරම්පරා එකක් හෝ කීපයක් තුළ සිරිත් විරිත් අලුතින් ගොඩනැගීමත් පවතින ඒවා නවීකරණය වීමක් හෝ බැහැරවීමක් හෝ ඕනෑම සමාජයක් තුළ නිරතුරු ව සිදු වේ. විශේෂයෙන් කාර්මිකරණයේ මුවාවෙන් පැමිණෙන බටහිරකරණය නිසා ආසියාතික රටවල සමාජ හර පද්ධතිය ඉතා බලවත් ලෙස විකෘතීන්ට ලක් වී ඇත. විශේෂයෙන් විද්‍යුත් ජනසන්නිවේදන මාධ්‍ය ඔස්සේ සිදුවන අනවරත පෙළඹවීම් නිසා ශ්‍රී ලාංකික බෞද්ධ සමාජයේ සම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර පද්ධතිය අභියෝගයට ලක් විය.

**හර්බට් ස්පෙන්සර්** වැනි සමාජ විද්‍යාඥයන් ඉදිරිපත් කළ සමාජ පරිණාමය පිළිබඳ මූලධර්ම සමාජ චාරිත්‍ර වාරිත්‍ර විෂයෙහි ඉතා

වැදගත් වේ. ඕනෑ ම සමාජයක් අරබයා අඛණ්ඩ ව සිදුවන පරිණාමයන් හා සංස්කෘතික විසරණයන් හේතුවෙන් තත් සමාජයේ චාරිත්‍ර වාරිත්‍ර පද්ධතිය විකරණයට භාජනය වේ. මෙහි දී චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කිරීම හා ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳ ව යම් පරම්පරා ගැටුමක් ද පවතී. වැඩිහිටියන් සම්ප්‍රදාය රැකීම නියෝජනය කරද්දී බාල පරපුර සම්ප්‍රදාය වෙනස් කිරීම හෝ බිඳීම නියෝජනය කිරීම ද සමාජය තුළ නිරතුරු ව හඳුනාගත හැකි ය.

සමාජ පාලන බලවේගයක් ලෙස සිරිත් විරිත්වලින් සිදුවන මෙහෙය ඉතා ප්‍රබල ව කැපී පෙනෙන්නේ ප්‍රාථමික සමූහ තුළ දී ය. එහි දී නීතිරීතිවලින් නොව පාලනය ඇතිවන්නේ චාරිත්‍ර වාරිත්‍ර මූලික වීමෙනි. එක් එක් සමාජ සංස්ථාවකට අනුබද්ධ වූ චාරිත්‍ර වාරිත්‍ර සමුදායක් ඇත. පවුල තුළ සමාජිකයන් අතින් ඉටුවන සිරිත් විරිත් සහ ආගමික සංස්ථා තුළ පවතින සිරිත් විරිත් එකිනෙකට වෙනස් වේ. කිසියම් සමාජ සමූහයකින් ඉවත් ව වෙනත් සමාජයකට අනුගතවීමේ දී සිදුවන පුනර්සමාජානුයෝජනය (Resocialization) මූලිකව ම යොමු කෙරෙන්නේ නව සමාජයේ චාරිත්‍ර වාරිත්‍ර රටාවට අනුගත කරලීමයි. රටකින් රටකට යාම, ගිහි ජීවිතයෙන් පැවිදි ජීවිතයට පැමිණීම, අවිවාහක ව සිට විවාහ වීම වැනි ඕනෑම අවස්ථාවක දී මෙම චාරිත්‍ර වාරිත්‍ර පද්ධතිය යම් වෙනස් කිරීමකට ලක් වේ. එමෙන් ම ඒ ඒ සමාජය තුළ සමාජ පාලනය සඳහා ක්‍රියාත්මක වන බලවේගය ද ඒ අනුව වෙනස් වේ.

තමා ජීවත් වන සමාජයේ සිරිත් විරිත් නවක සාමාජිකයන්ට හුරු කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය උසුලනුයේ පවුලයි. පවුල තුළින් සිදුවන ප්‍රාථමික සාමාජානුයෝජනය මෙහි දී ඉතා වැදගත් වේ. පවුල තුළින් සිදුවන සමාජානුයෝජනය සමස්ත ඉදිරි ජීවිතයට බලපායි. බිඳුණු පවුල් (Broken Families) පරිසරයක හැදෙන වැඩෙන දරුවන් බොහෝ විට අසාමාන්‍ය චර්යා සහිත වේ. ඔවුහු බොහෝ විට සමාජයේ පිළිගත් චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ තැකීමක් නොකරන අතර සමාජයේ පොදු ඇගයුම් වලින් අපගමනයවීමක් දක්වති. සංස්කෘතික වශයෙන් මෙවැනි අපගමනය වීම සමාජ විද්‍යාවේ දී "සංස්කෘතික දරිද්‍රතාව" ලෙස ද හැඳින් වේ. සමාජයේ පංති සාධකයට ප්‍රතිබද්ධ ව යම් පමණකින් සිරිත් විරිත් හා සමාජ පාලන පද්ධතිය ද වෙනස් වී පවතින බව නිරීක්ෂණය කළ හැකි ය. දිළිඳු පන්ති, මධ්‍යම පන්ති, ධනවත් පන්ති, උගත්, නූගත් ආදී ඕනෑ ම සමාජ පන්තියකට ආවේණික වූ යම් යම් චාරිත්‍ර වාරිත්‍ර අපට පැහැදිලි ව නිරීක්ෂණය කළ

හැකි ය. සාමාජිකයන්ගේ ඇතැම් චර්යාවන් දුටු විට තම කණ්ඩායමෙන් නෙරපීමට ලක්වනුයේ මෙම පන්ති සාධකය වටා බැඳී ඇති චාරිත්‍ර වාරිත්‍ර කඩවීම හේතුවෙනි.

භික්ෂු ශාසනයට ප්‍රවේශ වීමේ දී සාමණේර අවධියේ දී අපේක්ෂා කරනුයේ ද භික්ෂු ජීවිතයට අවැසි මූලික වත්පිළිවෙත් සමාජානුයෝජනයයි. එය උපසම්පදාවට පළමු ව ලබන ශික්ෂණයක් වන්නා සේ ම පැවිදි ජීවිතයට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමකි.

## 5.3. සාරධර්ම හා සමාජය

සාරධර්ම හා ධර්මතාවන් සමාජ පාලනයෙහි ලා ප්‍රබල දයකත්වයක් ලබා දෙයි. සාරධර්ම හා ධර්මතා ආසන්න අර්ථ සහිත ව සමාජයේ භාවිත වුව ද ඒවා එකිනෙකින් වෙනස් වේ.

සාරධර්ම යනු යම් කිසි දෙයක් ඇගයුම සඳහා යොදාගනු ලබන මිනුම් දඬු හෝ සංකල්ප සමුදායකි. මෙම ඇගයුම සඳහා ගනු ලබන දේවල් අතර වස්තූන්, අදහස්, ක්‍රියා, හැඟීම්, හා සිද්ධීන් ද ඇතුළත් වේ. ඇගයුම බොහෝ විට සාපේක්ෂ ස්වභාවයක් උසුලයි. සාරධර්ම යනු පුද්ගලයා විසින් හෝ සමාජය විසින් හෝ හොඳ, යහපත් යැයි සම්මත කර ගත් සංකල්ප සමුදායකි.

ධර්මතා යනු සමාජයේ හැසිරිය යුත්තේ මෙසේ යැයි ගොඩනගා ගත් සම්මතයන් ය. ධර්මතා තනි පුද්ගලයෙකුට පමණක් ක්‍රියාවේ යෙදවිය නොහැකි ය. එවැනි ක්‍රියාකාරකම් දෙස බලා ඇගයීමට සමාජයක් ද තිබිය යුතු වේ. ධර්මතාවක් අනුගමනය කළ යුතු චර්යා පද්ධතියක් ද සහිත ය. එය සමාජය විසින් අනුමත කිරීම හෝ බැහැර කිරීම සිදුවිය හැකි අතර ඇතැම් විට එය කඩවීමක දී දණ්ඩනයකට ද යොමු විය හැකි ය. එනම් ධර්මතා යනු සාරධර්ම පාදක ව ගොඩනගා ගත් සමාජය සම්මත කරගත් "අපේක්ෂිත චර්යා පද්ධතියකි".

සාරධර්ම කුඩා වියේ සිට ම ක්‍රමයෙන් අභ්‍යන්තරීකරණය වේ. විශේෂයෙන් පවුල තුළින් ඇරඹෙන මෙම ක්‍රියාවලිය සංස්කෘතිය පවරාදීමේ ක්‍රියාවලියේ වැදගත් අංගයක් ලෙස හඳුන්වා දිය හැකි ය. ද්විතීයික සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පාසල ඉතා වැදගත් කාරකයක් වේ. පවුල් පරිසරය කෙබඳු වුව ද බාහිර සමාජයේ සාරධර්ම පද්ධතිය පැහැදිලි ව හඳුනාගැනීමටත්

ඒ අනුව සාමාජානුයෝජනය වීමටත් පාසල ප්‍රබල දායකත්වයක් ලබාදෙයි. කිසියම් සමාජ චර්යාවකට අනුව පුද්ගලයා සමාජානුයෝජනය කිරීම පාසල් මගින් සිදු වේ.

ආගමික සංස්ථාව ද සාරධර්ම ගොඩනැගීමේ ලා බලවත් සාධකයක් වේ. ශ්‍රී ලංකාවේ සාරධර්ම පද්ධතිය මත බෞද්ධාගමික බලපෑම අතිමහත් වේ. බටහිර රටවලට වඩා සුවිසල් සාරධර්ම පද්ධතියක් ආසියාතික රටවල පවතින බව සියුම් ව නිරීක්ෂණය කළ විට හඳුනා ගත හැකි ය. මෙයට ප්‍රබලතම හේතුව ආසියාකරයේ පැතිර පවතින බෞද්ධ නැඹුරුවයි.

ශ්‍රී ලංකාවේ පවුල් ව්‍යුහය තුළ ආගමික සාරධර්ම සමූහයක් සුරැකී ඇත. මාපිය දූ දරු සම්බන්ධය ප්‍රබල ව පැවතීම එයට හේතු වී ඇත. දරුවන් කොපමණ වියපත් වුවත් දෙමව්පියෝ ඔවුන් මත යම් අධිකාරිබලයක් පවත්වති. වෘද්ධ දෙමාපියන් සම්බන්ධයෙන් සැලකිලිමත් වීම අතින් ලාංකිකයෝ බටහිර සාරධර්ම පද්ධතියට වඩා විශේෂත්වයක් දක්වති. සමාජ ස්ථාරායනය අනුව සාරධර්මවල යම් වෙනස්වීම් ද හඳුනාගත හැකි ය. දිළිඳු සමාජයේ හා ධනවත් සමාජයේ ඇගයුම් පද්ධති සියුම් ව නිරීක්ෂණය කිරීමේ දී මෙය හොඳින් පැහැදිලි වේ.

උදාහරණ ලෙස ග්‍රාමීය සමාජයේ දරුවන්ගේ ඇඳුම් පැළඳුම් පිළිබඳ ව වැඩිහිටියන් දරන මතය, නාගරික සමාජයේ වැඩිහිටියන් දරුවන්ගේ ඇඳුම් පැළඳුම් පිළිබඳ ව දරන මතයට වඩා බොහෝ දුරට වෙනස් වේ.

සරල සමාජවල සමාජ ඒකාබද්ධතාව පවත්වාගැනීමට සාරධර්මවල බලපෑම වැදගත් වේ. පුද්ගලයන් එකිනෙකා අතර පවත්වා ගත යුතු චර්යාවන් මගින් සමාජමය සංස්කෘතිය රඳා පවතින්නේ සාරධර්ම නිසා බව **එමිල් ඩුර්කයිම්** ප්‍රකාශ කරයි.

ලාංකික සමාජයේ ප්‍රබල ලෙස ඇගයීමට ලක්වන සාරධර්ම රාශියක් හඳුනාගත හැකි ය. එතරම් ම නොවූවත් බටහිර සමාජයේ ද සාරධර්ම පද්ධතියක් ඇති බව රොබට් හා විලියම්ස් විසින් ඇමරිකානු සමාජය ඇසුරින් සාරධර්ම දහ අටක් ලැයිස්තුගත කිරීමෙන් පෙනේ. සාරධර්ම පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් සමාජයේ සමාජ සංස්කෘතියේ දිශාගත වීම පිළිබඳව හඳුනාගත හැකි ය. උදාහරණ වශයෙන් පුද්ගල නැඹුරුව හෝ පොදු නැඹුරුව වැනි සමාජ ක්‍රම එහි දී කැපී පෙනේ. ඇතැම් විට යුරෝපීය ජාතිකයන් අතර කලු සුදු භේදය ඔවුන්ගේ සාරධර්ම පද්ධතිය තුළ

ද සැඟවී අන්තර්ගත වන අතර සෙසු ලෝක සමාජය එය බැහැර කරයි.

ඕනෑ ම සමාජයකට පොදු සාරධර්ම පද්ධතිය තුළ මතු සඳහන් සාරධර්ම බොහෝ දුරට හඳුනාගත හැකි වේ.

* මානව දයාව
* සුචරිත දෘෂ්ටිය
* සමානාත්මතාව
* නිදහස
* ජාතික හැඟීම
* ප්‍රජාතන්ත්‍රවාදී බව
* වැඩ කිරීම
* දියුණුව ඇති කරගැනීමේ උනන්දුව
* සාර්ථකත්වය
* සුඛනම්‍ය ජීවිතය

සාරධර්ම අතර ද ඇතැම් විට ගැටුම් සහගත තත්ත්ව පවතී. සමානාත්මතාව අගයන සමාජ ක්‍රමය තුළ පැවිදි කිරීමේදීත්, විවාහය සිදුකිරීමේදීත් කුලය සමහර අවස්ථාවල ප්‍රබල සාධකයක් ලෙස සැලකීම ඊට හොඳ උදාහරණයකි. දියුණුවීමේ උනන්දුව සමාජයේ පිළිගත් සාරධර්මයක් වන අතර ම ඇතැම්හු ඒ සඳහා වංචා සහගත ක්‍රමවේද භාවිත කිරීමට පෙළඹෙති.

ධර්මතාවන් ක්‍රියාත්මක වන්නේ සාරධර්ම මූලික වූ ඇගයුම්වල ප්‍රායෝගික භාවිතයන් ලෙස ය. සමාජය පොදුවේ පිළිගත් බව හෝ ප්‍රතික්ෂේප කළ බව හෝ ධර්මතාවක ඇති ලක්ෂණයකි. ධර්මතා රැකීමෙන් ලැබෙන සමාජ ප්‍රතිලාභයට වඩා ධර්මතා බිඳීමෙන් සිදුවන අවමානයේ බලපෑම කැපී පෙනේ. සමාජයේ ප්‍රබල ධර්මතා ඇතැම් විට නෛතික සමාජ පාලනයට ද ඇතුළත් වී පවතී. උදාහරණයක් ලෙස සුචරිත දෘෂ්ටිය ධර්මතාවයක් ලෙස රැකගැනීමට අපි කටයුතු කරමු. එහෙත් ඒ පිළිබඳ ව විශේෂයෙන් නෛතික බලපෑමක් නැත. නමුත් එය කඩ වන ක්‍රියාකාරකම් නීතිය මගින් වැරදි ලෙස නම් කර දණ්ඩනයට යටත් කර තිබේ. උදාහරණ ලෙස ළමා අපයෝජනය, ගණිකා වෘත්තිය ආදිය දැක්විය හැකි ය. ඇතැම්

විට ස්වයං පෙළඹවීමෙන් ද අතැම් විට නෛතික පෙළඹවීමෙන් ද සුචරිත දෘෂ්ටිය තුළ රැඳී කටයුතු කිරීමට සමාජය යොමු වේ. එබැවින් ධර්මතා හා සාරධර්ම සමාජ පාලනයට ශක්තියක් ලබා දෙයි. මිනිසාගේ ස්වභාවික හැසිරීම යුක්ති සහගත වන සෑම අවස්ථාවක ම එය ධර්මතාවන් තුළ ම අන්තර් ග්‍රහණය වී ඇත. එය සමාජයේ අපේක්ෂිත චර්යයා පද්ධතිය ලෙස ස්ථානගත වී ඇත. මෙලෙස පුද්ගල අභ්‍යන්තරීකරණයට පාත්‍රවීම නිසා ම ධර්මතා සුරැකීම සඳහා පෙළඹවීමක් අවශ්‍ය ම නොවන තත්ත්වයක් ඇති වේ. එය සමාජයේ මුල් බැස ගත් හර පද්ධතියක් ලෙස සංස්කෘතිය ඔස්සේ පවරාදීමට බඳුන් වේ.

කිසියම් සමාජයක පවතින ධර්මතා සමුදාය සකස්වන්නේ තත් සමාජයේ ජීවන රටාව පදනම්ව ය. මක්නිසා ද යත් මිනිසාගේ මූලික ම අවශ්‍යතාව ජීවත්වීම නිසාවෙනි. පුද්ගලයා ජීවත්වීමේ දී ඒ සඳහා සෑමවිට ම විකල්ප ගණනාවක් අතරින් කිහිපයක් තෝරා අත් හදා බලයි. ප්‍රකට සමාජ විද්‍යාඥයකු වූ **සම්නර්** පවසන්නේ මෙම විකල්ප අතුරෙන් තෝරාගත් එකක් හෝ කිහිපයක් නැවත සිදුකිරීමෙන් හා අනුකරණය කිරීමෙන් පුද්ගල චර්යාවන් සමග බද්ධ වී සමාජය තුළ හුරුපුරුදු බව හා පිළිගැනීමට ලක්වන බවයි. එම සම්මතකරණය ධර්මතාවක් බවට නිතැතින් පත් වේ.

ධර්මතාවල ඉහළම මට්ටම නීතිය මගින් ව්‍යවහාර වේ. නීතිය මගින් සිදු කරන්නේ ධර්මතාවලට අනුකූල ව ජීවත්වීමට බලය යෙදවීමයි. සිරිත් විරිත්, ජනාචාර, ගණාචාර රැකීම සම්බන්ධයෙන් බලකරුවෙකු නොමැති වුව ද නීතිය ආරක්ෂා කිරීමට පුද්ගලයන් හා ආයතන ස්ථාපනය කර ඒවාට බලය පවරා ඇත. ධර්මතාවලට නොමැති ලක්ෂණ හතරක් නීතියට ඇත.

1. නීතිය රජය මගින් නිල වශයෙන් ප්‍රකාශයට පත් කර රජය විසින් ම ක්‍රියාත්මක කරයි.
2. නීතිය පුළුල් ලෙස විවරණය කර අරුත් ගන්වා ලේඛනගත කර ඇත.
3. නීතිය ක්‍රියාත්මක කිරීමට බලාත්මක පුද්ගලයන් හා ආයතන පවතී.
4. නීතිය කඩ කරන්නන්ට එයින් වන වරද ප්‍රමාණය කර දඬුවම් නියම කර ඇත.

ධර්මතා, ක්‍රමයෙන් වෙනස්වීම්වලට ලක් වේ. වයස, නාගරීකරණය, සමාජ ස්තරායනය, අධ්‍යාපනය, ආර්ථික සාධක, දේශපාලන මතවාද ධර්මතාවලට බලපෑම් කරයි. උදාහරණ ලෙස තරුණ ජීවිතයේ ධර්මතාවන් වෘද්ධ ජීවිතයේ දී වෙනස් වේ. අධ්‍යාපනයෙන් ඉහළ යත් ම ධර්මතා වෙනස් කරගනී.

ධර්මතාවල අපේක්ෂිත හා ප්‍රායෝගික මට්ටම් අතර යම් වෙනස්කම ක් පවතී. එය පරමාදර්ශී ධර්මතා හා යථාර්ථ ධර්මතා වශයෙන් හඳුන්වයි. පරමාදර්ශී ධර්මතාවක් හා අදාළ ධර්මතාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උත්තරීතර මට්ටමයි. යථාර්ථ ධර්මතා යනු ව්‍යවහාරික සමාජය තුළ එය අත්පත් කරගන්නා මට්ටමයි. උදාහරණයක් ලෙස ජාතික හැඟීම ධර්මතාවකි. එය ජාත්‍යානුරාගය, ස්වදේශවාත්ශල්‍යය වැනි හැඟීම් සමග බැඳී උත්තරීතරව පිහිටයි. එහෙත් ව්‍යවහාරික සමාජය තුළ සියලු ජාතීන් අතර සමානාත්මතාව පවත්වා ගත යුතු බවට පිළිගෙන කටයුතු කළ යුතු ය. තමා අයත් ජාතිය සමාජයේ උසස් යයි සැලකීමට එහි දී ඉඩක් නැත.

සමාජයේ ධර්මතාවලින් පුද්ගලයා ඈත්වීම අනෝමීය තත්ත්වය ලෙස **එමිල් ඩුර්කයිම්** "සියදිවි නසාගැනීම" නමැති කෘතියේ හඳුන්වා දී ඇත. ධර්මතා විරහිත බව නිසා ඇතිවන මනසෙහි අභ්‍යන්තර ගැටලු තත්ත්වය දිවි නසා ගත හැකි තත්ත්වයක් දක්වා වර්ධනය විය හැකි බව ඩුර්කයිම් දක්වා ඇත. පුද්ගලයෙකු ධර්මතා විරහිත වීම නිසා සමාජයේ අවමානයට හා ප්‍රතික්ෂේප කිරීමට භාජනය වේ. එමගින් ඇතිවන සමාජ බලපෑම ඉතා හානිදායක බව ඔහු පවසයි.

සරල සමාජයක සිට සංකීර්ණ සමාජයක් දක්වා ඕනෑම මට්ටමක දී සාරධර්ම හා ධර්මතා පදනම්ව පුද්ගලයා හා සමාජය අතර අන්තර් ක්‍රියාව පාලනය සිදු වේ. මේ අනුව සලකන කල සාරධර්ම හා ධර්මතා සමාජ පාලනය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන බව පැහැදිලි වේ.

## 5.4. සමාජ පාලනයෙහි ලා භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය

සමාජයේ සුබනම්‍ය පැවැත්ම උදෙසා මග පෙන්වන ප්‍රබල ආගමික දර්ශනය ලෙස බුදුදහම අවිවාදයෙන් හඳුන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාව ඇතුළු ආසියාකරයේ රටවල් ගණනාවක සමාජ හර පද්ධතිය ගොඩනැංවීමේ ලා බුදු දහමින් සිදු වූ බලපෑම සුවිශාල වේ. එයිනුත් ථේරවාදී බෞද්ධ සමාජයට ඉන් සිදු වූ බලපෑම වඩාත් පුළුල් වේ.

දෙවනපෑතිස් රජු දවස මහින්දාගමනයෙන් ඇරඹි මෙම සමාජ

වෙනස්වීම අද දක්වා ම අඛණ්ඩ ව පැවතීම විශේෂත්වයකි. බුදුරජාණන් වහන්සේ මෙසේ ලොව පහළ වූ අසහාය සමාජ විද්‍යාඥයා ලෙස හඳුන්වා දීම කිසිසේත් වැරදි නොවේ. බෞද්ධ සමාජ සාරධර්ම හා ධර්මතාවලට බොහොමයක් පාදකවූයේ එකල භාරත සමාජය තුළ මුල් බැසගෙන තිබූ ශික්ෂණයයි. එයට නව අර්ථකථනයන් හා තාර්කික බවක් ලබාදෙමින් ප්‍රතිෂ්ඨාපනය කිරීම බුදුදහමින් සිදුවිය.

භාරතීය සමාජයේ තිබූ (බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර) චතුර්වර්ණ ක්‍රමය වෙනුවට (භික්ෂු ,භික්ෂුණී,උපාසක,උපාසිකා) සිව්වනක් පිරිස් ආදේශ විය. එතෙක් පැවති කුල පදනම මත වූ සමාජ ස්ථරායනට එමගින් නව අර්ථකථනයකට ලක්විය. සමාජය ක්‍රියාත්මක විය යුත්තේ සියලු දෙනාට හිතසුව පිණිස යන මතය වඩාත් තහවුරු විය. බුදුරජාණන් වහන්සේ සෑම පුද්ගලයකුට ම සමාන උරුමකම් තිබිය යුතු ය යන ධර්මතාව සමාජය තුළ ස්ථාපනය කළේ ය. නූතනයේ භාවිත වන මූලික මිනිස් අයිතිවාසිකම්වල අගය ලොවට හඳුන්වා දුන් ප්‍රථමයා ලෙස බුදුරාජාණනන් වහන්සේ හඳුන්වා දිය හැකි ය.

බෞද්ධ සමාජ පාලනයෙහි ලා වැදගත් ධර්මතාවන් රාශියක් ඉතා පැහැදිලිව සූත්‍ර පිටකයේ හඳුනා ගත හැකි ය. මංගල, සිගාලෝවාද, පරාභව, වසල, චුල්ලහත්ථිපදෝපම, චක්කවත්ති සීහනාද සහ කාලාම වැනි සූත්‍ර ධර්මයන් ඒ අතුරින් කැපී පෙනේ.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් තුනක් ඇවෑමෙන් පහළ වූ අශෝක රජතුමා බුද්ධ ධර්මය ලොව පතුරුවාලීමට සමත් විය. එතෙක් ඉන්දියාවට සීමා වී තිබූ බෞද්ධ සමාජ ක්‍රමය ඒ සමග ම පැතිර ගියේ ය. කණ්ඩායම් නමයක් මගින් පතුරවා ලූ බුදුදහම ලංකාවට ගෙන ආවේ මිහිඳු මාහිමියන් ප්‍රමුඛ කණ්ඩායම විසිනි. රාජානුග්‍රහය ලබාගැනීමට මිහිඳු හිමියන් සමත්වීමත් සමග ලාංකික සමාජයේ ප්‍රබල සමාජ වෙනස්වීමක් ඇති විය. ඒ සමග ම භික්ෂූන් වහන්සේගේ සමාජ කාර්යභාරය ද පුළුල් පිළිගැනීමක් සහිත ව ස්ථාපනය විය.

අනුරාධපුර මහා විහාරීය භික්ෂු සමාජය රාජ්‍ය පාලනයේ දී පාලකයන්ට අනුශාසනා කිරීමේ නියුක්ත විය. දසරාජ ධර්මයෙන් යුතු ව රට පාලනය කිරීම මගින් ධර්මිෂ්ඨ පාලකයෙකු රටට බිහිකිරීමට භික්ෂූන් වහන්සේලා විසින් මග පෙන්වනු ලැබිණි. ශීලය, පරිත්‍යාගය, ඍජුබව, තපෝගුණය, අක්‍රෝධය, අවිහිංසාව වැනි ධර්මතාවන් ඒ සමගම රාජ්‍ය

පාලනයට අත්‍යවශ්‍ය ගුණාංග ලෙස සම්මත විය.

මෙවැනි පසුබිමක් තුළ භික්ෂුවගේ කාර්යභාරය ද අනන්‍ය ලෙස සමාජය තුළ ස්ථාපනය විය. විශේෂයෙන් පන්සල අධ්‍යාපනයේ මූලික කේන්ද්‍රස්ථානය වීමත් සමග භික්ෂූන් වහන්සේලාගේ ශාසනික කාර්යභාරය ඉක්මවා ශාස්ත්‍රීය කාර්යභාරයක් ද සමාජගත විය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ගේ සමාජ ක්‍රියාකාරි බව යම් පාලනයන්ට නතු කළේය. සේඛියා ලෙස හඳුන්වන ධර්මතා සමූහයක් මගින් භික්ෂු අනන්‍යතාව රැකගැනීමට මග පෙන්වී ය. එහෙත් ගිහි සමාජයේ යථා පැවැත්මට පංච ශීල ප්‍රතිපත්තිය සමාජය තුළ පිළිගැනීමට ලක් වූ අතර සමාජයේ අන්‍යෝන්‍ය ගරුත්වය තහවුරු කිරීමට ද ඉවහල් විය.

සමාජ පාලනයක් උදෙසා බෞද්ධෝපදේශ සමාජ ගතකිරීමේ දී භික්ෂුවගේ කාර්යභාරය අතිමහත් වේ. යහපත් සමාජයක් සඳහා මග පෙන්වන සිඟාලෝවාද සූත්‍රය වැනි දේශනාවන් සමාජයේ විවිධ ස්ථරයන් අතර මනා අන්‍යෝන්‍ය සම්බන්ධතාව තහවුරු කරයි. පුද්ගලයා අවට සමාජයේ අත්‍යවශ්‍ය සම්බන්ධතා සදිසා වශයෙන් දක්වා එම දිසාවන් අතර යුතුකම් සමූහයක් එහි දී ප්‍රකාශයට පත් වී ඇත. භික්ෂූන් වහන්සේලා ද ස්වකීය දායක කාරකාදීන් විෂයෙහි පැවතිය යුතු අන්දම මෙම දේශනාවේ දක්වා ඇත.

සමාජය විසින් පැවිදි පක්ෂය විෂයෙහි ඉටු කළ යුතු සේවාවන් සහ පැවිදි පක්ෂය විසින් සමාජය විෂයෙහි ඉටු කළ යුතු සේවාව එහි පැහැදිලි ව දක්වා ඇත.

**භික්ෂු සමාජය විසින් ගිහි සමාජය උදෙසා ඉටු කළ යුතු සේවාවන්**

* පව්කම්වලින් වැළැක්වීම
* සුචරිතයේ යෙදවීම
* යහපත් සිතින් අනුකම්පා කිරීම
* නො ඇසූ ධර්මය අසන්නට ඉඩ සැලසීම
* ඇසූ ධර්මය පිළිබඳ අවබෝධය ඇති කිරීම
* සුගතිගාමී මාර්ගය කියාදීම

**ගිහි සමාජය විසින් භික්ෂු සංඝයා විෂයෙහි ඉටු කළ යුතු සේවාවන්**

* මෛත්‍රී සහගත කාය කර්ම
* මෛත්‍රී සහගත වාග් කර්ම
* මෛත්‍රී සහගත මනෝ කර්ම

* නො වසන ලද දොරටු ඇති බව
* සිව්පසය ලබා දීම

මේ අනුව බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවක පිරිස සමාජ පාලනය විෂයෙහි සියුම් ලෙස පුහුණු කළ බව පෙනේ. මනා ගිහිපැවිදි සම්බන්ධයක් සමග සමාජයට අනුශාසනා කිරීමේ බලවත්භාවය මහා සංඝරත්නයට නොඅඩුව ලැබුණි.

ලිච්ඡවී රජදරුවන් ප්‍රගුණ කළ සප්ත අපරිහානිය ධර්ම අද දක්වාත් සමාජ පාලනය කෙරෙහි යොදවා ගත හැකි අගනා අදහස්වලින් පරිපූර්ණ වේ. අතීතයේ මෙම දහම් කරුණු ප්‍රගුණ කළ භික්ෂූන් වහන්සේලා රජවරුන්ට ද පාලනය සම්බන්ධයෙන් අවවාද අනුශාසනා කිරීමට තරම් බලවත් වූහ. එමඟින් බෞද්ධ සමාජ පාලනය ක්‍රමවේද ලාංකික සමාජය ඒකීයත්වයට පත් කළේ ය.

පාරභෞතික හා දේවවාදී යුගවල සමාජ පාලනය අද්භූත ස්වභාවධර්මයේ බලවේගවලට බිය මුසු බවක් ආරෝපණය කිරීමකින් හා අනුකරණය තුළින් සිදුකෙරුණ ද බෞද්ධ දර්ශනය මුල් බැස ගැනීමත් සමග එය විචාරශීලි බවක් ඇති කරගත්තේ ය. බුදුදහම අමූලික ශ්‍රද්ධාවට වඩා ආකාරවතී ශ්‍රද්ධාව අගය කිරීමෙන් මෙය පැහැදිලි වේ. බුදුදහමේ ඒහිපස්සික ගුණය පාදක ව සමාජය වෙත පිවිසීමට භික්ෂුව සූදානම් විය යුතු ය. සැමවිට ම මිනිසාගේ විචාරශීලී බවත් බුද්ධියත් අවදි කිරීමට අවශ්‍ය සියලු ම ධර්මඥානයෙන් හා සමාජඥානයෙන් භික්ෂුව පෝෂිත විය යුතු ය.

නූතන පරිභෝජනවාදී සමාජය සැමවිට ම ධර්මයෙන් ඈත්වීම ස්වභාවික ව ම සිදුවේ. අතීත සමාජ පර්යායන් බිඳ වැටී නව සමාජ පර්යායක් ගොඩනැගීමට නාගරිකරණය, කාර්මිකරණය, අධ්‍යාපනය, ගෝලීයකරණය, සන්නිවේදන දියුණුව ආදිය අනවරතයෙන් බලපායි. මෙම පසුබිම තුළ සමාජය ධර්මය කෙරෙහි ප්‍රසන්න ආකල්ප ඇති කිරීමටත් ධර්මය වෙත ආකර්ශනය කරගැනීමටත් භික්ෂුව නිරතුරු ව සූදානමින් පසුවිය යුතු ය. එහි දී වඩාත් ඉවසිලිවන්ත ව හා සැලසුම් සහගත ව සමාජයට ප්‍රවේශ වීම අවශ්‍ය වේ.

භික්ෂූන් වහන්සේ ආදර්ශයෙන් ම අල්පේච්ඡ, අල්ප භාණ්ඩික උපභෝග පරිභෝග වස්තුවෙන් යුක්ත විය යුත්තා හ. අල්පේච්ඡ, හා සරල බවින් අත්මිදෙත් ම ඇති වන්නේ අසහනය, අතෘප්තිය හා අහංකාරයයි. එය සමාජය නොතිත් තරගයකට යොමු කරන අතර පරාජිතයන් හා දියුණුවන්න න් අතර නිතැනින් ම ඇතිවන්නේ වෛරය, ඊර්ෂ්‍යාව වැනි දුර්ගුණයන් ය. බෞද්ධ සමාජ පාලන ක්‍රම හඳුන්වාදීමේ ගාමක බලවේගය ලෙස භික්ෂුව

මෙම හීන ධර්මයෙන් හෝ විනිර්මුක්ත විය යුතු බව අදාළ ධර්මයෙහි පැහැදිලි ව දක්වා ඇත. විනය පිටකයේ සේඛියා වලින් අනුදැන වදාරා ඇත්තේ මෙයට අදාළ භික්ෂු සමාජ ධර්මතාවන් ය.

ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා ආජීවයත්, සම්මා වායාමයත් නිරතුරුව භික්ෂූන් වහන්සේ විසින් ස්වකීය දායක සමාජය විෂයෙහි නිතැතින් අනුශාසනා කළ යුතු වේ. සම්මා ආජීවයට කරුණු හතරක් ඇතුළත් වේ. අවි වෙළඳාම, මත් ද්‍රව්‍ය වෙළඳාම, මස් පිණිස සතුන් ඇති කිරීම, මස් වෙළඳාම එමගින් පිටු දැක ඇත. කුසල් දියුණු කිරීමත් අකුසල් බැහැර කිරීමත් සම්මා වායාමයෙන් අදහස් කෙරේ. මෙම කරුණු නිරතුරු ව සමාජයට සිහි කිරීම භික්ෂුවගේ ප්‍රධාන කාර්යභාර්යක් ලෙස දැක්විය හැකි ය.

භික්ෂුව සැමවිට ම පරිසර හිතකාමී පුද්ගලයකු වීම ධර්මයෙන් අපේක්ෂා කරයි. ශාක, සතුන් පමණක් නොව පස, ජලය, වාතය විෂයෙහි ද සංරක්ෂණකාමී ලෙස ජීවත්වීම බෞද්ධ ආභාසය යි. මෙම වත් පිළිවෙත් අනුගමනය කිරීමෙන් වාසයට ප්‍රියජනක වූත් මනා පාලනයකින් යුතු වූත් සමාජයක් නිතැතින් ම සකස් වේ.

## 05 ක්‍රියාකාරකම

01. නූතන සමාජය තුළ ඔබ ශිෂ්‍ය භික්ෂුවක ලෙස හෝ ශිෂ්‍යයකු ලෙස පාලනය වන ක්‍රමවේද පහක් ලියා දක්වන්න.

02. "තනි තනි ව ඔබ පාලනය වීම තුළින් ඔබ නියෝජනය කරන සමාජය ද පාලනය වෙයි" පිළිගත හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03. අවධිමත් සමාජ පාලනය විධිමත් සමාජ පාලනයෙන් වෙනස් වන්නේ කෙසේ ද?

04. සිරිත් (චාරිත්‍ර) කළ යුතු දෑ

    විරිත් (වාරිත්‍ර) නොකළ යුතු දෑ

    I සිරිත් පහක් නම් කරන්න.

    II විරිත් පහක් නම් කරන්න.

    III සමාජයේ යහපැවැත්මට මේවා දායකවන ආකාරය දක්වන්න.

05. පන්තියේ සියලු ම සිසුන් කණ්ඩායම් දෙකකට බෙදී පහත සඳහන් මාතෘකාව යටතේ විවාදයක් පවත්වන්න.

යෝජිත පිල සමාජ පාලනයට සාරධර්ම රැකීම ප්‍රමාණවත් වේ.

ප්‍රතියෝජක පිල සමාජ පාලනයට සාරධර්ම රැකීම ප්‍රමාණවත් නොවේ.

06. පහත සඳහන් ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

I. සමාජ පාලනයට අවශ්‍ය කරුණු වැඩි ප්‍රමාණයක් දකින සූත්‍ර දේශනාවක් වනුයේ, (සිඟාලෝවාද සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය, වසල සූත්‍රය) යි.

II. මහා විහාරික භික්ෂු සමාජය රාජ්‍ය පාලනය සඳහා රජුන්ට අනුශාසනා කළේ (දස පුණ්‍යක්‍රියා, දස රාජ ධර්මය, දස සිල් දීම, දස පාරමිතා) මගින් ය.

III. සාමණේර භික්ෂූන්වහන්සේ ගේ පාලනය (විනය) සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ විනය නීති වූයේ (දස සිල්, උපසම්පදා සිල්, පන්සිල්, සෙඛියා සිල්) වේ.

IV. භික්ෂුණී සමාජය විසින් ගිහි සමාජය උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය දැක්වෙන සූත්‍ර ධර්මය (සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, මංගල, පරාභව) සූත්‍ර ධර්මය වේ.

V. යහපත් දිවිපැවැත්ම අර්ථවත් කරන ආර්ය අෂ්ටාංගික මාර්ග අංගය (සම්මා ආජීව, සම්මා සමාධි, සම්මා සංකප්ප, සම්මා සති) වේ.

06

# සමාජ ප්‍රශ්න



## 6.1. සමාජ ප්‍රශ්න මොනවා දැයි හඳුනාගැනීම :

සමාජයක ඇතිවන විසංවිධානකාරී තත්ත්වය හෙවත් ප්‍රශ්න පිළිබඳ ව සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් අධ්‍යයනය කිරීමේ දී ලෝකයේ පවතින ප්‍රශ්න, පුද්ගල ප්‍රශ්න හා සමාජ ප්‍රශ්න වශයෙන් වර්ග කළ හැකි ය. මෙහි දී අවධානයට යොමු වන්නේ සමාජ ප්‍රශ්න පිළිබඳවයි. සමාජ ප්‍රශ්නයක ලක්ෂණ කීපයක් ඇති බව සමාජ විද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇත.

එනම්,

* එක් පුද්ගලයෙකුට නොව මුළු සමාජයට ම බලපෑම
* සමාජය තුළින් ම උපත ලැබීම
* සමාජයට අයහපත් ලෙස බලපෑම
* සමාජයේ වැඩි දෙනෙක් තුළ එය පිළිබඳ සාමූහික අවබෝධයක් තිබීම
* එය විසඳාලිය යුතුය, විසඳාලිය හැකිය, යන අවශ්‍යතාව, හා විශ්වාසය සමාජයේ වැඩි දෙනෙකු තුළ පැවතීම යන කරුණු ය.

මේ අනුව ශ්‍රී ලාංකික සමාජයේ ද ළමා අපයෝජනය, යාචක ප්‍රශ්නය, අපරාධ, ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය භාවිතය, දුගීබව, ආත්ම ඝාතනය, ජනවාර්ගික ප්‍රශ්න ආදී සමාජ ප්‍රශ්න ගණනාවක් ඇති බව හඳුනාගෙන තිබේ. සමාජ ප්‍රශ්න ගැන උනන්දු වන සමාජ විද්‍යාඥයින් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන සිටින බවත් පෙනේ. සමාජ ප්‍රශ්න පිළිබඳ ව අවධානය යොමුකරන විට එක් අයකුට පමණක් විශේෂ වන පුද්ගලික ගැටලුවක් සමාජ ප්‍රශ්නයක් නොවන බව දැක්විය හැකි ය. සමාජ ප්‍රශ්නයක් වීමට නම් සමාජයේ වැඩි පිරිසකට බල පෑ යුතු ය. එසේ ම සමාජයේ ජීවත්වන සමූහය අගය කරන කිසියම් විශිෂ්ටාර්ථයක් වේ නම්

එය බිඳ වැටීමට ලක්විය යුතු ය. එයට සමාජය විසින් ම උත්තර සපයා නිවැරදි පිළිතුරු සැපයීමට හැකියාව තිබීම ද වැදගත්කොට සැලකිය හැකි ය. සමාජ ප්‍රශ්නයක් විසඳීමට සමාජයට හැකියාව තිබිය යුතු ය. සමාජ සංස්ථාවේ හෝ පාලනයේ හෝ ප්‍රතිපත්තියේ වෙනසක් ඇතිකොට ප්‍රශ්නය විසඳීමට ඇති හැකියාව සමාජ ප්‍රශ්නයේ වැදගත් ම ලක්ෂණයකි.

සමාජ විද්‍යාඥයින් විසින් සමාජ ප්‍රශ්නයක් ඇතිවීමට බලපාන හේතු ගණනාවක් ද හඳුනාගෙන ඇත.

- යම් අවශ්‍යතාවයකට මුදල් හෝ ශ්‍රමය වැය කිරීමට ඇති නොහැකියාව
- මානසික තත්ත්වය
- දේශපාලන සම්බන්ධතා
- සමාජයේ පවතින නීතිරීති
- ශාරීරික දුබලතාවන්
- නූගත්කම

ඉහත කරුණු පිළිබඳ ව අවධානය යොමුකිරීමේ දී ඒවා මානසික හේතු හෝ සමාජමය හේතු මත පැන නගින බව හඳුනාගත හැකි ය. සමාජ අපගමනය බාලාපචාර, ආත්ම ඝාතනය වැනි ප්‍රශ්න මනෝ මූලික සාධක හේතුවීමෙන් හටගන්නා ඒවා බව පැහැදිලි ය. එමෙන් ම සමාජයේ පවතින නීතිරීති පිළිබඳ ව නොදැනුවත්කම ද සමාජ ප්‍රශ්න හටගැනීමට හේතු සාධක වශයෙන් හැඳින්විය හැකි ය. සමහර පුද්ගලයන් හට විධිමත් අධ්‍යාපනයක් නොලැබීම නිසා සමාජ අවශ්‍යතාවන් කරා ළඟා වීමට නො හැකි ය. එවැනි අවස්ථාවල දී සියදිවි නසාගැනීමට පවා පෙළඹිය හැකි ය.

යම්කිසි නිශ්චිත කණ්ඩායමකට එම ගැටලුව බලපාන්නේ නම් වැඩි දෙනෙක් ඒ ගැන කතා කරන්නේ නම් ලියන්නේ නම් හෝ විසඳුම් සෙවීමේ නිරතවන්නේ නම් එය සමාජ ගැටලුවක් සේ ඉස්මතු වී පවතියි. යම්කිසි කාලවකවානුවක මේ පිළිබඳ මහජනතාවගේ අවධානය වැඩි වී එය ක්‍රමයෙන් පැතිර යන තත්ත්වයක පවතී ද එවැනි ස්වභාවයක් සමාජ ප්‍රශ්නයක මූලික ලක්ෂණයක් වේ.

සමාජයේ ජීවත්වන්නන් සියලු දෙනා ම එක සමාන අදහස් දරන එක්වන් ක්‍රියාකලාපයක් අනුගමනය කරන පිරිසක් නොවේ. සමාජගත ව ඇති සිරිත් විරිත් නීති රීතිවලට ජනයා එක හා සමාන ව අනුගත

නොවෙති. මේ නිසා සමාජයේ එක්තරා පිරිසක්, තවත් පිරිසක් විසින් සමාජ විරෝධීන් ලෙස හෝ ක්‍රියාශීලි නොවන පිරිසක් ලෙස හෝ ආක්‍රමණශීලි පිරිසක් වශයෙන් නම් කිරීමට පුරුදුව සිටිති. සමාජයේ ඇති වී තිබෙන මෙම ප්‍රශ්න සමාජ විරෝධීන් නිසා හටගන්නේ ය යන ආකල්පය විවිධ සමාජ කණ්ඩායම් අතර, ආයතන අතර පැතිර පවතී. ජනයා ජීවත්වන්නේ සමාජය තුළ ය. ඔවුන් හැඩගැසෙන්නේ සමාජය තුළ ය. එසේ නම් සමාජ විරෝධීන් නිසා සමාජ ප්‍රශ්න ඇතිවනවාට වඩා සමාජ ප්‍රශ්න නිසා සමාජ විරෝධීන් ඇතිවීමේ ප්‍රවණතාව වැඩි වී ඇතැයි ද විශ්වාසයක් පවතී.

## 6.2. දුගී බව සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන ඒ පිළිබඳ ව හැදෑරීම

### දුගී බව යනු කුමක් ද?

දුප්පත්කම, දිළිඳු බව, නැතිබැරිකම ආදී නම්වලින් ද හැඳින්වෙන්නේ දුගීබව ය. මානව සමාජයේ ආරම්භයේ සිට ම මෙම දුගීබව පැවති බවට සාධක තිබේ. දුගීබව මනින්නේ කෙසේ ද? යන ප්‍රශ්නයට සමාජ විද්‍යාඥයන් නිශ්චිත පිළිතුරක් තවමත් ලබා දී නොමැත. පුද්ගලයෙකුගේ මූලික අවශ්‍යතාවන් හි ප්‍රමාණයටවත් සම්පත් නොමැති නම් එය දුගීබවෙහි ලක්ෂණයක් ලෙස හඳුනා ගෙන තිබේ.

යම් රටක සමාජ අසමානතාවයක් ඇති වී තිබේ නම් දුගීබව ඒ තුළින් ඇති වේ. එවැනි සමාජයක සාමාන්‍ය ආදායම් ප්‍රමාණයට වඩා අඩු ආදායම් ලබන පිරිස දුගී ජනතාව වශයෙන් හඳුන්වයි.

දුගීබව පිළිබඳ **පීටර් ටවුන්සන්ඩ්** (Peter Townsend) විසින් සිදුකරන ලද අධ්‍යයනයක් මගින් අනාවරණය කර ඇත්තේ තෝරාගන්නා ලද සමාජයක දෙන ලද කාලවකවානුවක් තුළ දුගීබව හඳුනාගැනීම කළ නොහැකි බව ය. තවදුරටත් ඔහු ප්‍රකාශ කරන්නේ දුගීබව නිර්වචනය කළ හැකි මාර්ග තුනක් ඇති බව ය.

- රාජ්‍ය මට්ටමින් දුගීබව හඳුනාගැනීම

රාජ්‍ය අංශය මගින් කරන ලද සමීක්ෂණ තුළින් ලබාගෙන ඇති තොරතුරු භාවිත කළ හැකි බව මෙහි දී අවධාරණය කර ඇත.

- ආදායමේ සාපේක්ෂ ප්‍රමිතිය මගින් දුගීබව ගණනය කිරීම

මේ යටතේ දුගීබව ගණනය කළේ පවුල්වල සාමාන්‍ය ආදයම් ගණනය කිරීමෙනි. සාමාන්‍ය ආදයම් සීමාවට පහළ ආදයම ලබන පවුල් තෝරා ඒවා දුගී පවුල් ලෙස සලකන ලදී.

- සාපේක්ෂ් අභිම්භාවයට පත්වීම

පුද්ගලයෙකුට ජීවත්වීම සඳහා භෞතික සහ මානසික අවශ්‍යතා සපුරාගැනීමට සිදු වේ. කිසියම් හේතුවක් නිසා එම අවශ්‍යතා ලබා ගැනීමට නොහැකි වුවහොත් ජීවත්වීම දුෂ්කර කාර්යයක් බවට පත් කරයි.

දුගීබාවයට ප්‍රධාන හේතුව වශයෙන් සලකනු ලබන්නේ ආදායම දුර්වල තත්ත්වයක පැවතිමයි. රටක ජාතික ආදායම පහළ තත්ත්වයක පවතින්නේ නම් එම රටවැසියන්ගේ පවුල්වල ආදායම් ද පහළ තත්ත්වයේ පවතින බව පැහැදිලි ය. එසේම පවුලක ආදායම කෙරෙහි සමාජයේ පවතින විවිධ සංස්කෘතික හේතු ද ඍජු බලපෑමක් කරයි. ආදායම, ලබාගන්නා ක්‍රම මෙන් ම ලැබෙන ආදායම වියදම් කරන්නේ කුමකට ද යන්නත් එසේ වියදම් කිරීමෙන් පවුලේ ආර්ථිකය වර්ධනය සිදු වන්නේ ද? ආර්ථික ස්ථාවර තත්ත්වයක පවත්වා ගැනීමට හැකිවන්නේ ද? යන්නත් පිළිබඳ විමසා බැලීම වැදගත් වේ.


ශ්‍රී ලංකාවේ දුගීබව වඩාත් කැපී පෙනෙන මට්ටමට වර්ධනය වී ඇත්තේ ඇතැම් පවුල්වල ආදායම නිසියාකාරයෙන් පරිහරණය නොකිරීම හේතුවෙනි. සමහර අය ලැබෙන මිල මුදල් වැඩි වශයෙන් වැය කරන්නේ මත්ද්‍රව්‍ය සහ අනවශ්‍ය විනෝද කටයුතු සඳහා ය. මෙහි ප්‍රතිඵලය වන්නේ ඉතා කෙටි කාලයක් තුළ ඔවුන්ගේ ආර්ථිකය කඩා වැටි දුගීබවට පත්වීමයි.

දුගීබව සනාථ කරන තවත් ලක්ෂණයක් වන්නේ ප්‍රමිතියට අනුව සැකසුණ නිවසක් නොමැතිවීමයි. මෙම ලක්ෂණය ග්‍රාමීය ප්‍රදේශවල මෙන් ම නාගරික ප්‍රදේශවල ද දක්නට හැකි ය. නාගරික ප්‍රදේශවල ඇති පැල්පත් හා මුඩුක්කුවල ප්‍රමිතිය ඉතා දුර්වල මට්ටමක පවතී. මෙම නිවාසවලට අත්‍යවශ්‍ය පහසුකම් වන ජලය, සෞඛ්‍ය වැනි සාධක පවා ඉතාම දුර්වල මට්ටමක පවතින බව සත්‍යයකි. එවැනි මුඩුක්කු සහිත නිවාස පැවතිම දුගීබව සනාථ කරන සාධක බව පිළිගත හැකි ය.

ශ්‍රී ලංකාවේ ජනතාවගේ දුගීබව අවම කිරීම සඳහා ගනු ලැබූ ප්‍රයත්නයන් අති විශාල ය. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් විශාල මැදිහත්වීමක්

සිදුකර ඇත. ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපන හා සුභසාධක අංශයන් හි සිදු වූ මෙම මැදිහත්වීම නිසා භෞතික හා ගුණාත්මක ජීවන දර්ශකයන් ඉතා ඉහළ තත්ත්වයක් පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ සාක්ෂරතාව 90% කට වැඩි මට්ටමක පවතී. අපේක්ෂිත සාමාන්‍ය ආයු කාලය අවුරුදු 70කි. ළදරු මරණ සංඛ්‍යාව 1000කට 25ක් තරම් අඩු අගයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ රජයන් විසින් දුගීබව අවම කිරීම සඳහා නොයෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අතර ජනසවිය, උදාගම් සංකල්පය, සමෘද්ධි ව්‍යාපාරය වැනි වැඩසටහන් ප්‍රමුඛ වේ. මේ තත්ත්වය මත ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ලබන රජයක් බවට පත් වී තිබේ. දුගීබව පිළිබඳව කථා කිරීමේ දී වැදගත් සංකල්ප ගණනාවක් සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත්කර ඇත. ඒ අතරින් **රැග්නාර් නර්ක්ස්** නම් අර්ථ ශාස්ත්‍රඥයා විසින් ඉදිරිපත් කළ දුගීබවේ විෂම චක්‍රය පිළිබඳ සංකල්පය එක් අදහසකි.




සුප්‍රකට සමාජ විද්‍යාඥයකු වන **හර්බට් ස්පෙන්සර්** (Herbert Spencer) දුගී අය අනාචාරයේ ජීවත්වන්නන් ලෙස හැඳින්වූ අතර සොරකම් කිරීම, කපටිකම වැනි දෑ මෙම පිරිසේ සාමාන්‍ය ලක්ෂණ බව සඳහන් කර ඇත. මෙවැනි කටයුතුවල යෙදෙන අයට සහනාධාර දීම වැරදි බව ද ස්පෙන්සර් සඳහන් කර ඇත. එබැවින් රජය විසින් දුගියන්ට සහනාධාර සැපයීම සමාජය තුළ කම්මැලිකම වර්ධනය වීමට හේතු වන බව ඔහු කියයි. දුගියනට සහන සැපයීම ආර්ථිකයක වර්ධනයට අයහපත් ලෙස බලපාන බව ස්පෙන්සර්ගේ පැහැදිලි කිරීම වේ.

දුගීබව තනි පුද්ගලයන්ගේ ලක්ෂණයකට වඩා පවුලක ම ලක්ෂණයක් බව පිළිගෙන ඇත. එයින් අදහස් කරන්නේ දුගීබව තනි පුද්ගලයකුගේ වරදකින් නිර්මාණය වූවක් නොව සමාජයේ බොහෝ දෙනාගේ අඩුපාඩු මත නිර්මාණය වූවක් බවයි.

සැලසුම් සහගත ලෙස ක්‍රියා නොකිරීම දුගීබව වැඩිවීමට හේතු වන අතර එය තිබෙන දුගීබව දිගින් දිගට ම පවතින්නට ද ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත. එමෙන් ම රාජ්‍ය අංශය ද සැලසුම් සහගත ව කටයුතු කිරීමට ඉදිරිපත් වීම අත්‍යවශ්‍ය ය. දුගී ජනතාවට සිය ජීවිතය සැලසුම් කරගැනීමට මග පෙන්වීම විවිධ අංශ ඔස්සේ සිදු කළ යුතු ව ඇත. මුදල් ඉපයීම, අරපිරිමැස්ම, දූ දරුවන් හදාවඩා ගැනීම, අනාගත බලාපොරොත්තු ඇති කරගැනීම යනාදිය මෙයට ඇතුළත් වේ.

දුගීබව පිටුදැකීමට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන උපාය මාර්ග බොහොමයක් වේ. ඒවා සමාජය තුළ වෙනසක් ඇති කරන්නේ ඉතා ම අඩු වේගයකිනි. ජනසවිය, සමෘද්ධි ව්‍යාපාරය වැනි "නැති බැරි අය ඇති හැකි අය කිරීමේ" සංකල්ප තුළින් බලාපොරොත්තු වූ වෙනසක් ඇති වූයේ ඒ ඉතා මද වශයෙනි. එබැවින් එම උපාය මාර්ග වෙනස්කර වේගවත් ගමන් මඟට ප්‍රවේශ විය යුතු ව ඇත.

මේ අනුව සැලකීමේ දී දුගීබව වර්තමානයේ පවතින ප්‍රධාන ප්‍රශ්නයක් වී ඇති බව සනාථ වේ. එම ගැටලුව විසඳීම සඳහා ආත්ම ධෛර්යයකින් යුතු ව කටයුතු කරනවා වෙනුවට දෛවයට, ඉරණමට, හෝ කර්මයට භාර දී නිහඬව සිටීම ප්‍රශ්නයට විසඳුමක් නොවේ.

දුගීබවට පත් පුද්ගලයා ද දුගීබවෙන් ජාතිය ද මුදවාගැනීමට ක්‍රියා කරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, මණ්ඩල සහ සංස්ථා යන ඒකක නැතහොත් රාජ්‍ය ආයතන ද මේ සඳහා ක්‍රියාත්මක විය යුතු වේ. රටේ සංවර්ධනය යනු දුගීබවෙන් මිදීම හෙවත් මුදවාගැනීම සඳහා සෑම සමාජ ඒකකයක් ම එකම අධිෂ්ඨානයකින් ක්‍රියා කිරීම ය. එවිට රටේ දුගීබව තුරන් වෙයි. සමස්තයක් වශයෙන් රට සංවර්ධනය වෙයි.

## 6.3. වයස් ගතවුවන් පිළිබඳ තත්ත්වය සමාජ ප්‍රශ්නයක් ලෙස විමසා බැලීම

මහලු වීම ජීවවිද්‍යාත්මක ක්‍රියාවලියකි. එය සෑම ජීවියෙකුට ම සාධාරණ වූ ධර්මතාවකි. වර්තමානයේ සමාජය ඉදිරියේ ඇති විශාල අභියෝගයක් නම් මිනිසා බොහෝ වයස්ගත වන තුරු ජීවත්වීම නිසා

උද්ගතවන සමාජ ගැටලුයි. මෙම තත්ත්වය ඇතිවන්නේ අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍රවල දියුණුව නිසයි. මෙම ක්‍රියාවලිය ගැන සමාජ විද්‍යාත්මක මතවාද සොයා බැලීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ රැසක් බිහි වී ඇත. ඒ අනුව වයස්ගතවූවන් බහුල වීම සමාජ ප්‍රශ්නයක් බවට පත් වී ඇති බව පැහැදිලි කර ඇත.

වයස්ගතවූවන් කෙරේ දක්වන සමාජ ආකල්පය සහ ඔවුන්ට සලකන ආකාරය සමාජයෙන් සමාජයට යුගයෙන් යුගයට සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වේ. සමහර සංස්කෘතීන්ට අනුව වයස්ගත පුද්ගලයන් බොහෝ ගෞරවයට පත් වන්නන් වන අතර සමහර අයට අත්වන ඉරණම කනගාටුදායක ය.

වයස්ගතබාවය එක් ප්‍රදේශයකට හෝ සමාජයකට සීමා වුවක් නොවේ. එබැවින් මෙම ගැටලුව පිළිබඳ ව එක් දෘෂ්ටි කෝණයකින් කරුණු අධ්‍යයනය කළ නො හැකි ය. එහෙත් ඊට විශ්වීය නිර්වචනයක් ඉදිරිපත් කිරීම ද උගහට ය. අධ්‍යාපන මනෝවිද්‍යාඥයකු වූ **පියාජේ** විසින් වයස්ගත වීම නිසා පෞරුෂ අසාමාන්‍ය හැසිරීමක් දක්නට ලැබෙන බව ප්‍රකාශ කර ඇත.

තුන්වන ලෝකයේ රටවලට බලපාන ආර්ථික ගැටලු නිසා වයස්ගත සාමාජිකයන්ගේ වැඩි වීම ප්‍රබල ප්‍රශ්නයක් වී ඇත. ඔවුන් රැක බලාගැනීම සාත්තු සප්පායම් කිරීම වත්පොහොසත්කම් නැති සමහර දූ දරුවන්ට තම වයෝවෘද්ධ දෙමාපියන් බරක් ලෙස සලකා ඔවුන්ට නොසලකා සිටිම නූතනයේ බොහෝ විට දක්නට ඇත. එවැනි වයෝවෘද්ධ අයව නිවසින් පිටමං කිරීම ද තවත් සමාජවල දක්නට ලැබෙන ලක්ෂණයකි. මේ අයුරින් පිටමං කරන ලද වයස්ගත වූ දෙමාපියන්, වැඩිහිටියන්, රැක බලාගැනීම සඳහා ඇති වී තිබෙන වැඩිහිටි නිවාස නඩත්තු කිරීම, ඒවා කාර්යක්ෂම ව පවත්වාගෙන යෑම වැනි ගැටලු රාශියක් ද මතු වී ඇත. සමාජයෙන් හිමිවිය යුතු වරප්‍රසාදයන් වයෝවෘද්ධයන්ට නිසි ආකාරයෙන් නොලැබීම ද ගැටළු සහගත බවක් ඇති කිරීමට හේතු වී තිබේ.

වයස හා සම්බන්ධව කරුණු විමර්ශනය කිරීමේ දී ස්ත්‍රී පුරුෂභාවය ද වැදගත් කරුණක් වශයෙන් ගෙන හැර දැක්විය හැක. පිරිමින්ට වඩා කාන්තා පක්ෂයේ ආයු කාලය වැඩි බව මානව විද්‍යාඥයින්ගේ තොරතුරු විශ්ලේෂණයේ දී පැහැදිලි වේ. මේ අයුරින් සමාජ විද්‍යාත්මකව වයස්ගත බාවය පිළිබඳ ව පර්යේෂණ ඉතා විශාල පරාසයක පැතිර ඇති හෙයින් එම පර්යේෂණවල නිගමන එකම දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කිරීම ද උගහට ය.

වයස්ගතවූවන් පිළිබඳව කරන ලද පර්යේෂණවල දී හෙළි වී ඇති කරුණු අනුව ලොව ජීවත්වන සෑම දහදෙනෙකුට ම වයස්ගතවූවන් එක් අයෙකු සිටි. 2050 වන විට මෙම ගණන සෑම පස්දෙනෙකුට එක් අයකු වන බව විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. මේ වයස්ගතවූවන්ගේ වර්ධනය හේතුවෙන් සමාජ ආර්ථික රටාවට විශාල බලපෑමක් සිදුකරනු ඇත. ඒ අය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සෞඛ්‍ය තත්ත්වය රැකගැනීමට පියවර ගැනීම, නිවාස සම්පාදනය පිළිබඳ ගැටලුව මතු විය හැක. මෙය දේශපාලන ක්ෂේත්‍රය තුළ ද කැපී පෙනෙන ගැටලුවක් බවට පත්වනු ඇත. එපමණක් නොව නොයෙකුත් රෝගාබාධයන්ට ලක්වීම, අතපය වාරු නැතිවීම, මානසික දුබලතා ආදිය නිසා බාහිර සමාජයත් සමග කටයුතු කිරීමෙන් ඈත් වේ. මේ හේතුව නිසා ඔවුන්ට තම නිවස තුළට වී ජීවිතයේ වයෝවෘද්ධ කාලය ගතකිරීමට සිදුවනු ඇත. මේ නිසා වෙනත් සමාජ ප්‍රශ්නවලට ද ඔවුන් ලක්වනු ඇත. ඔවුන් එතෙක් දැරූ සමාජ තත්ත්වයන්ගෙන් ඈත්වීම හේතුවෙන් ඇතිවන මානසික ආතතිය නිසා සිය දිවි නසා ගැනීමට පවා පෙළඹෙන බව මනෝ විද්‍යාඥයින්ගේ අදහසයි.

වයස්ගතවූවන් පිළිබඳ ගැටලුව ශ්‍රී ලංකා සමාජයට බලපා ඇත්තේ කවරාකාරයෙන් ද යන්න තවදුරටත් විමසා බලමු. එහි දී ශ්‍රී ලංකාව ආශ්‍රිත ව ජන විකාශන විද්‍යාත්මක සාධක රැසක් ම විමසා බැලීමට සිදුවේ. එහි දී වයස් ගතවූවන්ගේ ජනගහන අනුපාතය වැඩිවීමේ සාධකය වැදගත් සංසිද්ධියක් වනු ඇත. 1981 සහ 2011 දී කරනු ලැබූ ජන සංගණනයට අනුව වයෝවෘද්ධ ජනගහනයේ වැඩිවීම 6.6% සිට 13.1% දක්වා විශාල ප්‍රතිශතයකින් වර්ධනය වී තිබේ. මෙය සැලකිය යුතු වැඩිවීමකි. එසේ ම 2036 පමණ වන විට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 72% ක් වයෝවෘද්ධ පුද්ගලයන් වන බව අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ වාර්තාවලට අනුව ද වැඩි ම යැපෙන්නවුන් සිටින රටවල් අතර ප්‍රධාන ස්ථානයක් ශ්‍රී ලංකාවට හිමි වේ.ශ්‍රී ලංකා මහ බැංකු සංඛ්‍යා ලේඛන අනුව සලකා බැලීමේ දී ද මේ තොරතුරු තව දුරටත් සනාථ කරගත හැකි ය.

දළ උපත් අනුපාතික ජනගහනය 1000 කට 18.4 (2009)

දළ මරණ අනුපාතික ජනගහනය 1000 කට 5.9 (2009)

යැපීම් අනුපාතික 48.3% (2006)

මේ තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී ද පැහැදිලි වන්නේ ඉහත සඳහන් කරුණුවල සත්‍යතාවයයි.

ශ්‍රී ලංකාවේ වයස්ගතභාවයට පත්වීම ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු වී ඇති සාධක පිළිබඳව ද සලකා බැලිය යුතු වේ. ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීමට බලපා ඇති ප්‍රබලතම හේතු සාධකය වන්නේ මෙහි ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන ක්‍රියාවලියයි. ශ්‍රී ලංකාවේ වැඩිහිටි සුභසාධනයේ දී සෞඛ්‍ය පහසුකම් ලබාදීම ඉතා හොඳින් ක්‍රියාත්මක වේ. එසේම සාක්ෂරතාවය සාමාන්‍ය 91.3% (2008) වැනි ඉහළ තත්ත්වයක පැවතීම ද හේතුවක් වශයෙන් දැක්විය හැකි ය. එමෙන් ම සංස්කෘතිය හා බැඳුණු වැඩිහිටියන්ට සැලකීම, රැකබලාගැනීම ඉතා හොඳින් සිදුවන බැවින් මෙම වයස්ගතභාවයේ වර්ධනයක් දක්නට ලැබේ. විශ්‍රාම වැටුප් ක්‍රමය ද මෙම තත්ත්වයට සාධකයක් වී ඇත.

එසේ වුවත් වර්තමාන සමාජ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියේ වයස්ගතවීම යනු පුද්ගලයාට බොහෝ දේ අහිමිවීමකි. පැරණි සමාජයේ දක්නට ලැබුණු පවුල වැනි බහු කාර්ය ආයතන වෙනුවට නූතන සමාජයේ දක්නට ඇති යම් යම් සුවිශේෂ ආයතන තුළ වයස්ගතවූවන් සතු කාර්යය සීමා වී ඇත. මෙසේ සීමාකිරීම සිදු වුව ද වයස්ගතවූවන් වෙනුවෙන් වැය කළ යුතු මුදල් සම්භාරය අතිවිශාල ය. එය රාජ්‍ය අයවැයට කරනු ලබන කිසියම් බලපෑමකි.

මහලු වීම නොවැළැක්විය හැක්කක් බැවින් ඔවුන්ගේ පැවැත්ම සමාජයට ප්‍රශ්නයක් සිදු නොවන ආකාරයට හැඩගස්වා ගැනීමට හැකි තත්ත්වයක් නිර්මාණය කළ යුතු වේ. මාපිය - දූ දරු සම්බන්ධය මෙහි දී ඉතා වැදගත් වන අතර රජය මගින් ද සෞඛ්‍ය හා පෝෂණ කටයුතු වර්ධනය කිරීමත් සමාජ ආරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමත් අගය කළ යුතු ක්‍රියාදාමයන් ලෙස දැක්විය හැකි ය.

## 6.4 මෙම සමාජ ප්‍රශ්න සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය හා ඒ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්

සමාජය තුළ හටගෙන ඇති යම් තත්ත්වයක් සමාජයේ බහුතරයකට බලපෑම් කරන්නේ නම් එයට සමාජය තුළින් විසඳුම් සෙවිය හැකි බව පිළිගැනේ නම් එය සමාජ ප්‍රශ්නයක් ලෙස හැඳින්විය හැකි ය. මානව සමාජයේ ආරම්භයේ සිට ම සමාජ ගැටලු තිබෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය.

පැරණි සමාජය තුළ පැවති ගැටලු එතරම් සංකීර්ණ නොවුණත් එම ගැටලු විසඳීමට ද නොයෙකුත් උපක්‍රම භාවිත කර ඇත. ශ්‍රී ලංකාවේ පවතින සමාජ ගැටලුවලට පවතින රජය විසඳුම් ලබාදීමට කටයුතු කරන අතර බුදුදහමේ දායකත්වය ද ඉතා මැනවින් ලබා දෙන බව පැහැදිලි ව පෙන්වා දිය හැකි ය.

ඉහත දී සාකච්ඡා කළ ශ්‍රී ලංකාව තුළ පවතින දුගීබව හා වයස්ගතබව යන සමාජ ප්‍රශ්නවල දී ශ්‍රී ලංකාව ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග හා බුදුදහම මගින් ලැබෙන පිටුවහල පිළිබඳ ව විමසා බැලිය යුතු වේ. මූලික වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධන වෙමින් පවතින රටකි. එවැනි රටකට මෙ වැනි සමාජ ප්‍රශ්නවලට මුහුණ දීමේ දී බරපතල ආර්ථික ගැටලු ඇතිවේ. දුගීබව හා වයස්ගතබව නිසා මතුවී තිබෙන ගැටලු විසඳීම සඳහා රජයේ අයවැයෙන් විශාල මුදලක් වෙන් කිරීමට සිදු වී තිබේ. ඔවුන්ගේ සුභසාධනය, සෞඛ්‍යය, හා නිවාස සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. අඩු ආදායම් ලාභී ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක සමෘද්ධි ව්‍යාපාරය මගින් දුගීබව අවම කරගැනීම සඳහා උත්සාහ ගෙන ඇත. එමෙන් ම ඔවුන්ට සමෘද්ධි බැංකු මගින් ස්වයං රැකියා වෙනුවෙන් ආධාර උපකාර ලබාදීම මගින් ද බලාපොරොත්තු වන්නේ තරමක් දුරට හෝ දුගීබවට විසඳුම් සෙවීමටය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තයයි. ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් 70%ක් පමණ ග්‍රාමීය ජනයා වන අතර ඔවුන් කෘෂිකර්මාන්තය පදනම් කරගත් රැකියාවල නිරත වන අය වෙති. ඔවුන් අතරින් වැඩිදෙනා අඩු ආදායම් ලාභීන් ය.

කෘෂිකර්මාන්තය සඳහා අත්‍යවශ්‍ය ම සාධකය වන්නේ භූමියයි. ඉඩම් හිඟය ග්‍රාමීය ප්‍රදේශවල දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් බැවින් ශ්‍රී ලංකාවේ පැවති රජයන් විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ මගින් ඊට පිළියම් සෙවීමට උත්සාහ ගෙන ඇත. එහෙත් ඒවායේ පැවති විවිධ අඩුපාඩුකම් නිසා අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී ඇත. එපමණක් නොව කෘෂි නිෂ්පාදනවල මිල අස්ථාවර වීමත්, කෘෂි උපකරණවල මිල වැඩිවීමත් නිසා ගොවි ජනතාව අසීරු තත්ත්වයන්ට මුහුණ පා සිටී. මේ කරුණු පිළිබඳ සලකා යම් තරමකින් හෝ දුගීබව අඩු කිරීමට පොහොර සහනාධාර ක්‍රමය, සම්මත මිල ක්‍රමයක් හඳුන්වා දී තිබීම වැනි ක්‍රියාමාර්ග ගොවියාට යම් සහනයක් වී තිබේ.

ශ්‍රී ලංකාවේ පවතින තවත් සමාජ ප්‍රශ්නයක් වන්නේ වයස්ගතවූවන් බහුල වීමයි. අවුරුදු 60 ඉක්ම වූ ජනයා වයස්ගතවූවන් සේ සැලකේ. මෙම

කොටසට අයත් ජනයා ඉතා ශීඝ්‍රයෙන් පසුගිය වසර 10 තුළ වර්ධනය වී ඇති බව සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි. ශ්‍රී ලංකාවේ මෙය සමාජ ප්‍රශ්නයක් බවට පත් වී ඇත.

ශ්‍රී ලංකාවේ මෑතක සිට දැකිය හැකි ගම අතහැර නගරයට යාම, විදේශ රටවලට යාම ආදිය නිසා වයස්ගතවූවන්ට ගම්වල හුදකලා ජීවිත ගත කිරීමට සිදුවීමේ අවස්ථාව බහුල වී ඇත. එසේ ම මෙතෙක් ශ්‍රී ලංකාවේ වයස්ගතවූවන් රැකබලා ගැනීමේ කාර්යයේ පෙරමුණ ගත් කාන්තා පක්ෂය වැඩි වැඩියෙන් රැකියාවල නියුක්තවීම ද වයස්ගතවූවන් රැකබලාගැනීම පිළිබඳ ප්‍රශ්නය උග්‍ර කරවන්නක් වී ඇත. අප රටේ සාම්ප්‍රදායික සමාජයේ වයස්ගතවූවන් ජීවිත කාලය තුළ ලද අත්දැකීම්, දැනුම් සම්භාරය ඉතා ඉහළ තත්ත්වයක පැවති හෙයින් ඔවුන් බුද්ධි භාණ්ඩාගාර ලෙස සැලකේ. දේශපාලන ආගමික හා එදිනෙදා කටයුතුවල දී මුල්තැන ඔවුන්ට හිමි විය. එහෙත් සමාජයේ වෙනස්වීමක් සමග සාම්ප්‍රදායික බහුකාර්ය සමාජයේ දී හිමිවූ ඔහුගේ කාර්ය භාරය වැදගත් කමෙන් අඩු විය. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජයේ දිගුකාලීන අත්දැකීම් ඇසුරෙන් ලැබූ විශේෂිත වූ දැනුම නූතන සමාජයේ තරුණයෙකු ඔහුගේ තරුණ වියේ දී ම විශේෂිත වූ පුහුණුවක් තුළින් ලබාගනී. පැවති සාම්ප්‍රදායික සමාජයේ දී එය හිමිවූයේ වයෝවෘද්ධයන්ට පමණි. මේ නිසා මහල්ලන්ගේ අදහස්, දක්ෂතා යල්පැන ගිය ඒවා බවට පත් වේ.

ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් වෙනුවෙන් වැඩිහිටි සංවිධාන පිහිටුවා ඒ අයගේ මානසික මට්ටම බිඳවැටීමේ අවදානමෙන් තොරව පවත්වාගැනීමට නොයෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. විශ්‍රාම වැටුපක් ලබාදීම, මහජන ආධාර වැනි සුබසාධක ක්‍රම පවත්වාගෙන යෑම, රෝහල්වල විශේෂ කවුළු විවෘත කර ඔවුන්ට පහසුකම් සලසා දීම, බැංකු මගින් ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් හඳුන්වාදීම සහ වැඩිහිටි දින සැමරීම ආදිය මේ අතර වෙයි. මෙවැනි ක්‍රියාදාමයන් වයෝවෘද්ධ අය වෙනුවෙන් ක්‍රියාත්මක කර එය සමාජ ගැටලුවක් නොවන ආකාරයෙන් විසඳීමට උත්සාහ ගෙන ඇත.

### එම සමාජ ගැටළු නිරාකරණයට බුදුදහමේ දායකත්වය : (දුගීබාවය හා වයස්ගතවූවන් පිළිබඳ)

සමාජ ගැටලුවක ලක්ෂණ හඳුනාගැනිමේ දී මුළු මහත් සමාජයට ම එයින් බලපෑමක් සිදු කරන බව පැහැදිලි ය. එවැනි බලපෑම්වලට ලක්වන දුගීබව හා වයස්ගතවූවන්ගේ ගැටලුවට බෞද්ධ ඉගැන්වීම් කෙතෙක්

දුරට උපයෝගී කරගත හැකි දැයි විමසා බැලිය යුතු වේ. බෞද්ධ සූත්‍ර රාශියක් මේ සඳහා උපයෝගී කරගෙන කරුණු සනාථ කළ හැකි ය. එහි දී මහා මංගල සූත්‍රය, පරාභව සූත්‍රය, කූටදන්ත සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය, කෙරෙහි අවධානය යොමු කළ හැකි ය. බෞද්ධයා දුකත් දුකට හේතුවත් මැනවින් තේරුම්ගෙන දුක නැතිකර ගැනීමට ගන්නා මාර්ගය පැහැදිලි කරගන්නා අන්දමට සමාජ විග්‍රහය ද සිදුවිය යුතු ය. පළමුවෙන් ම සමාජ තත්ත්වයන් මනා ව අවබෝධ කරගත යුතු ය. ගැටලුවට මුල් වූ හේතු සාධක නැති කර දැමීම සඳහා මගක් සෙවිය යුතු ය. සමාජ ප්‍රශ්නයක් පිළිබඳ ව බෞද්ධ හේතුඵල සංකල්පයට අනුව බැලිය යුත්තේ ඒ ආකාරයෙනි.

ඒ අනුව දුගීබාවය හා වයස්ගතවූවන්ගේ ගැටලුව පිළිබඳව ද මනාව අවබෝධ කරගත යුතු ය. ඒ පිළිබඳ මැනවින් අවබෝධයක් ලබා ගන්නා තෙක් ගැටලුවලට විසඳුම් සෙවිය නොහැකි ය. ඒ පිළිබඳ ව බහුවිධ දෘෂ්ටිකෝණයකින් බලන්නට හැකියාව තිබිය යුතු වේ. මනා ඉවසීමක් හා අනුකම්පාවක් ඇති කරගත යුතු වේ. මේ බහුවිධ දෘෂ්ටිකෝණය වන ඉවසීම හා අනුකම්පාව යන බෞද්ධ චින්තනය මෙහි දී උපයෝගී වී තිබේ. තමන් දකින දේ අනුකම්පාවෙන් දැකීම මෙන් ම ඒ දේ තුළ එකිනෙකාට ඇති සම්බන්ධතාව ගැන ද බෞද්ධ දර්ශනය අපට උගන්වයි.

සියලු සංස්කාර ධර්මයන් වෙනස්වන සුලු නිසා සමාජය ද වෙනස් වෙයි. මේ වෙනස්වීම අමුතු දෙයක් නොව ස්වභාවික ලක්ෂණයකි. මේ ලක්ෂණ මහලු විය තුළ ද දක්නට ලැබේ. මිනිසා ළමා කාලය, යොවුන් විය, මැදි විය පසුකර වයස්ගතබාවයට පත් වේ. ඒ අනුව හැම දෙයක් ම අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ධර්මතාවය මගින් වටහාගත හැකි ය. ශ්‍රී ලංකාවේ පවතින වයස්ගතබාවය නැමති ගැටලුව බුදුදහම අනුව සලකා බලන විට එතරම් බරපතල බවක් දක්නට නොලැබේ. මහා මංගල සූත්‍රයේ එන පරිදි (මාතා පිතු උපට්ඨානං), මව්පියන්ට උපස්ථාන කිරීම රැක බලාගැනීම මංගල කාරණයක් බව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර ඇත. ඒ අනුව සෑම දූ දරුවෙක් ම කටයුතු කරත් නම් වයස්ගත වූ අයට නිසි රැකවරණයක් ලැබේ. සිඟාලෝවාද සූත්‍රයෙහි දරුවන්ගේ කාර්යභාරය පැහැදිලි කිරීමේ දී දෙමව්පියන් කෙරෙහි කරුණු පහකින් යුතුකම් ඉටු කළ යුතු බව දක්වා ඇත.

- මවුපියන් පෝෂණය කිරීම
- මවුපියන්ගේ කටයුතු කරදීම
- මවුපියන් දෙන දායාදය රැකීම

- මවුපියන්ගේ කුල ගෞරවය රැකීම
- මවුපියන් මිය ගිය කල්හි පින් අනුමෝදන් කරවීම

මෙම කරුණු පහ කාර්යභාර පහට අයත් ය. මෙහි දී වයෝවෘද්ධ අය පෝෂණය කිරීම, රැකබලා ගෙන ඔවුන්ගේ කටයුතු කරදීම, දුර්වල අවස්ථාවේ දී උදව් කිරීම මැනවින් සිදු වේ නම් වයස් ගතවූවන්ගේ ජීවිත සුරක්ෂිත වනු ඇත. ඔවුන් මානසික ආතතියෙන් වළක්වා ගැනීමට මහත් පිටුවහලක් වනු ඇත. එසේ ම දෙමාපියන්ගෙන් දරුවන්ටත් දරුවන්ගෙන් දෙමාපියන්ටත් සිදුවිය යුතු යුතුකම් මැනවින් ඉටු වේ නම් සමාජානුයෝජනය ක්‍රියාවලිය ද මැනවින් සිදුවෙන බව පෙන්වා දිය හැකි ය.

සමාජ ප්‍රශ්න බොහෝ විට ඇති වන්නේ මිනිසුන් අතර යුතුකම් හා අයිතිවාසිකම් නිසි පරිදි ඉටු නොවන නිසා ය. මේ හේතුව නිසා විවිධ වූ මතභේදවලට ලක් විය හැකි අවස්ථා ඇති වේ. තම මුදල් නිසි ලෙස පාලනය කර නොගැනීම හේතු කොටගෙන දුගීබාවයට පත්වන්නට පුළුවන. මුදල් නියමාකාරයෙන් පරිහරණය කරගැනීමේ වැදගත්කම සිඟාලෝවාද සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය වැනි බෞද්ධ සූත්‍රවල පෙන්වා දී තිබේ. විශේෂයෙන් අරපිරිමැස්මෙන් සරල දිවි පෙවෙතක් ගතකිරීමේ වැදගත්කම මෙම සූත්‍ර තුළින් පැහැදිළිව දක්වා ඇත. ඒ තුළින් ආර්ථික සුරක්ෂිතාව මගින් දුගීබාවය නැමති සමාජ ගැටලුවට විසඳුමක් ලබා ගත හැකි ය.

දුගීබාවයට හා වයස්ගතබාවයට පත් වූ බොහෝ අයට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටලුවක් වන්නේ මනසෙහි ඇති වන ව්‍යාකූලතාවයි. ධම්මචක්කපවත්තන සූත්‍රයේ ඉගැන්වෙන මධ්‍යම ප්‍රතිපදාව මගින් ඕනෑ ම කෙනෙකුට සැහැල්ලු දිවි පෙවතක් හෝ සමබර දිවි පෙවෙතක් ගතකිරීමට අවස්ථාව උදා වේ. මනස සමබර ව තබාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් මානසික රෝගවලට ගොදුරු වූ බොහෝ පිරිස් සමාජයෙහි සිටිති. විශේෂයෙන් ම වයස්ගතබාවයට පත් වූ අය එක් ප්‍රශ්නයක් ගැන දින ගණන් සති ගණන් කල්පනා කිරීම නිසා සිදුවන ආතතිමය චින්තනය සිතට මෙන් ම ගතට ද හානිදායක ය. මේ තත්ත්වයෙන් මිදීමට මධ්‍යම ප්‍රතිපදාවට අනුකූල ව ජීවිතය සකසාගැනීම සුදුසු බව ප්‍රකාශ කළ හැකි ය.

රටක් පාලනය කරන පාලකයා දැහැමින් රට පාලනය කළ යුතු බව බුදුදහමේ පෙන්වා දී ඇත. පාලකයාගේ වගකීම දස රාජධර්මයෙන් කටයුතු කිරීමයි. එමගින් ජනතාව ද දැහැමි බවට පත්වීම සිදුවන්නේ නිරායාසයෙනි. දුගීබාවය නැති කිරීමට රාජ්‍ය සුභසාධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින්

ජනතාවගේ ගැටලු මග හරවාගත හැකි ය. එමගින් සමාජය තුළ ගැටීම හා විරෝධතා අවම මට්ටමකට පරිවර්තනය වීමෙන් සමාජ ගැටලු එතරම් තර්ජනාත්මක නොවනු ඇත. බුදුදහම මෙහි ලා ලබාදෙන දායකත්වය ඉමහත් ය. ධනය නැති අයට ධනය නො ලැබෙන විට දුගීබාවය වැඩිවන බවත් දුගීබාවය තවත් අපරාධයන්ට හා දුශ්චරිතයන්ට මුල්වන බවත් එය සමාජ ප්‍රශ්න ඇතිවීමට හේතුවක් බවත් චක්කවත්ති සීහනාද සූත්‍රයේ දක්වා ඇත. එම ප්‍රශ්න ඇති නොවීම සඳහා දසරාජ ධර්මයෙන් රට පාලනය කිරීමේ දී ඇති කරනු ලබන සුභසාධනය පිටුවහලක් වනු ඇත. මේ කරුණු විශ්ලේෂණය කිරීමේ දී ශ්‍රී ලංකාවේ පවතින දුගීබාවයත්, වයස්ගතබාවයත් සමාජ ප්‍රශ්නයක් නොවන ආකාරයෙන් පවත්වාගැනීම සඳහා බුදුදහම මැනවින් උපකාරී කරගත හැකි ය.

## 06 ක්‍රියාකාරකම

01. ඔබ ජීවත්වන සමාජයේ දක්නට ලැබෙන පුද්ගල ප්‍රශ්න පහක් සහ සමාජ ප්‍රශ්න පහක් ලියන්න.

02. "අප ප්‍රදේශයේ දුගීබව නැති කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග" යන මාතෘකාව යටතේ ළමා සඟරාවකට ලිපියක් ලියන්න.

03. "වැඩිහිටියන් රැකබලා ගනිමු" මැයෙන් ශිෂ්‍ය සමිතියක කතාවක් පවත්වන්න.

04. "බෞද්ධ උපදේශ හොඳින් අනුගමනය කරන සමාජයක සමාජ ගැටලු නැත" මෙයට පක්ෂව හෝ විපක්ෂව කරුණු ඉදිරිපත් කරන්න.

05. වැඩිහිටියන්ට සැලකීමේ අගය පිළිබඳ කියැවෙන ජාතක කතාවල ලැයිස්තුවක් සකස් කරන්න.

07

# සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක්

සමාජය නිරන්තරයෙන් වෙනස්වීම් වලට බඳුන්වන දැඩි සචලතාවයකින් යුතු ව්‍යුහයක් ලෙස මේවන විට අපි හඳුනාගෙන සිටින්නෙමු. විවිධ සමාජ විද්‍යාඥයන් විවිධ දෘෂ්ඨී කෝණ ඔස්සේ සමාජය පිළිබඳ මතවාද ඉදිරිපත් කරන ලදි. මේ සියල්ලට පසුබිම් වූයේ සමාජය පිළිබඳ ඔවුන් සිදුකල අධ්‍යයනයන් ය. ස්වාභාවික විද්‍යාවන් සඳහා පර්යේෂණ ස්ථානය විද්‍යාගාරය වුවද, සමාජවිද්‍යා පර්යේෂණ වල පර්යේෂණාගාරය සමස්ථ සමාජයම වේ. නිරන්තර වෙනස්කම් වලට බඳුන්වන සමාජය අධ්‍යයනය කිරීම ස්වාභාවික විද්‍යා අධ්‍යයනයන්ට වඩා දුෂ්කර කර්තව්‍යයකි. සමාජ විද්‍යා පර්යේෂණ වලදී පාලිත තත්ත්ව යටතේ පර්යේෂණ සිදුකිරීම ඉතා ගැටලු සහගත වී ඇත. එයට හේතුව එක් සාධකයකට වඩා වැඩි සංඛ්‍යාවක බලපෑමට පර්යේෂකයා මෙන් ම  පර්යේෂණ ක්ෂේත්‍රයද නිරතුරු ව භාජනය වීමයි.

මෙම පසුබිම හමුවේ සමාජය විද්‍යාත්මක අධ්‍යයනයකට ලක්කිරීමට පෙර සමාජය තුළ වෙනස්වීම් සිදුවන ක්ෂේත්‍ර එය ආනුභාවික හේතූන් හා බලපෑම් පිළිබඳව ද මූලික අධ්‍යයනයක් සිදුවිය යුතුය. නොඑසේ නම් අධ්‍යයනයට අපේක්ෂිත කරුණු පර්යේෂණය අතරමගදී ව්‍යාකූල වීමෙන් පර්යේෂණය අත්හැර දැමීමට හෝ ප්‍රතිඵල විරහිතව අවසන් කිරීමේ අනතුරක් ඇතිවේ.

සමාජ විද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයට ප්‍රවේශ වීමට අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේ නමක් අනිවාර්යයෙන් ම තමන්ගේ අධ්‍යයන ප්‍රවේශයට පෙර එයට අයත් වන වටපිටාව පිළිබඳ මනා අවබෝධයක් ලබා තිබිය  යුතු ය. මෙම පරිච්ඡේදය තුළින් ලාංකික භික්ෂු සමාජයේ අවධානයට ලක්විය යුතු පර්යේෂණ ප්‍රවේශයන්ට ආනුභාවික වන ක්ෂේත්‍රයන් පිළිබඳව යම් හඳුන්වා දීමක් සිදුකෙරේ. එමගින් අපේක්ෂා කරනුයේ විවිධ හේතූන් නිසා අනවරත වෙනස්කම් වලට ලක්වන සමාජ සංසිද්ධි ප්‍රමාණය අධ්‍යයනයට පාදක විය යුතු ප්‍රස්තුතයන් හඳුනාගැනීමට ඉඩකඩ සැලැස්වීම ය.

## 7.1. සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධය

පුද්ගලයෙක් යනු සමාජ සත්ත්වයෙකි. පුද්ගලයා සමාජයට අයත් ය. ඔබ ද පුද්ගලයෙකි. ඒ අනුව ඔබ ගෙදර දී දෙමාපියන්ට ආදරණීය දරුවෙකි. සහෝදර සහෝදරියන්ට සහෝදරයෙකි. ස්වකීය අත්තාට, අත්තම්මාට දඟකාර මුණුබුරෙකි. නැන්දාට, මාමාට, බාප්පාට, පුංචිඅම්මාට ඥාති පුත්‍රයෙකි. යහළු යෙහෙළියන් අතරෙහි යහළුවෙකි. පාසලේ දී ගුරුවරයාට ශිෂ්‍ය යෙකි. පංතියේ සහෝදර යහළුවන්ට යහළුවෙකි. පන්සලේ දායකයෙකි. ගමේ දී ගම් වාසියෙකි. ඔබ සාමණේර නමක් නම් ලොකු හාමුදුරුවන්ට කීකරු ගෝලයෙකි. පැවිදි සහෝදර හිමිවරුන්ට පැවිදි සහෝදරයෙකි. යහළු හිමිවරුනට යහළුවෙකි. පිරිවෙනේ දී ශිෂ්‍යයෙකි. ගමේ දායකයන්ට පොඩි හිමිනමකි. ගෙදරට ගෙදර බබුලුළුවන, දෙමාපිය ඥාති පරපුරට සැනසුම ගෙන දෙන දයාබර පොඩි හාමුදුරුවන් ය. මේ අනුව ඔබ හුදකලා වී නොමැති බව වැටහෙනු ඇත. අවට සමාජය ලෙස හඳුනාගනු ලබන්නේ මෙම සබඳතා ජාලයේ සමස්තයයි.

හුදු මිනිස් එකතුවක් සමාජ විද්‍යාවට අනුව සමාජයක් නොවේ. බස්රථයක, දුම්රියක, බස් නැවතුම් පොළක මිනිස් එකතුවක් බොහෝවිට දැකිය හැකි ය. එහෙත් එවැනි තැනක් සමාජයක් නොවේ. සමාජයක් වීමට නම් මිනිසුන් එකිනෙකා අන්‍යෝන්‍ය වශයෙන් හඳුනාගත යුතු ය. සමාජ ක්‍රියා හා ප්‍රතික්‍රියා තුළින් හෙවත් අන්තර් ක්‍රියාවන් (Interaction) තුළින් අන්‍යෝන්‍ය සබඳතා ගොඩනැගේ.

"සමාජයක් යනු අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් හා බැඳී පවතින කිසියම් ඵලදායි අරමුණක් සහිත දිගුකාලීන සම්බන්ධතා ගොඩනගා ගත් නිශ්චිත සීමාවක් තුළ ක්‍රියාත්මක ඒකකය වේ."

රැල්ෆ් ලින්ටන් (Ralph Linton) නම් සමාජ විද්‍යාඥයාගේ ඉහත නිර්වචනයට අනුව එකට වැඩ කිරීම හා එකට ජීවත්වීම තුළින් අන්‍යෝන්‍ය සබඳතාව ඇතිවන බව පැහැදිලි කරයි.

යම් සමාජයක සාමාජිකයෙකු කරන ක්‍රියාවකට එම සමාජයේ ම තවත් පුද්ගලයෙකු දක්වන ප්‍රතික්‍රියාව පළමු පුද්ගලයා බොහෝ විට හඳුනාගෙන සිටී. මෙය අන්‍යෝන්‍ය හඳුනාගැනීමයි. මෙය කලක් එකට ජීවත්වීමෙන් හා එකට වැඩ කටයුතු කිරීමෙන් ඇති කරගත් අවබෝධයකි. ඔබ උපන් දා සිට ඔබේ පවුලෙන් සමාජය හඳුනාගන්නෙහි ය. යන එන, කන බොන,

අඳින පළඳින ආදී සමාජ සිරිත් සියල්ල ඉගෙන ගෙන එම සමාජයේ සාමාජිකයෙකු වන අතර තම සමාජයේ උරුම කරගත් හුරු පුරුදු නිසා ඔහු හෝ ඇය එම සමාජයට අයත් කෙනෙකු බවට පත්වනු දක්නට පුළුවන.

සමාජය හා පුද්ගලයා අතර ඇති සම්බන්ධතාව කතා කරන විට සමාජානුයෝජනය (Socialization) ද වැදගත් ය. ඇත්තෙන් ම පුද්ගලයා සමාජ ජීවිතයට හුරු කරවන්නේ සමාජනුයෝජන ක්‍රියාවලිය තුළිනි. ලොව කිසිම පුද්ගලයෙකුට තනිවම සමාජ හුරු පුරුදුවලට යොමුවීම කළ හැකි දෙයක් නොවේ. පවුල, සම වයස් කණ්ඩායම හා පාසල තුළින් පුද්ගලයා ලබාගන්නා දැනුම මගින් සමාජයට පුද්ගලයා සම්බන්ධ වේ.

සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතා විමසා බැලීමේ දී ද්විතීයික සමූහ පිළිබඳ තොරතුරු සොයාබැලීම වැදගත් වේ. ප්‍රාථමික සමූහයක් තුළ විද්‍යමාන අවිධිමත් ප්‍රාථමික ස්වභාවයට වඩා හාත්පසින් ම වෙනස් වූ තත්ත්වයක් උසුලන සංවිධිත ඒකකයකි, ද්විතීයික සමූහ (Secondary groups). පරමාර්ථ අතින් බලන විට ද මෙබඳු සමූහයක පවතින අරමුණුවල දැකිය හැකිවන්නේ පෞද්ගලික බවක් නොව පොදු බවකි. වෙනත් ආකාරයකට දැක්වුවහොත් පොදුවේ සමූහයේ වැඩි දෙනෙකුට බලපානු ලබන කණ්ඩායම් හෝ අරමුණක් වෙනුවෙන් එම සමූහය කැප වී සිටිති. අනෙක් අතට සාමාජිකයින් වෙත පවතින පෞද්ගලික අපේක්ෂාවන් ආදියත් ඕනෑ එපාකම් ආදියත් පොදුවේ පිළිගත් ක්‍රියාමාර්ග තුළින් ඉටුකරගැනීමට ප්‍රයත්න දැරීම මෙබඳු සමූහයක දක්නට ලැබෙන දෙයකි.

පොදු අරමුණු ඉටුකර ගැනීමට විධිමත් නෛතික ක්‍රියාමාර්ග පටිපාටියක් යොදාගැනීමත් ද්විතීයික සමුහයක හඳුනාගත හැකි ලක්ෂණයකි. නීති රීති විධිවිධාන මගින් එබඳු ක්‍රියාවලි හඳුනාගත හැකි ය. මෙයින් සාමාජිකයන්ට හිමි තත්ත්ව කොටස් හා කාර්ය කොටස් කවරේ ද යන්න පහදා දීමත් සිදු කෙරේ. ද්විතීයික සමූහයකට අයත් සාමාජිකයින් එම සමූහය සමග පවත්වනු ලබන සම්බන්ධතාවල නිශ්චිත අංශයක් දක්නට ලැබීම ද විශේෂ ලක්ෂණයකි. මෙවැනි සමූහයක පුද්ගලයා සමුහය සමග සම්බන්ධතාවක් පවත්වනුයේ නියමිත කාර්යයකට අදාළ ව පමණි.

ද්විතීයික සමූහය සංවිධිත ඒකකයක් බැවින් එහි සමාජිකයින් වෙත පැවරෙන තත්ත්වයන් හා කාර්ය කොටස් නෛතික විධි විධානවලට අනුකූල ව අන්‍යයන් වෙත පැවරීමට ද බලය ඇත. අවමංගල්‍යාධාර සමිතිය, පාසල් ගුරුදෙගුරු සමිතිය, වෘත්තිය සමිති සහ ද්විතීයික සමාජ තුළින් සබඳතා පැවැත්වීමෙහි ලා අනුපමේය මෙහෙවරක යෙදෙන අයුරු දැකගත හැකි ය.

## 7.2. බුදුදහමේ දැක්වෙන ගිහි පැවිදි සම්බන්ධය

බෞද්ධ සමාජය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්පිරිසෙන් සමන්විත වේ. මෙම සමාජයේ සාමාජිකත්වය ජාති, කුල, වර්ණ අනුව සකස්වුවක් නොවේ. ගිහි පැවිදි යන බෙදීම පාදක කොට ගෙන ආරම්භ වූ මේ සිව්පිරිස ම එක සේ වැදගත් විය.

බෞද්ධ සමාජයේ ප්‍රධාන ඒකකය ගිහි සමාජයයි. ඒ නිසා එය මහා සමාජය ලෙස අපි හඳුන්වමු. සියලු ම දෙනා උපදින්නේ ගිහියන් වශයෙනි. මෙම සමාජයේ ප්‍රධාන සමාජ සංස්ථාව පවුල් ඒකකයයි. න්‍යෂ්ටික පවුල ලෙස හඳුන්වන මවුපිය සහ දරුවන් අයත් වන කුඩා සමාජය එක් මූලික ඒකකයකි. බෞද්ධ ගිහි සමාජයේ ආරම්භය ඇතිවූයේ යසකුල පුත්‍රයාගේ මවුපිය දෙදෙනාගෙනි. ගිහියන් සඳහා බුදුරජාණන් වහන්සේ පංචශීලය අනුදැන වදාළහ. සංසාරගත දුකින් අත්මිදීම සඳහා ගිහි පැවිදි උභය සමාජයට පොදු මාර්ගයක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. සම්බාධ සහිත ගිහි ජීවිතයක් ගතකිරීමෙන් නිවන් පසක් කරගැනීම පහසු නොවේ. ඒ සඳහා පහසු මග පැවිදි ජීවිතයට පත්වීම ය.

ගිහි සමාජය තුළින් ම ප්‍රභවය වූ පැවිදි සමාජය බාධා රහිත එකකි. පස්වග භික්ෂූන්ගෙන් ආරම්භ වූ පැවිදි සමාජය භික්ෂු, භික්ෂුණී වශයෙන් කොටස් දෙකකි. පැවිදි සමාජයේ සිරිත් විරිත්, ගති පැවතුම් හා ශ්‍රමණ ආකල්පයන් පිළිබඳ ව විනය පිටකයේ සඳහන්ව ඇත.

බුදු සසුනේ පැවැත්ම සඳහා භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් පිරිසගේ සම්බන්ධය ඉතා වැදගත් බව පිළිගත යුත්තකි. මේ ආකාරයේ ව්‍යූහාත්මක බෙදීමක් බුදුරජාණන් වහන්සේ ද අපේක්ෂා කළ බව මහාපරිනිර්වාණ සූත්‍රයෙහි මාර දිව්‍ය පුත්‍රයාට කළ ප්‍රකාශයෙන් පැහැදිලි වේ. සියලු කෙලෙසුන් නසා බුදුවීමෙන් අනතුරු ව තමා අවබෝධ කරගත් විමුක්ති මාර්ගය දේශනා කිරීමට සුදුස්සන් සොයා යෑමේ දී බුදුන් වහන්සේ වෙත පැමිණි මාර දිව්‍ය පුත්‍ර තෙමේ "භාග්‍යවතුන් වහන්ස දැන් පිරිනිවන් පාන සේක්වා, පිරිනිවන් පෑමට දැන් කාලය පැමිණ ඇතැ යි" ප්‍රකාශ කළේ ය. මෙහි දී පිළිතුරු දෙන බුදුරාජාණන් වහන්සේ "මාරය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් පිරිස නියත ශ්‍රාවකභාවය ලබා ගැනීම, නුවණැත්තන් වීම, මනා සේ පුහුණු වී බහුශ්‍රැතභාවයට පැමිණීම,

ධර්මය හොඳින් ඉගෙන ධර්මානුකූලව හැසිරීම, ප්‍රතිපත්ති රැකීම, ධර්මය හොඳින් ඉගෙන අන්‍යයන්ට ඉගැන්වීමට හැකිවීම සහ මාගේ මේ බුද්ධ ශාසනය ලොව පුරා පැතිර යන තුරුම පිරිනිවන් නොපාන්නෙමි" යනුවෙන් ප්‍රකාශ කළහ.

මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ බුද්ධ ශාසනය තහවුරු කොට අනාගත පැවැත්ම සඳහා භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් පිරිසේ වැදගත්කමයි. එසේම බුද්ධත්වයත් පරිනිර්වාණයත් අතර බුද්ධ ශාසනය තහවුරු කොට එහි ස්ථිර පැවැත්ම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය වීමත් මින් ප්‍රකට වේ. බුදුරජාණන් වහන්සේ අවසාන කාලය වනවිට ගිහි පැවිදි යන දෙපාර්ශ්වය බෞද්ධ සමාජය වශයෙන් ස්ථිරව පිළිගෙන තිබුණු බව පැහැදිලි වේ.

කවර සමාජ සංස්ථාවක වුව ද පැවැත්ම සඳහා පිළිගත් නීති රීති පද්ධතියක් මෙන් ම ඒ අනුව ක්‍රියා කරන පිරිසක් ද අවශ්‍ය වේ. අලුතින් ආරම්භ වූ බුද්ධ ශාසනයේ චිර පැවැත්මට භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් පිරිසේ සම්බන්ධය වැදගත් විය. මෙම පිරිස අතර ඇත්තේ ස්ත්‍රී පුරුෂ වෙනසක් පමණි. එසේ නැතිනම් ගිහිපැවිදි බෙදීමයි. බුදු දහම අනුව බලන විට ගිහි පැවිදි දෙපාර්ශ්වය අතර සම්බන්ධය දේවවාදී ආගම්වල ගිහියාත් පූජකවරයාත් අතර සම්බන්ධයට සමාන නොවේ. භික්ෂූන් වහන්සේ නිවන් මගෙහි ගමන් කරමින් එම තත්ත්වය සාධනය කරගැනීම සඳහා ගිහියාට උපකාර වේ. එහෙත් දේවවාදී ආගම්වල මෙන් දෙවියාත් මිනිසාත් අතර අතරමැදියෙකු බවට භික්ෂූන් වහන්සේ පත් නොවේ. පැවිදි පක්ෂයක අයෙක් ගිහි පක්ෂයයට සම්පූර්ණයෙන් වෙනස් යැයි දැක්විය හැකි ලක්ෂණ බෞද්ධ ගිහි පැවිදි දෙපක්ෂය අතර දක්නට නැත. එකම අරමුණ ඉටු කරගැනීමට එකම මාර්ගයක ගමන්කරන දෙපිරිසක් ලෙස මේ දෙපාර්ශ්වය හැඳින්විය හැකි ය.

මුල් බුදුසමය අනුව භික්ෂූන් වහන්සේ බුදුදහමේ මූලික පරමාර්ථය වන නිවන ලබාගෙන සසර දුකින් මිදීම සඳහා උත්සහවත් වේ. මේ සඳහා සමාජ බැම්වලින් මිදී හුදෙකලාව ජීවත් විය යුතු තමාගේ ආත්ම විමුක්තිය සඳහා වෙහෙසිය යුතු කෙනෙකු ලෙස ථේරවාදී ත්‍රිපිටක ග්‍රන්ථවල විස්තර කර ඇත. පරමාදර්ශී තත්ත්වය මෙය වුවත් භික්ෂූන් වහන්සේලා ආත්ම විමුක්තිය සඳහා පමණක් නොව පරාර්ථ චර්යාව ද තම ජීවිතයේ අංගයක් කරගත යුතු බව මුල් බුදු සමයෙන් කියවේ. ප්‍රථම භික්ෂු හැට නම අමතා

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ "බොහෝ ජනයාගේ හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න" යනුවෙනි. මේ අනුව බුදුරජාණන් වහන්සේ ද භික්ෂු සංඝයා සමග ගමින් ගමට වැඩම කරමින් යහපත් වූ ධර්මය දේශනා කළ සේක.

ගිහි පැවිදි සමාජ සම්බන්ධතාවයේ ආරම්භය බුදුරජාණන් වහන්සේ ජීවමාන සමය දක්වා ම ඈතට දිව යයි. ආමිසයෙන් සලකන ගිහි ජනතාවට අර්ථයෙන් ධර්මයෙන් පැවිදි උතුමන් අනුශාසනා කළ යුතු බව සඳහන් වේ. ඒ අනුව දහම් දෙසීමේ දී මෙලොව හා පරලොව දියුණුවට හේතුවන ධර්ම දේශනා කළ බව පෙනේ. එදා ඉන්දියාවේ කුලය, ගෝත්‍රය, වර්ණය අනුව බෙදී ගිය සමාජයක් පැවතිණි. මෙම සමාජයට අවශ්‍ය වූයේ තම කණ්ඩායම් උසස් බව සමාජය හමුවේ ප්‍රකාශ කිරීමයි. එහෙත් එසේ වූ සමාජය යථාවාදී සමාජයක් නොවන බවත් අර්ථවත් වූ සමාජයක් වන්නේ සිව්වනක් පිරිසගෙන් සමන්විත වූ සමාජයක් බවත් බුදුරජාණන් වහන්සේගේ දේශනාව විය. පුද්ගලයා ක්‍රියාවෙන් වසලයකු හෝ බ්‍රාහ්මණයකු වන ආකාරය වසල සූත්‍රයේ දී දේශනා කර තිබේ.

සමාජයේ දියුණුව සඳහා අවශ්‍ය නොයෙක් අදහස් සහ පවුලේ හා සමාජයේ ඔවුනොවුන් කෙරෙහි පැවැත්විය යුතු යුතුකම් ද විවිධ සූත්‍රවල සඳහන් වේ. රටක් පාලනය කිරීමේ දී දසරාජධර්මයට අනුව පාලනය කළ යුතු බව විස්තර කර ඇත. සිඟාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරයෙන් සමාජ සම්බන්ධතා වර්ධනයට සිදු වන මෙහෙය පැහැදිලි කොට ඇත. මෙලෙස බලන විට රට වැසියන්ගේ නිරෝගීකම, පිරිසිදුකම, ධනය ඉපයීම, අන්‍යෝන්‍ය සම්බන්ධතාව, සමාජයේ යහ පැවැත්ම, ධාර්මික ව රට පාලනය කිරීම ආදී කරුණු පිළිබඳ ව ඉතා වැදගත් අනුශාසනා පවත්වමින් බුදුරජාණන් වහන්සේ ගමින් ගමට වැඩම කළ බව පෙනීයයි. යථෝක්ත කරුණු දෙස බලන විට ගිහිපැවිදි සම්බන්ධතාව ඇතිවන ආකාරය වටහා ගත හැකි ය. පරලොව සඳහා පමණක් නොව මෙලොව සතුටින් ජීවත්වීමට අවශ්‍ය උපදෙස් ද බුදුරජාණන් වහන්සේ දේශනා කළ අතර භික්ෂූන් වහන්සේලා ද උන්වහන්සේ අනුගමනය කරමින් පරාර්ථ චර්යාවේ හැසිරෙන බව පෙනී යයි.

## 7.3 බටහිර ජාතීන්ගේ ආගමනයෙන් පැවිදි ගිහි සබඳතාවයට සිදු වූ බලපෑම

ශ්‍රී ලංකා සමාජය බටහිර ජාතීන්ගේ බලපෑමට ලක්වීම ආරම්භ වූයේ 16වන ශත වර්ෂයේ මුල දී පෘතුගීසින්ගේ පැමිණීමත් සමග ය. ක්‍රි.ව. 1505 දී **ලොරෙන්සෝ ද අල්මේදා** ඇතුළු පිරිස අහම්බෙන් ලංකාවට ගොඩබැසීමෙන් ආරම්භ වූ පෘතුගීසීන්ගේ බලපෑම්, ක්‍රි.ව. 1658 දක්වා කාලය තුළ ලංකාවේ මුහුදු බඩ පළාත්වල දක්නට ලැබුණි.

පෘතුගීසින් කුළු බඩු සෙවීමට හා කිතු දහම පැතිරවීමට පෙරදිගට පැමිණි බව සඳහන් වේ. මේ වන විට ලංකාවේ විදේශීය වෙළඳාම දියුණු මට්ටමක පැවතුණි. ප්‍රධාන වශයෙන් කුරුඳු, පුවක්, ගම්මිරිස්, සාදික්කා, අලි-ඇතුන් හා මැණික් ද වෙළෙඳාමට ඇතුළත් වූ භාණ්ඩ විය. එකල වෙළෙඳ කටයුතු කරගෙන යන ලද්දේ මුස්ලිම් වෙළෙඳුන් විසිනි. කෝට්ටේ රජු සමග සමීප සබඳතා ඇති කරගත් පෘතුගීසිහු වෙළෙඳ කටයුතු තමන් යටතට පවරා ගත්හ. එපමණක් නොව කෝට්ටේ රාජ්‍යය තුළ කතෝලික ආගම ව්‍යාප්ත කිරීමේ කාර්යය ද ආරම්භ කළහ.

බෞද්ධයන් හා හින්දු භක්තිකයන් අන්ධ ලබ්ධිකයන් සේ සලකා ස්වකීය ආගමට හරවාගැනීමට ද ඔවුහු ක්‍රියා කළහ. මේ සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති කිහිපයක් විය. ආගම ප්‍රචාරය කිරීම සඳහා ප්‍රැන්සිස්කන් හා ඩොමිනිකන් නම් ආගමික නිකායවල පූජකවරු මෙහි පැමිණියහ.

රට වැසියන්ගේ භාෂාව ඉගෙන ගත් ඔවුහු ගමින් ගමට සංචාරය කරමින් ආර්ථික අතින් පහළ මට්ටමක සිටි මිනිසුන්ට ආධාර උපකාර කරමින් සිය ආගම දේශනා කළහ. විශේෂයෙන් මුහුදුකරයේ වෙසෙන්නන් කතෝලික ආගමට හරවා ගැනීමට සමත් වූහ.

කතෝලික ආගම පහතරට ප්‍රදේශයේ ව්‍යාප්ත වීමත් සමගම සමාජයේ බොහෝ අංශවල වෙනස්කම් රැසක් සිදු විය. මුහුදුබඩ ප්‍රදේශයේ කතෝලික ආගම පැතිර ගියත් කන්ද උඩරට ප්‍රදේශයේ එම කාර්යය පහසුවෙන් කිරීමට හැකිවූයේ නැත. උඩරැටියන් තම සංස්කෘතික අනන්‍යතාව රැකගෙන සිටි අතර පහතරට සිංහලයෝ බටහිර සංස්කෘතියට නැඹුරු වූහ. පසු කාලයක සිංහල ජනතාව අතර උඩරට සිංහල සහ පහතරට සිංහල යැයි භේදයක් ඇතිවීමට මෙය ද එක් සාධකයක් විය.

පෘතුගීසීන් පැමිණෙන විට ලංකාවේ අධ්‍යාපන කටයුතු බුදු දහම හා පන්සල ඇසුරු කොටගෙන සංවිධානය වී තිබුණි. මේ හේතුවෙන් මනා ගිහි පැවිදි සබඳතාවක් සමාජය තුළ ස්ථාපනය විය. දෙපක්ෂය ම ඔවුනොවුන් ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් මනා ව අවබෝධ කරගෙන ක්‍රියා කරන්නට හේතු වූයේ ද විහාරස්ථානය මුල් කරගත් අධ්‍යාපනික රටාව නිසා ය. නමුත් කතෝලික ආගම පැතිරී යාමත් සමග ම පල්ලිය මූලික කරගත් අධ්‍යාපන රටාවක් මුහුදුබඩ ප්‍රදේශවල දක්නට ලැබුණි. මෙය එතෙක් පැවති ගිහි පැවිදි සබඳතාව බිඳ වැටීමට ප්‍රධාන හේතු සාධකයක් විය. මීට අමතරව පෘතුගීසි බලපෑම නිසා ලක්දිව වැසියන්ගේ විශේෂයෙන් ස්ත්‍රීන්ගේ ඇඳුම්වල වෙනසක් ඇතිවිය. එසේ ම රටේ භාෂාව හා සාහිත්‍යය කෙරෙහි ද වෙනස්කම් කිහිපයක් මෙ කල ඇති විය.

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ලන්දේසි බලපෑම ක්‍රි.ව.1658 - 1796 දක්වා කාල සීමාව තුළ දක්නට ලැබුණි. දෙවන රාජසිංහ රජු ලන්දේසීන් සමග ඇති කරගත් ගිවිසුමක ආධාරයෙන් පෘතුගීසි බලය මුහුදුබඩ ප්‍රදේශවලින් තුරන් කිරීම නිසා පසුකාලයේ දී ලන්දේසීන්ගෙන් රජතුමාට හිරිහැර සිදු වුණි. මේ නිසා ම "ඉඟුරු දී මිරිස් ගත්තා වැනි ය" යන කියමන සිංහල ජනප්‍රවාදයට එක් විය. ලන්දේසිහු පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම (VOC) මගින් ලංකාවේ පාලනය සිදු කළහ. එහි ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ජාවා දූපතේ බතාවියයි. ශ්‍රී ලංකාවේ පාලනය ද එහි සිට කරන ලදී.

ලන්දේසි පාලන සමයේ අධ්‍යාපනය අනිවාර්ය විය. ලන්දේසීහු අධ්‍යාපන ක්‍රමය තුළින් ආගම ප්‍රචාරය කිරීම අරමුණු කරගත්හ. ඔවුන්ගෙන් දේශීයත්වයට නොගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කරන්නට විය. පන්සල හා ගිහි ජනතාව අතර පැවති සබඳතා තවදුරටත් දුරස් ව යාමට මෙම ලන්දේසි අධ්‍යාපන රටාව හේතු විය.

ක්‍රි.ව. 1796 දී බ්‍රිතාන්‍ය පෙරදිග වෙළෙඳ සමාගම විසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගන්නා ලදි. ඉන්පසු 1815 දී ඇති කරගත් ගිවිසුමක් මගින් මුළු දිවයින ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්විය. ඉංග්‍රීසි අධ්‍යාපනය කේන්ද්‍රිය කරගත් අධ්‍යාපන රටාවක් දක්නට ලැබුණු අතර මේ නිසා සාම්ප්‍රදායික ව පැවති අධ්‍යාපන ක්‍රමයේ වෙනස්කම් රැසක් ද ඇති විය.

වර්ෂ එකසිය තිස්තුනකට අධික කාලයක් ඉංග්‍රීසිහු විවිධ උපාය සහ උපක්‍රම භාවිත කරමින් ආණ්ඩුකාරවරුන් සහ නියෝජිතවරුන් මාර්ගයෙන් මේ රටේ අධ්‍යාපන රටාව ඉංග්‍රීසීන්ට ගැළපෙන ආකාරයට සකස් කිරීමට

පියවර ගත්හ. එහි දිගුකාලීන ප්‍රතිඵලය වූයේ පන්සල මුල් කරගත් අධ්‍යාපන ක්‍රම බැහැර වී පල්ලිය පදනම් කරගත් ඉංග්‍රීසි අධ්‍යාපනයට ලාංකිකයන් නැඹුරු වීමයි.

සමස්තයක් වශයෙන් ගත් කල ගිහි පැවිදි සබඳතාව බිඳ වැටීමට මූලාරම්භය වූයේ පෘතුගීසීන්ගේ ආගමනය බව වැඩි දුරටත් සඳහන් කළ හැකි ය. පෘතුගීසීහු මෙරට රෝමානු කාතෝලික ආගම පැතිරවීමේ ක්‍රියාවලිය මනා ව සිදු කළහ. කෝට්ටේ ධර්මපාල රජු බෞතීස්ම කිරීමෙන් පසු කතෝලික පූජකවරු ක්‍රිස්තියානි දහම රටපුරා ව්‍යාප්ත කරලීමට පටන් ගත්හ. ඇතැම් විට ඔවුහු මේ සඳහා කඩුවේ හා තුවක්කුවේ ආධාරය සෙවූහ. එසේම ඔවුන්ගේ පාලනය යටතේ පැවති පළාත්වල සියලු ම බෞද්ධ විහාරාරාම වනසා දමන ලද්දේ ය. ඉසුරින් අලකපුරය පවා දිනූ කෝට්ටේ රාජධානියෙහි සහ සීතාවක රාජධානියෙහි නටඹුන් වත් අද දක්නට නොමැත්තේ ඔවුන් විසින් සිදු කළ සාහසික ක්‍රියා නිසා ය. මේ නිසා මුහුදුබඩ පලාත්වල සිටි භික්ෂූන් ද ජන ප්‍රධානියෝ ද රුහුණට හා කන්ද උඩරටට පලා ගියහ. පන්සල ආශ්‍රිතව තිබූ අධ්‍යාපන ක්‍රමයේ බිඳවැටීම ද මේ සමග සිදුවිය.

එය උගත් යැයි සම්මත ව තිබූ ශ්‍රී ලාංකික සමාජය නූගත් තත්ත්වයකට ඇද දැමීමට ද ඉවහල් විය. තව ද ධනය පාදක කරගෙන ඉහළ පහළ තත්ත්වයක් හෙවත් ධූරාවලියක් නිර්මාණය වීම ද මේ සමග සිදුවිය. එසේ ම ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් බොහෝ අය කතෝලික ආගම වැළඳ ගැනීම නිසා මෙරට පන්සල ආශ්‍රිතව පැවති අධ්‍යාපන ක්‍රමය බටහිරකරණයට නතු වීම සිදුවිය.

මේ නිසා පන්සල හා ගම අතර තිබූ සබඳතාවය ගිලිහී ගොස් එය නායක්කාර වංශයට සම්බන්ධ වීම දක්නට ලැබේ. භික්ෂූන් වනසමින්, බණ පොත් ගිනිලමින් පළමුවන රාජසිංහ රජු ශිව සමය වැළඳගෙන බෞද්ධ සංහාරය ඇරඹූවිට භික්ෂූන් වහන්සේලා උඩරට ප්‍රදේශ කරා ගියහ. රාජසිංහ රජතුමාට එරෙහිව කටයුතු කළ කොණප්පු බණ්ඩාර පැන ගිය කළ භික්ෂූන් ඔහු සඟවාගෙන ඇතැයි සිතා තදින් උරණ වී ඔහු ඉල්ලා තර්ජනය කළේ ය. හේවාහැට වැසියෝ කොණප්පු බණ්ඩාර වැනි රෝගී මිනිසකු රාජසිංහයනට බාර දී කොණප්පුට කොළඹට පැන යාමට මං සැලසූහ. මෙයින් අධිකතර කෝපයට පත් රජතුමා කොණප්පු බණ්ඩාරට අනුශාසනා කළ භික්ෂූන් හැට එක් නමක් මරා දමා විහාර වැනසූ බව "මන්දාරම්පුර පුවතෙහි" විස්තර වේ.

පිරිහුණු යුගයේ භික්ෂුව නියම ශාසනික ප්‍රතිපත්ති නොදත්තේ ය.

ඒ යුගයේ ලංකාවේ කිසිම කලෙක නොවූ විරූ භික්ෂු පිරිසක් ඇති වූහ. **රොබට් නොක්ස්** සඳහන් කරන පරිදි මෙකල සිටි භික්ෂු පිරිස දෙ කොට සකි. ඉන් පළමුවැනි කොටස තෙරුන් වහන්සේලා ය. දෙවන කොටස ගණින්නැහැලා ය. මහනුවර අඳුරු යුගයේ තෙරුන් වහන්සේලා සිටියේ ඉතා ටික දෙනෙකි. පසුකාලීනව මෙම සම්ප්‍රදාය දෙකම අභාවයට පත් වූ බව පෙනේ.

මහනුවර අඳුරු යුගයෙහි තෙරවරුන්ගෙන් අනන්‍ය වූ මහණ පිරිස ගණින්නැහැලා වශයෙන් හැඳින්වූහ. "ගණයි" වශයෙන් **රොබට් නොක්ස්** විසින් සඳහන් කරනු ලබන මොවුහු "ගණින්" 'ගණින්නාන්සේ' ආදී නම් වලින් ප්‍රසිද්ධ වූහ. මේ ගණින්නැහැලා සිවුරක් පොරවාගෙන එයට උඩින් බඳපටියක් බැඳ සිටීම සාමාන්‍ය සිරිත විය. සමහරු යටින් කහවතක් හැඳ එයට උඩින් රෙද්දක් හැඳ සිටියහ. පළමු වැනි රාජසිංහ රජු සමයෙහි ඇති වූ බිය නිසා ඇරඹුණු මේ සිරිත කලක් යන තුරු අත්හළ බවක් නොපෙනේ. භික්ෂුවට අදාළ නොවන චර්යා රටාවන්හි මොවුන්ට නිරතවන්නට සිදුවිය. නමුත් ශාසනය රැකගන්නට වෙනත් විකල්පයක් නොවූයෙන් එබඳු ක්‍රියාමාර්ග අනුගමනය කරමින් හෝ භික්ෂු ශාසනය රැකගන්නට ඔවුන් කළ සේවය ඉතා උසස් කොට සැලකිය හැකි ය. කෙසේ වුව ද සංඝයා වහන්සේලා සතු ව තිබූ ශාස්ත්‍රීය ලිපි ලේඛන ගණින්නාන්සේලා මගින් ගිහියන් අතට පත්වීමත් මේ කාල පරිච්ඡේදයේ දී සිදුවිය. ඇතැම් අය මේ නිසා විවිධ වෘත්තීන් සොයාගෙන සිවුරු හැරයාමට ද පුරුදු වූහ. මෙලෙස ගිහි පැවිදි සබඳතාව ගිලිහී යාමට බටහිර ජාතීන්ගේ ආගමනය ඉවහල් වූ බව කීම යුක්ති යුක්ත ය.

## 7.4 පිරිවෙන, පන්සල අවට සමාජයේ යහපත උදෙසා භික්ෂුවගේ කාර්යභාරය

බුදු දහම ලංකාවට හඳුන්වා දුන් අවස්ථාවේ පටන් විහාරස්ථාන හා ජනතාව අතර කිට්ටු සබඳතාවක් පැවතුණි. විහාරස්ථානය යනු හුදෙක් ආගමික කටයුතුවලට පමණක් සීමා වූ ස්ථානයක් නොවේ. එය ජනතාව එක් රැස්වන, සාකච්ඡා කරන සන්නිවේදන මධ්‍යස්ථානයක් ද විය. පාලක පක්ෂයේ පමණක් නොව සාමාන්‍ය ජනතාවගේ දරුවන් ද අධ්‍යාපනය ලැබුවේ විහාරස්ථානයෙනි. එනිසා එය අධ්‍යාපන ආයතනයක් වශයෙන් ද ක්‍රියා කළේ ය. ජනතාව හා පාලකයන් අතර ගැටුම් ඇති වූ අවස්ථාවන් හි භික්ෂූන් වහන්සේලා මැදිහත් වී ඒවා සාමයෙන් විසඳූහ.

ඉතිහාසයේ සඳහන් තොරතුරු මෙසේ වුවත් වත්මන් සමාජය බෙහෙවින් වෙනස් වී ඇත. ඒ නිසා අතීතයේ ක්‍රියා කළ පරිද්දෙන් වත්මන් සමාජයේ භික්ෂූන්ට ක්‍රියා කළ නොහැකි බවට මතයක් ද ඇත.

පොදු යහපතට කටයුතු කිරීමට අපේක්ෂා කරන භික්ෂුවක් ප්‍රථමයෙන් සමාජයේ ප්‍රගමනයට බාධක වන ගැටලු පිළිබඳ ව තියුණු දැනුමක් ලබාගත යුතු ය. ජනතාවගෙන් පෝෂණය වෙමින් ජනතාව අතර ජීවත්වන භික්ෂුවට ඔවුන් මුහුණපාන ගැටලු සහගත තත්ත්වයන් මොනවා දැයි හොඳින් අවබෝධ කරගත හැකි වේ. එහිදී ද බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ක්‍රම අනුගමනය කළ යුතු ය.

මේ අනුව අවට සමාජයේ පවතින ගැටලු සහගත තත්ත්වයන් නැත හොත් ජනතාවට හානි කර තත්ත්වයන් සමාජ විද්‍යාවේ විධික්‍රමයන්ට අදාළ ව ප්‍රශ්න මාලා, නිරීක්ෂණ, සහභාගීත්ව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා ආදී ක්‍රමවේද අනුගමනය කරමින් අධ්‍යයනය කළ යුතු ය. ඇතැම් විට ගැටලුවක් මතු පිටින් පෙනෙන තත්ත්වයට වඩා හාත්පසින් වෙනස් කරුණු මත පදනම් ව තිබිය හැකි ය. නිදසුනක් ලෙස දුප්පත්කම යන්න සලකා බලමු. දුප්පත්කම අප සමාජයේ පැතිර පවත්නා පොදු ප්‍රශ්නයකි. එයට හේතු රාශියක් තිබිය හැකිය. ධනය පරිහරණය හා කළමනාකරණය පිළිබඳ නූගත්කම එයට හේතුවිය හැකි ය. මෙම තත්ත්වයන් පෞද්ගලික හැකියාවන් හා කැපවීම් තුළින් වළක්වාගත හැකි වේ. එහෙත් එසේ වළක්වාගත නොහැකි තත්ත්වයන් ද වේ. ඇතැම් කරුණු වැළැක්විය හැක්කේ සංවිධානය වීමෙනි. යම් සමාජයක ධනය පුද්ගලයන් අතලොස්සක් අතර ඒකරාශී වීම වේගයෙන් සිදුවේ නම් එම සමාජයේ දිළිඳු භාවයට ද එය හේතුවක් වේ. එවැනි තත්ත්වයකට පිළියම් යෙදීමට සංවිධානයක් පැවතීම වඩා යෝග්‍ය වේ. සෑම විහාරස්ථානයක ම දායක සභාවක් ඇත. කරුණු හොඳ හැටි අධ්‍යයනය කිරීමෙන් පසු ගැටලුවක යථා ස්වභාවය දායක සභාව රැස්වන අවස්ථාවක පැහැදිලි කර විසඳිය හැකි ය.

වර්තමාන සමාජයේ බරපතල සමාජ ප්‍රශ්න උද්ගත ව ඇත. ඒවා කොතෙක් දුරට පිරිවෙන/පන්සල අවට සමාජයේ ජීවත්වන පරිසරය තුළ බලපවත්වන්නේ ද යන්න භික්ෂුවක විසින් වටහාගත යුතු ය. අපරාධ, හොරමැර කම්, හා මත් ද්‍රව්‍ය භාවිතය ඉන් කිහිපයකි. මෙම අයහපත් වාතාවරණයෙන් ජනතාව ගලවා ගැනීමට නම් ඒවා පැතිර යාමට මුල්වන හේතු හා පැතිර යන්නේ කුමන ජන කොටස් අතරේ ද යන්න වටහාගත යුතු වේ. ඒ සඳහා මුලින් දක්වන ලද ක්‍රමවේදය යොදා ගත යුතු වේ.

භික්ෂුවකට තමා ඇසුරු කරන පිරිස සමග සාකච්ඡා කළ හැකි ය. විවිධ අවස්ථාවන්හි ඔවුන්ගේ හැසිරීම නිරීක්ෂණය කළ හැකි ය. තව ද අසල්වාසීන්ගෙන් කරුණු විමසා බැලීමට පුළුවන. එමගින් මත් වතුර පානයට හෝ වෙනත් අපරාධවලට සම්බන්ධවන්නේ කවුරුන් ද යන්න දැනගත හැකි වේ. මෙරට අමද්‍යප ව්‍යාපාරයට නායකත්වය දුන්නේ භික්ෂූන් වහන්සේලා ය. එමෙන් ම ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ දී ද උන්වහන්සේලා කැපී පෙනෙන මෙහෙයක් ඉටුකර ඇත. ග්‍රාම සංවර්ධන සමිති මගින් ග්‍රාමීය ජනතාවගේ ගැටලු රැසකට පිළියම් යෙදීමට පුළුවන. ග්‍රාමීය මාර්ග ජල හා සනීපාරක්ෂක පහසුකම් පමණක් නොව හොඳින් සංවිධානය වූ විට ඊට දුප්පත්කම පවා අභිබවා යාමට හැකියාව ඇත. ග්‍රාමීය නිෂ්පාදන අලෙවි කිරීම සංවිධානත්මක ව සිදුකිරීම ඊට පිළිතුර වේ. මෙවැනි ක්‍රියාවලියක දී රාජ්‍ය හා පෞද්ගලික ආයතන, ගම සමග සම්බන්ධීකරණය කිරීම භික්ෂූන් වහන්සේට කළ හැකි ය. තව ද ජනතාව අතර කෘෂිකාර්මික, වෙනත් කාර්මික නිෂ්පාදන හා සෞඛ්‍යය ආදියට සම්බන්ධ දැනුම අදාළ බාහිර ආයතන සමග සම්බන්ධ වීමෙන් ගමට හඳුන්වාදීමේ වැඩපිළිවෙළ මෙහෙයවීමට භික්ෂුවකට හැකියාව ඇත.

මෙසේ විශේෂයෙන් පිරිවෙන/පන්සල අවට සමාජයේ ජනතාවගේ ගැටලු සඳහා විසඳුම් සෙවිය යුත්තේ ඔවුන් පිළිබඳ කරුණාවෙන් හා මෛත්‍රියෙන් මිස අනෙකුත් ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් නොවේ. ජනතාවට තම ගැටලු විසඳාගැනීමට සුදුසු ඉඩකඩ සැලසීම හා මග පෙන්වීම භික්ෂුවකගෙන් ඉටුවිය යුතු සේවාවකි.

මෙවැනි වටපිටාවක් යටතේ කරුණු හැදෑරීමේ දී පෙනීයන්නේ සමාජය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයට උපනිශ්‍රය විය යුතු කරුණු එමට ඇති බවයි. ඕනෑම සමාජ වෙනස්වීමක් පසුබිමේ පුද්ගලයා හා සමාජය අතර පවතින අන්තර්ක්‍රියා සමුදය නිරන්තර ව සමාජ විද්‍යා අධ්‍යයනයට නිමිති සපයන බව මේ අනුව පැහැදිලි කරුණකි.

## 07 ක්‍රියාකාරකම

01. ඔබ/ඔබ වහන්සේ කවුද? විවිධ පුද්ගලයන් හමුවේ දී ඔබ හඳුන්වා දෙන ආකාරය ලියා දක්වන්න.

02. රැල්ෆ් ලින්ටන් නම් සමාජ විද්‍යාඥයා විසින් සමාජය පිළිබඳ ඉදිරිපත් කළ නිර්වචනය කුමක් ද?

03. I. පුද්ගලයෙකු සමාජානුයෝජනය වීමේ දී වඩා වැදගත් කාර්යයක් සිදුකරන්නේ ප්‍රාථමික සමූහ මගිනි.

II පුද්ගලයෙකු සමාජානුයෝජනය වීමේ දී වඩා වැදගත් කාර්යයක් සිදුකරන්නේ ද්විතීයික සමූහ මගිනි.

ඉහත මාතෘකා දෙකෙන් ඔබ වඩාත් කැමති මාතෘකාවකට පක්ෂ ව මූලාශ්‍ර පොතපත භාවිත කර පිරිවෙනේ බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරන්න.

04. දම් දෙසුමට පෙර තම ශ්‍රාවක වර්ගයා පරීක්ෂණයට ලක්කිරීමට බුදුරජාණන් වහන්සේ භාවිත කළ ක්‍රමවේද ලැයිස්තු ගත කරන්න.

05. කෙටි පිළිතුරු සපයන්න.

I. මෙරටට පැමිණි බටහිර ජාතීන් කවුරුන් ද?

II. බටහිර ජාතීන් පෙරදිගට පැමිණීමේ දී පැවති අරමුණු කුමක් ද?

III. මුහුදුබඩ ප්‍රදේශ පමණක් යටත් කරගෙන සිටි බටහිර ජාතිය නම් කරන්න

IV. මුළු රටම යටත් කරගෙන සිටි බටහිර ජාතිය නම් කරන්න

06. ඔබේ පිරිවෙනේ සහෝදර ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ශිෂ්‍යයින්ගේ පෞද්ගලික තොරතුරු පිළිබඳ සමීක්ෂණයක් කරන්න. (පහත සඳහන් ප්‍රශ්නාවලිය ඒ සඳහා උපයෝගී කර ගන්න)

I ඔබේ නම : ..................................................

II ඔබේ ලිපිනය : ..................................................

III ඔබේ ගම පිහිටි පළාත : ........................................
දිස්ත්‍රික්කය : ..............................................................
ප්‍රා.ලේ. කොට්ඨාසය: ..............................................
ග්‍රා.සේ. කොට්ඨාශය : ..............................................

IV මවගේ නම : ......................................................
පියාගේ නම : ......................................................

V සහෝදරයන් ගණන : ............................................
සහෝදරියන් ගණන : ............................................

VI ඔබ පවුලේ කී වැනියා ද : .....................................

VII ඔබගේ වයස : ......................................................

ඔබ පිරිවෙනට පැමිණෙන විට වයස : ...........................

- ඔබට හැඟෙන පරිදි භික්ෂූන් වහන්සේගේ ප්‍රධාන වගකීම් මොනවාද?
- භික්ෂූන් වහන්සේ නමක් ලෙසින් ඔබ වැඩිහිටියන් උදෙසා දෙන අනුශාසනා මොනවා ද?
- මෙම සමීක්ෂණය තුළින් ඔබ ලබාගත් නිගමනය ඔබේ විෂය භාර ගුරුවරයා සමඟ සාකච්ඡා කරන්න. පසුව ඔබේ පිරිවෙනේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ශිෂ්‍යයින්ගේ පවුල්වල සමාජ පසුබිම පිළිබඳ ඔබ බැසගත් නිගමනය කුමක් දැ'යි ප්‍රකාශ කරන්න.